
පූජ්‍ය බටුවන්ගල රාහුල හිමි
2003
රාජ්‍ය සාහිත්‍ය
සම්මානය
උපන්
ළපය

sinhalaebooks.com

# උපන් ලපය

(කෙටිකතා සංග්‍රහය)

sinhalaebooks.com

## කතුවර හිමියන්ගේ වෙනත් කෘති

### කෙටිකතා
- රතු උකුස්සෝ - 2007

### නවකතා
- ප්‍රභානි - 2006 රාජ්‍ය සාහිත්‍ය සම්මාන
- හරස් පාර
- පන්සලේ කතාවක් - **2007**
- බොර තෙල් - 2008 (2009 විද්‍යෝදය ජාතික සාහිත්‍ය සම්මානය, ගොඩගේ සාහිත්‍ය සම්මානය, ස්වර්ණ පුස්තක නිර්දේශිත)
- රන්පාට චිත්‍රයක් අතින් ගත් මහල්ලා -2010 (2011 ස්වර්ණ පුස්තක සම්මාන උළෙලේ දෙවන වටයට නිර්දේශිත)
- නයි ගලෙන් උපන් පුත්‍රයෝ 2011 (2012 රාජ්‍ය සම්මාන)
- රන් කරඬුව - 2014

### කවි
- නෙලුම් විල
- අඩසිය කවි ගත - 2008

### වෙනත්
- ගෙදරට බණ - 2006
- අපල සඳහා බෝධි පූජා
- පොහොය දොළහ - 2013
- තුන් සූත්‍රය සහිත සෙත් පිරිත් - 2014
- සරල අරුත් සහිත සිරිත් මල්දම - 2014

sinhalaebooks.com

# උපන් ලපය

(කෙටිකතා සංග්‍රහය)

බටුවන්ගල රාහුල හිමි

සී/ස සදීපා ප්‍රකාශකයෝ
SADEEPA PUBLISHERS (PVT) LTD

sinhalaebooks.com

උපන් ලපය,
(කෙටිකතා සංග්‍රහය)
© පූජ්‍ය බටුවන්ගල රාහුල හිමි
ප්‍රථම මුද්‍රණය: 2002
දෙවන මුද්‍රණය: 2015

ISBN 978-955-661-728-3

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය අනුමැතිය ලද-
ප්‍රකාශනගත සූචිකරණ දත්ත

රාහුල හිමි, බටුවන්ගල
උපන් ලපය / බටුවන්ගල රාහුල හිමි .-
කොළඹ : සදීපා ප්‍රකාශකයෝ, 2015
පි. 128 ; සෙමී. 19.05

ISBN 978-955-661-728-3

i. 891.483 ඩිවි 23 ii. ග්‍රන්ථ නාමය
1. කෙටිකතා, සිංහල

**UPAN LAPAYA**
National Literary Award Winning Collection of Short-Stories
Based on Sri Lankan Buddhist Culture.

*By*
Rev. Batuwangala Rahula Thero

*Printed by*
**SADEEPA PRINTERS**
233/5, Rendapola Road,
Koswatta, Battaramulla, Sri Lanka.

*Published by*
**SADEEPA PUBLISHERS (PVT) LTD.**
1060, Maradana Road, Colombo 08, Sri Lanka.
Tel: 094-11-2686114, 2694289, 2678043
Fax: 094-11-2678044
E-mail: info@sadeepa.com

sinhalaebooks.com

## පළමු මුද්‍රණයට පෙරවදන

'උපන් ලපය' මගේ කුලුඳුල් කෙටිකතා සංග්‍රහයයි. මෙවැන්නක් ඔබ අතට පත් කිරීමට ලැබීම මගේ නිර්මාණ දිවියේ ලද වාසනාවක් සේ සලකමි.

කුඩා කල පටන් කෙටිකතා කරණයට මා තුළ වූ බැඳීම නිසාම මෙවැනි උත්සාහයක නිරත වීමි. මෙහි ඇති කතා සියල්ල කෙරෙහිම ඔබගේ අවධානය යොමුවිය යුතුය. ගිහි පැවිදි යන උභය පාර්ශ්වීය ජීවිත කෙරෙහි උපේක්ෂා සහගත සියුම් දෘෂ්ටියකින් බැලීමට මට අවශ්‍ය විය. කෙටිකතාව නමැති කලා මාධ්‍ය හරහා සමස්ත ජීවිත විවරණයක් නොකෙරෙතත් එයින් අංශු මාත්‍රයක් වෙත හෝ අවධානය යොමු කිරීමට මෙයින් උත්සාහ කළෙමි.

මගේ උත්සාහයේ සාර්ථක බව හෝ අසාර්ථක බව තීරණය කිරීමේ හැකියාව ඇත්තේ පාඨක ඔබටයි. කෙසේ වෙතත් මගේ කුලුඳුල් ප්‍රයත්නය වූ මෙම කෙටිකතා සංග්‍රහය ඔබ අතට පත් කිරීමට මට අවස්ථාව ලැබුණේ ඇම්.ඩී. ගුණසේන සහ සමාගම දැක්වූ කාරුණික අනුග්‍රහය නිසාය. එබැවින් පළමුව කෘතවේදීව ඇම්.ඩී. ගුණසේන සහ සමාගම සිහිපත් කරමි. එසේම මගේ ජීවිතයේ දෙවැනි පියා ලෙස මට ගුරුහරුකම් දෙන අප ගුරු දේවෝත්තම ශාස්ත්‍රපති ඕවිටිගල සුමේධ හිමිපාණන්ටත්, මෙහි සෝදුපත් බලා දුන් ශාස්ත්‍රපති පුලියද්දේ සීවලි හිමිටත්, මෙම කෙටිකතා සංග්‍රහය ඔබ අතට පත් කිරීමට මා පෙලඹ වූ රාජකීය පණ්ඩිත කඹුරාවල සිරි රේවත හිමියන්ටත්, රාජකීය පණ්ඩිත කිතුල්ගොඩ සීවලි හිමියන්ටත්, අත්පිටපත පැහැදිලිව ලියාදුන් ලංකා චන්දිමා සඳමාලි සහ ප්‍රේමා සුජීවනී යන සොයුරියන්ටත්, එය යතුරු ලියනය කර දුන් කුසුම් විතාන මහත්මියටත් මගේ ස්තුතිය මෙයින් පිරිනැමේ.

බටුවන්ගල රාහුල හිමි

sinhalaebooks.com

## දෙවන මුද්‍රණයට පෙරවදන

'උපන් ලපය' කෙටිකතා සංග්‍රහය මාගේ පළමු කෙටි කතා සංග්‍රහයයි. මෙයට රාජ්‍ය සම්මාන හිමි වීම එම මොහොතේ හැටියට මාගේ නිර්මාණ ජීවිතයට ධෛර්යයක් වූ බව මම විශ්වාස කරමි.

පළමු මුද්‍රණයේ තිබුණු යම් යම් ව්‍යාකරණ දෝෂ නිවැරදි කොට, මෙය නැවත වතාවක් පළ කිරීමට "සදීපා" ප්‍රකාශන සමාගම ඉදිරිපත් වීම සම්බන්ධයෙන් මාගේ ස්තුතිය පිරිනැමේ.

මෙම කෘතියේ පළමු මුද්‍රණය නිමා වී තිබුණු නිසා පාඨකයන්ගේ ඉල්ලීම පරිදි නැවත මුද්‍රණය කිරීමට තීරණය කළ බව සඳහන් කරමි. මෙහි සෝදුපත් බැලූ ජගත් පියදසුන් මහතාටත්, සදීපා කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය මෙයින් පිරිනමමි.

Email : brahulahimi@gmail.com
Phone : 034-2243799

sinhalaebooks.com

# උත්සාහය හා පසුබෑම

"අම්මප ගෑනියේ, උඹෙ ඔළුව හොඳ නැතෙයි, මේ බැල්ලි බූරුඇඳේ ගැටගහල තියෙන්නෙ? බලපං ගඳ" මාටින් අයියා උස්හඬින් කීවේ එතනහාමිට ඇසෙන්නටය.

"ඕකි ඔහෙ ටිකක් හිටියාවෙ, මං පිළිකන්නෙන් ගැටහනකං" කුස්සියේ සිට එතනහාමි ද පිළිතුරු දුන්නේ උස් හඬින් ය.

"මේ ගෙරිකුණ ලිහං පලයං මගෙන් මක්කවත් නෑහ" මාටින් අයියා බැල්ලට පා පහරක් ගසමින් කීවේ ය. බැල්ල මරහඬ දෙන්නට පටන් ගත්තාය.

එතනහාමි බූරු ඇඳ ළඟ පහත් වී දම්වැලේ ගැටය ලිහුවාය.

ඇගේ හැට්ටය අත් දෙකින් ලිහී පහළට වැටෙන හැටි මාටින් අයියා බලා සිටියේය. එතනහාමි කීප වරක් අතින් හැට්ටය උස්සා කරේ රඳවාගත්තාය. එහෙත් ඇය පහත් වන හැම විටක ම හැට්ටය කරින් ගිලිහී අත දිගේ බේරෙයි. එතනහාමිගේ හැට්ටය ඇතුළේ තව ගෑනු දෙතුන් දෙනෙකුගේ අවයව දැමිය හැකි යැයි මාටින් අයියාට සිතුණි. ඔහු සිටි තැන ම හිටගෙන කාරා මිදුලට කෙළ ගැසුවේ නාසය හකුළාගෙන බැල්ල දිහා හොරැහින් බලන ගමන් ය.

sinhalaebooks.com

එතනහාමි බැල්ල ලිහාගෙන පිළිකන්න පැත්තට ගියාය. මාටින් අයියා බූරු ඇඳ යට කොස්සෙන් අතුගා දමා ඇඳේ හාන්සි වුණේ ය.

පිළිකන්න පැත්තෙන් ඉඳහිට ඇහෙන බැල්ලගේ උඩුබිරුම මාටින් අයියාට කරදරයක් වූ බව ඒ හැම විටම "චිඃ" යැ යි මාටින් අයියා නඟන ශබ්දය නිසා එතනහාමි තේරුම් ගත්තා ය. එතනහාමි සාලයේ පැදුරක් පුරමින් බැල්ලගේ උඩුබිරුම ද මාටින් අයියාගේ "චිඃ" යැ යි ශබ්ද නැඟීමද අසාගෙන සිටියාය.

මේ බැල්ලගේ කුඩා කාලයත් තරුණ කාලයත් එතනහාමිට හොඳහැටි මතක ය. මාටින් අයියා ඒ දිනවල බැල්ල ගෙදර ගෙන ආවේ මොනතරම් සිනාමුසු මුහුණින් දැයි ඈට කල්පනා වෙයි. මාටින් අයියා ම බැල්ලි පැටවා නාවා කවා පොවා බූරු ඇඳේ කොනක ගැට ගහගෙන සුරතල් කළේය; ඔඩොක්කුවේ තියාගෙන මැක්කන් අරන් දැම්මේය. මාටින් අයියා වත්ත පහළ ඇවිදින්නට යන විට දම්වැල කොනකින් අල්ලාගෙන බැල්ල ද ඒ ගමනට එකතු කරගත්තේය.

බැල්ලගේ ඇඟ කටුවන් කෑමත් ඇඟ වැහැරෙන්නට වීමත්, පුලුන්ගුළියක් මෙන් තිබුණු ලොම් වැටෙන්නටත් රතු හම පෑදෙන්නටත් පටන් ගත් කල මාටින් අයියා කෙරෙන් බැල්ල පිළිබඳව තිබූ උනන්දුව ගිලිහී යන්නට වූ හැටි එතනහාමිට අමතක කළ නොහැකිය. ටිකෙන් ටික ඌව නෑවීමත් කන්න දීමත් සොයා බැලීමත් මාටින් අයියා ඕනෑකමින්ම අතපසු කර දැමූ හැටි සිහි වෙද්දී එතනහාමිට කනගාටුවක් දැනෙයි.

sinhalaebooks.com

බැල්ලගේ ශරීරය නැවත තිබූ තත්ත්වයට ගැනීමට තමා නොයෙක් ගොඩවෙදකම් කළ බව ඈට මතක් වෙයි. ඒ එකකින් වත් ඌගේ වැහැරීම හෝ කටුවත් කෑම නතර නොවූ තැන බැල්ල ජීවත් කරගැනීමට පමණක් වෙහෙස වූ සැටි කල්පනා වෙයි.

එතනහාමි පුරන්නට ගිය පැදුරේ මුල්ල පන් ගස් එළීමේ වරද නිසා වැරදුණි. ඈ නැවතත් පන් ගස් නිවැරදි ලෙස එළන්නට උත්සාහ කළා ය. එතනහාමිගේ කොලුවා කුස්සියේ සිට දුවගෙන විත් එළූ පන් ටික පාගාගෙන දිව්වේ ය.

"අර බැල්ලි ඒ පාර උඩුබුරනව මූසලකමට, අම්මප මං දූං ගහනව පොලුපාරක්" මාටින් අයියා නැවතත් කීවේ ය. එතනහාමි පැදුර පිරීම පසෙක දමා නැගිට්ටා ය.

ඇය පිළිකන්න දිගේ ගොස් බැල්ලට ළං වූවා ය. බැල්ල නැට්ට වනමින් එතනහාමි දෙස බලා සිටියා ය. එතනහාමි බැල්ලගේ ඔළුව අතගාමින් දම්වැල කරින් ලිහුවාය. බැල්ල ඈගේ කකුල ලෙවකමින් හුරතල් වී මොහොතකින් දෙණිය පහළට දුවන්නට වූවාය.

එතනහාමි කේන්තියට දම්වැල ලිහුවත් පසු ව ඒ ගැන පසුතැවුණාය. පෙරේරා උන්නැහෙලාගේ ගෙදර ඇති කරන රට බල්ලා සමඟ ඈ සෙල්ලම් කරනු දුක්කොත් පෙරේරා නෝනාගෙන් බැනුම් අහන්නට සිදු වන බව ඈට කල්පනා වීම නිසා ඈ පසුතැවුණාය. එහෙත් ඒ බල්ලාට දාව බැල්ලට පැටවකු ලැබුණේ නම් හොඳ යැයි ද වරෙක ඕ සිතුවාය.

එතනහාමි බැල්ල පසුපසින් ගොස් කරෙන් අල්ලාගෙන නැවතත් පිළිකන්න පැත්තෙන් කුස්සියට ඇදගෙන ආවා

sinhalaebooks.com

ය. කරට දම්වැල දැමූ එතනහාමි ඇට බත් අනා කන්නට දී කුස්සිය ඇතුළේ ගැටගැහුවාය. බැල්ල උඩුබිරීම නතර කර බත් කා, ගෝණි මාල්ලේ ලැග නිදන්නට වූවාය.

එතනහාමි ඉස්තෝප්පුවට ආවේ පත්තු කරන ලද කුප්පි ලාම්පුව ද අතැතිවය. ඈ කුප්පි ලාම්පුව ලාම්පු ලෑල්ලේ එල්ලුවා ය. මාටින් අයියා බැනියම ඇඳගෙන මිදුලට බැස්සේ ය. මාටින් අයියා මේ වෙලාවට හැම දිනක ම කඩමංඩියට යන බව එතනහාමි දනී. ඔහු එසේ යන්නේ සුරුට්ටුවක් ගෙන ඒමටත්, රා කටුවක් බීමටත් බව ඇයට රහසක් නොවේ. දරුවා ලොකු වීමත් සමඟම මාටින් අයියා සුරුට්ටු බීම ගෙදර දී නො කළ බව එතනහාමිට සිහි වෙයි. රාත්‍රියකට වුවත් ඔහු සුරුට්ටුවක් බීමට දෙනිය පහළට යන්නට පුරුදු වූ යේ ඉබේටමය. මේ ගැන තමා මුලින් මුලින් සතුටු වූ හැටිත් පසුව එය නොරිස්සූ හැටිත් ඇයටම පුදුමය. මාටින් අයියා සුරුට්ටු බීම ගෙදර දී නොකිරීමත් ඔහු තමාගේ ජීවිතයෙන් ඈත් වීමත් දෙකම එක්වර සිදු වූවක් බව එතනහාමිට සිහි වෙද්දී එම නොරිස්සුම හිත තුළ කිමිදෙයි.

මාටින් අයියා තමාගේ ජීවිතයෙන් ඈත් වී ගිය හැටි එතනහාමිට පුදුම සහගතය. දරුවා ලොකු වන්නට වන්නට ඔහුද තමාගේ ජීවිතයෙන් ඈත් වූ බව ඇයට කල්පනා වෙයි. දරුවා නිසා තාත්තා කෙනෙකු ලෙස සතුටු වූ හැටිත්, සැමියෙකු ලෙස තමාගෙන් ඈත් වී ගිය හැටිත් සිහි වෙද්දී ඇගේ ඇසට කඳුළු උනයි.

"සොපිහාමිට හතරවෙනි දරුවත් ලැබිලැයි කියන්නෙ."

"උං ඔය විළිසංගයක් ඇති එවුන්යැ? මහ එකා ඔය කොල්ලන් ඉස්සරහත් කුණුහරුප කියනවලු බීගෙන

sinhalaebooks.com

ඇවිල්ල... මං දැකල තියෙනව අපේ කොලුවත් දෙගොඩ හරි ජාමෙ ඇහැඇරිල ඉන්නව."

"ඌ තාම හිච්චි එකා."

"මට නං බෝතලෙන් කිරි බීපු ඒවත් තාම මතකයි... හිච්චි සංදියෙ දකින දේවල් හිතේ තියෙනව මැරෙනකං."

"එහෙනං දරුවො ඉන්න ගෙවල්වල මිනිස්සුන්ට පවුල් කන්න බෑ නෙ?"

"මට ඉන්න පුළුවන් නං ඔහේටත් බැරි යැ?" මාටින් අයියා කියූ හැටි ඇයට තාම මතකය.

මාටින් අයියා දරුවා නිසා තමාගෙන් ඈත් වූවාද නැතහොත් බිරිඳක ළඟ තිබිය යුතු ශාරීරික සුදුසුකම් තමා කෙරෙන් ඈත් වීම නිසා ඔහු තමාගෙන් ඈත් වී ඇද්දැයි ඇයට තේරුම් ගත නොහැකිය. කෙසේ හෝ මාටින් අයියා ගේ ඇතුළේ සිට සුරුට්ටුවක් බොනවා දකින්නට තමා තුළ තදබල ආශාවක් තිබෙන බව ඇයට ම තේරෙයි.

මාටින් අයියා ගෙදර එන විට ලාම්පු ලෑල්ලේ එල්ලා තිබූ ලාම්පුවේ තෙල් බාගයක් විතර ඉවර වී තිබුණි. තමා එය පත්තු කරන විට තෙල් පිරී තිබූ බව ඇයට මතක ඇත.

මාටින් අයියා වෙනදාට වඩා සතුටකින් සිටින බව එතනහාමි දුටුවාය. මාටින් අයියා බූරු ඇඳ උඩ වාඩි වී මිදුල දෙස බලා සිටියේය. කොහේදෝ සිට දුවගෙන ආ බැල්ල නැට්ට වනමින් බූරු ඇඳ යටට රිංගුවාය. මාටින් අයියා නැවතත් කෑගසාවි යැ යි එතනහාමි සිතුවත් මාටින් අයියා සිටි ඉරියව්වෙන් ම සිටියේය. එතනහාමිගේ සිතට සියුම් සතුටක් දැනෙන්නට විය. ඇය උළුවස්සට හේත්තු වී මාටින් අයියා දෙස බැලුවාය. මාටින් අයියාද එතනහාමිගේ

sinhalaebooks.com

මුහුණ දෙස බැලුවේය. ඇගේ වළ ගැසුණු කම්මුල් පිම්බී ඇති සැටි ලාම්පු එළියෙන් ඔහු දුටුවේය. මාටින් අයියා ඉණ අතගා සුරුට්ටුවක් අතට ගත්තේය. "පොඩි එකා කෝ?" මාටින් අයියා සුරුට්ටුව තොල් අතර හිර කරගන්නා ගමන් ඇසුවේය. "ගේ ඇතුළෙ" එතනහාමි යන්තමින් සිනා සෙන්නට උත්සාහ කරමින් කීවාය. මාටින් අයියා සුරුට්ටුව තොල් අතරින් මුදා යළි ඉණේ ගසාගත්තේය.

"ඔහේ සුරුට්ටු බොන විත්තිය ඌ දන්නව. ඒ උණාට ඕවයෙ තේරුමක් නෑ තාම.?"

"මං ඌට පේන්න සුරුට්ටු බිව්වැ යැ"

"ඌට නාහෙ තියෙනව. ඕකෙ ගඳ හංදියට උණත් දැනෙනව"

"ඌට තේරෙන්නෙ නැත් නම් කොහොමෙයි සුරුට්ටු ය කියල දන්නෙ?"

"ඒක තමයි මාත් කියන්නෙ" එතනහාමි ජයග්‍රාහි ලෙස බෙල්ල උස්සමින් කීවා ය. මාටින් අයියා ඇස් පුංචි කරගෙන එතනහාමි දෙස බැලුවේය.

"ඔන්න ඕක බොන්න ඕන නම් බොනව" එතනහාමි යාන්තමට සිනා සෙමින් කීවා ය. මාටින් අයියා සුරුට්ටුව තොල් අතර තබාගත්තේය.

"ඔන්න නැගිටිනව මේ බූරු ඇඳ ගසා දාන්න ටිකක්" බූරු ඇඳේ එළා තිබූ පැදුරේ වාටිය අල්ලාගෙන එතනහාමි කීවේ මාටින් අයියාගේ තොල් අතර හිර වූ සුරුට්ටුව දෙස හොරෙන් බලන ගමන්ය. මාටින් අයියා ඇඳෙන් නැඟිට ගොස් සුරුට්ටුව පහන් දූල්ලට කිට්ටු කළේ ය. එතනහාමි පැදුර හකුළා බිම දමා, ඇඳේ ගෝණියට අතින් ගැසුවාය.

sinhalaebooks.com

"මේක තියෙන දූවිලි අවුරුදු ගණනකින් ගසල නෑ" ඇය දූවිලි ගසමින් කීවාය. මාටින් අයියා දුම් ගුළියක් කටින් පිට කළේය. එය වළල්ලක් මෙන් කැරකි කැරකී මිදුල පැත්තට ඇදුණේය. එදෙස ඔහු ඕනෑකමින් බලා සිටියේ ය; තවත් දුම් ගුළියක් උඩට පිට කර පාවී යන දුම් වළලු දෙස ආශාවෙන් බලා සිටියේය.

මිදුලේ ඇති ඉද්ද ගස්වල මල් පිපී ඇත. පසළොස්වක පෝය කිට්ටු නිසා දවල් මෙන් හඳ පායා ඉද්ද ගස්වල මල් සුදු පාටින් බැබළෙන හැටි මාටින් අයියා බලා සිටියේය. එවැනි සිරියාවක් තමා මීට පෙර දැක නැතැයි ඔහු සිතුවේය. මිදුලේ ඇතින් වූ ඉද්ද මල් ගේ ළඟම තිබුණා නම් හොඳ යැ යි ඔහුට සිතුණි. ඔහු තවත් දුම් වළලු කීපයක් කටින් පිට කළේය. ඉද්ද මල් ගාලට ගොස් සුරුට්ටුව බොන්නට මාටින් අයියාට සිතුණි.

"ඔන්න ඇඳ හැදුව" එතනහාමි හිමින් කීවාය.

"හා, ඔහෙ තිබ්බිච්චාවෙ. මං මේ බැලුවෙ දවල් වගේ හඳ පායල තියෙන්නෙ" මාටින් අයියා තව දුම් ගුළියක් පිට කරමින් කීවේය.

"මං පොඩි එකාව නිදිකරවල එන්නං. ඔහේ දැන්ම බත් කනව යි බෙදාගෙන එන්න?"

"ඔහෙ කොයි වෙලාවෙ බැරියැ... මං මේ බැලුවෙ මිදුල ලස්සන වෙලා තියෙන හැටි අද."

"මං පොඩි එකාව නිදි කරවල බත් බෙදාගෙන එන්නං. කරෝල හොද්දකුත් හදල ඇති" එතනහාමි ඇස් පුංචි කරමින් මාටින් අයියාගේ අත්දඬු දෙස බලාගෙන කීවාය.

sinhalaebooks.com

මාටින් අයියා හෙමින් ඉද්ද මල් ගාල පැත්තට ගියේය. හිත හැල්ලු වී ඇතැයි ඔහුට සිතුණි. ඉද්ද මල් ගසකින් මලක් කඩාගත් මාටින් අයියා එහි නටුව එක් අතක මාපට ඇඟිල්ලත්, දබර ඇඟිල්ලත් අතර යාන්තමට හිර කරගෙන, සුරුට්ටු දුම් පිම්බේය.

සුරුට්ටු දුම් සමඟ එන සුළං පහරට මල කරකැවෙන්නට පටන් ගත්තේ ය. ඇඟිලි තුඩු බුරුල් කරමින් ඔහු තව තවත් සුරුට්ටු දුම් පිම්බේය.

මාටින් අයියාගේ හිත ද තව තවත් සැහැල්ලු වී යන්නාක් මෙන් ඔහුට දැනුණි. ඔහු අත ඉහළට ඔසවා ඇඟිලි තුඩු හොඳට ම බුරුල් කොට හැකි වෙර යොදා සුරුට්ටු දුම් ගුළියක් පිම්බේය. අතින් ගිලිහී ගිය ඉද්ද මල කැරකි කැරකී ගොස් බිම වැටුණේය. ඔහු තවත් මලක් කඩා ගෙන ඇඟිලි තුඩු අතර හිර කරගත්තේය.

"පොඩි එකා නිදාගත්ත. ඔන්න බතුත් බෙදුව. ඇවිත් කෑවනං" එතනහාමි ඉස්තෝප්පුවේ සිට උස් හඬින් කීවාය. ඒ සමඟම බැල්ලගේ උඩුබිරුම් හඬ මාටින් අයියාට නැවත ඇසෙන්නට විය. ඔහු සුරුට්ටුව ඉරීමෙන් කටට ඉනූ කෙල කාරා බිම ගැසුවේය.

කළු වලාකුළක් හඳට පහළින් ගසාගෙන යයි. එයින් හඳ එළිය අඩු වී මිදුල අඳුරු වී ගියේය. සුදු ඉද්ද මල් ගාල මාටින් අයියාට නොපෙනී ගියේ මේ අඳුර වැඩි වූ නිසාය. ඔහු අහස දෙස බැලුවේය. සිංහරාජ කඳුවැටිය තරම් වූ වලාකුළු ගසාගෙන යන්නේ ඉතා හෙමින් යැයි ඔහුට සිතුණි. ඔහු ඇඟිලි අතර රඳවාගෙන තිබූ ඉද්ද මලට සුරුට්ටු කොටය ළං කළේය.

sinhalaebooks.com

"වහල තියහං බං. මං පස්සෙ කන්නං. ඔන්න ඔය බලු කොටිය ලිහල දාහං ඕන දේවාලෙක යන්න"

මාටින් අයියා වේගයෙන් කීවේය. ඔහු සුරුට්ටු කොටේ අළු ගසා දමා නැවතත් ඉද්ද මල්වලට ළං කළේය.

"මේක හීතල වෙනව, දවාලෙ බත්" එතනහාමි යළිත් උස් හඬින් කීවාය.

ඉස්තෝප්පුවේ එල්ලා ඇති කුප්පි ලාම්පුවේ දැල්ල වළාකුළු ගසාගෙන යන සුළඟට දෝ වේගයෙන් සැලෙන්නට පටන් ගත්තේ ය. එතනහාමි ලාම්පු දැල්ල අතින් මුවා කරගත්තාය.

"පිලුං වෙලා නං බල්ලට දානව! ඔන්න ඔහෙ තියල, උඹ ගිහිං බුදියගනිං" මාටින් අයියා එතනහාමිට උත්තර දුන්නේ මඳ වේලාවකට පසු වය.

එතනහාමිගේ ඇඟිලිකරු අතරින් රිංගා ආ හුළඟට කුප්පි ලාම්පුව නිවී ගියේය. එතනහාමි සුසුමක් පිට කොට කළුවරේම ගේ ඇතුළට ගොස්, පැදුරු කඩමාල්ලේ නිඳන දරුවා පසෙකට කර, ඇයද එහි ඇල වුණාය.

sinhalaebooks.com

# අයියයි මල්ලියි

අඳුරට ඉඩ දී පලා යන හිරු බටහිර අහස ගිනිබත් කොට යන්නේ යැ යි, රතුපාට වලාකුළු පෙළ දුටු නිමල් සිතුවේය. අහස දෙස බලා සිටි නිමල් කඩුල්ලේ උණ ගහ බිම වැටෙන ශබ්දය ඇසී, ඒ දෙස බැලුවේය. දම්පාට ඉරි වැටුණු පිජාමා සරම කැහැපොට ගසාගෙන, රා මුට්ටියක් අතින් අල්ලාගෙන කඩුල්ල පනින සිරිසේනගේ රුව නිමල් දුටුවේය. ඔහු රා මුට්ටිය දෙස උවමනාවෙන් බැලුවේය. කට වැහෙන ලෙස එළා තිබූ ගහල කොළය අස්සෙන් ගලන රා පෙණ මුට්ටිය දිගේ පහළට බේරෙයි. රා කළය පැහෙමින් ඇතැයි නිමල් සිතුවේය. ඉදිරියට එන සිරිසේනගේ මුහුණ රතුපාට අහසේ ආලෝකයෙන් නිමල්ට හොඳින් පෙනෙයි.

"පාහර බල්ලො" සිරිසේන ගෙට ගොඩ වෙන ගමන් හයියෙන් කීවේය. දුර තියාම සිරිසේනගේ ඉරියව් දුටු නිමල් කුමක් හෝ සිදු වී ඇතැයි සැක කළේය.

"මොකද අයියෙ"

"කිතුල් මලක් කඩල දාලා කවුද බැල්ලිගෙ පුතෙක්."

ඔහු එසේ කියාගෙන සාලය මැදින් කුස්සිය දෙසට ගියේය. නිමල් ද ඔහුගේ පස්සෙන් ගියේය. මුට්ටිය දිගේ බේරී සාලය හැම තැන ම වැක්කෙරෙන රා පෙණ නිමල් කකුලෙන් පිහ දමදමා ගියේය.

රා මුට්ටිය බිම තැබූ සිරිසේන ඉණේ ගසාගෙන සිටි මල් පිහිය ඇද කොළපත් කොපුවෙන් එළියට ගත්තේය.

sinhalaebooks.com

සිරිසේනගේ මුහුණ දෙසත් පෙණ දමන රා මුට්ටිය දෙසත් නිමල් වරින් වර බැලුවේය.

කොපුවෙන් පිහිය ඇදගත් සිරිසේන ළිපට පිහිතුඩ ඔබා, අළු ටිකක් ගත්තේය. තෙලිජ්ජ හැළිය ළිප තබාගෙන හැඳිගාන සොපිහාමි සිරිසේනගේ මුහුණ දෙස බැලුවාය. සිරිසේන පිහිය මුව තබන ලී පටියට අළු ටික දමා බිම ඇන තියාගෙන පිහිය මදින්නට විය.

"කවුද කඩල තියෙන්නෙ? නිමල් ඇසුවේය."

"කවුද ඉතිං, ඇඩ්ඩිය මිසක ඔය පාහර වැඩ කරන්නෙ?"

"දෙන්න තිබුණෙ දෙකක්..."

නිමල් පහත් වී, මුට්ටියේ පෙණ ගුළි ඇඟිලි තුඩින් එකතු කරමින් කීවේය.

"මං හරියට දැක්කෙ නෑ නෙ... මං කරන්නංකො හොඳ වැඩක්"

"මොකක්ද?" නිමල් පෙණ ගුළියක් ඇඟිලි තුඩුවලින් අහකට විදිමින් ඇසුවේය.

"මං කන්දෙ දේවාලෙ ගිහිං පොල් ගහනව කරපු උං හැඳිගෑවෙන්න!"

නිමල් සරම්පොටේ ඇඟිලි පිහදාගෙන නැගිට්ටේය.

"අයියට මොළේ නැද්ද? කොන්ද පණ නැති දේවල් කරන්නෙ..."

sinhalaebooks.com

"උඹ හිටහන්කො. සේදරයට මොකද උණේ, පොඩිහාමිලයි එළහරක හොරකං කරල?"

"මනස්ගාත! ඕව ගල්යුගේ මිනිස්සුන්ගෙ වැඩ. පොල් ගැහුවට ඈඩ්ඩියට මොනවත් වෙන්නෙ නෑ."

"ඈඩ්ඩිය හරි, මොකා හරි කරපු එකා පිටින් යාවි."

"අයියෙ, කොන්ද පණ තියෙනව නං ඈඩ්ඩියනේ ගිහින් අහන්න බැරි ද? එක්කො පොලීසියට අල්ලල දෙන්න බැරි ද? දෙකක් අනින කොට කියාවි ඔක්කොම..."

"දෙයියො බලාගනීවි." මං මොකෝ විකුණන්න රා පෙරනවයි? ඈගේ අමාරුවට එක ගහකින් රා ඩිංගක් දාගන්නව තමයි. ඒත් ඔය අනිත් ගස් දෙකෙන් ම ගන්නේ තෙලිජ්ජ නෙ..."

"ඔව් ඔව්. මෙන්න කියල ම දෙයියො බලාගනියි. ඕව දෙයියන්ට කියන්නෙ මී හරක් වගේ මොළයක් නැති, කොන්දක් නැති මිනිස්සු."

"අනේ උඹ මගෙන් කුණුහරුප නාහ ඉඳින්. උඹ ඉගෙනගත්ත මිනිහ; මං මෝඩය. බලහන්කො මෝඩයගෙ වැඩ දවස් දාහතරක් යන්න ඉස්සෙල්ල!"

"උඹල ඕකට වාද වෙන්න ඕන නෑ. ලොකු එකාගෙ මල නෙ... ඌට ඕන එකක් කරගත්තාවෙ. අනිත් එක ඈඩ්ඩියම කෙරුවයි කියල උඹල දැක්ක යැ?"

තෙලිජ්ජ හට්ටිය ළිප තබාගෙන හැඳිගාමින් සිටි සොපිහාමි ටිකක් හයියෙන් කීවාය. සිරිසේන මුව තැබූ පිහිය කොපුවෙහි ලා වහලේ පොල් අත්තක් යට හැංගුවේය.

sinhalaebooks.com

"නෑ අම්මෙ, මිනිස්සු කරන්න ඕන කාලෙට ගැළපෙන දෙයක්. අයියට රෙද්දක් ඇඳගෙන පුළුවන්ද දෙනෝදාහක් මැද්දෙ කිතුල් මල කඩලයි කියල දෙයියන්ගෙ ඉස්සරහ පොල් ගහන්න, විළි ලජ්ජාවක් තියෙනව නම්"

නිමල් වහලේ ගැසූ පිහිය දෙස හොරැහින් බලමින් කීවේය.

"ඒ උඹට නෙ බැරි. මට පුළුවන්. අම්මෙ, මට රුපියල් පහළොවක් දියන් කඩේ ගිහින් එන්න."

"සොපිහාමි ඉණ අතගා චීත්ත ගැටය ලිහා රුපියල් පහළොවක් ගණන් කර සිරිසේන අතට දුන්නේ"

"මක්කටෙයි දූන් සල්ලි?" යි අසමින්ය.

"තෙල් ටිකකුයි, කපුරු හඳුන්කූරු ටිකකුයි, පොල් ගෙඩියකුයි ගේන්න."

නිමල් කුස්සියෙන් පිටව ඉස්තෝප්පුවට ආවේය. ඔහුට අයියා ගැන ඇති වූයේ කෝපයකි. තමා ඉගෙනගත් දෙයින් අයියලාට ප්‍රයෝජනයක් නැතිවීම ගැන දැඩි ලෙස ශෝක විය. ඔහු පාසලෙන් කට්ටිපැන වල් වැදී ගස් මදින්නකු වී තමාට නින්දා කරතැයි නිමල් සිතුවේය. ඒ සමඟ ම ගස් මැදීමෙන් තමාට ඉගෙනගැනීමට වියදම් කළ අයියා ගැන අනුකම්පාවක් ද ඇති වේ. විශ්වවිද්‍යාලයට යන්නට නොහැකි වුවත් ඒ දක්වා ලබාගත් අධ්‍යාපනය සමාජයේ බුද්ධිමත් උගත් මිනිසකු ලෙස සිටීමටත් ජීවත් වීමටත් ප්‍රමාණවත් බව නිමල් සිතුවේය. කණ අත්සන ගහන අම්මාත්, මළපොතේ අකුරක් බැරි අයියාත් තමා ළඟ ඉතා පහළ මට්ටමේ අය ලෙස නිමල් කල්පනා කළේය.

sinhalaebooks.com

සිරිසේන කඩුල්ල පැන ගිය පසු නිමල් කුස්සියට ගියේය.

"අම්මටවත් මොළයක් නැද්ද, මේ කිතුල් මලක් කඩපු එහෙකට අයියා දේවාල ගානෙ යවන්න?"

"ඒ ඒකා හිතන හැටි නේ දරුවෝ" සොපිහාමි ඇවිළෙන දර කෑල්ලක් ළිප යටට ඔබමින් කීවාය. සිරිසේන විසින් ගෙන විත් තබන ලද රා මුට්ටියේ පෙණ ඉතිරීම නතර වී ඇති හැටි නිමල්ට පෙනෙයි. ඔහු පහත් වී ගහල කොළය පැත්තකට දමා වතුර කළය වසා තිබූ පොල්කටුවට රා වක්කරගත්තේය. කටින් පිඹ පෙණ දෙපැත්තට කළ නිමල් ගුඩු ගුඩු ගා රා කටුව බිව්වේය. ඒ පිටට ම තවත් රා කටුවක් හිස් කළේය.

"කොන්ද පණ නැති මිනිහෙක් අයිය" කියමින් තුන්වෙනි රා කටුවත් හිස් කළේය. උතුරන පැණි හැලිය වටේ ඇවිළෙන ගින්දර තමා ටිකකට කලින් අහසේ දුටු රතුපාට වලාකුළුවලට මැදි වූ හිරු යැ යි නිමල් සිතුවේය. පැණි හැළියෙන් නඟින හුමාලය පා වී යන වලාකුළු කැටි සේ නිමල්ට පෙනෙන්නට විය.

"ඇඩ්ඩියටත් කොන්ද පණ නෑ. උඹ කොන්ද තියෙන එකෙක් නම් කිතුල් මල් කඩාවියැ, වේසිගෙ පුතා" නිමල්ගේ වචන සොපිහාමිට හොඳින් ඇසෙයි. සොපිහාමි ළිපේ ඇවිළෙන දර කැබලි එළියට ඇද ලිබ්බොක්කේ ඔබමින් පැණිහැළිය හැඳිගෑවේය. එහි පදම හරි බව දැනගත් සොපිහාමි ගිනි අඟුරු ද එළියට ඇද්දේය. "උඹ ඕවට මුකුත් කියන්න ඕන නෑ. උඹ ඔහෙ ගිහිං පොල් ගහපුවාවෙ අපිට මොකෝ?"

sinhalaebooks.com

නිමල් තවත් රා කටුවක් බී නැගිට්ටේය. කැකෑරෙන පැණි හට්ටියෙන් නැඟෙන හුමාලය ඔහුට ඉවසා සිටිය නොහැකිය. වහලේ ගසා තිබූ මල්පිහිය ඇද ඉණේ ගසාගත් නිමල් සාලය දිගේ ඉස්තෝප්පුවට ආවේය.

වටපිටාව කළුවර වැටී තිබුණත් කඩුල්ල මුල ඇති උණ ගස නිමල්ට පෙනෙයි. අයියා ටිකකට කලින් කඩුල්ලට පයින් ඇන උණ ගහ බිම දමාගෙන ආ හැටි නිමල්ට සිහි වෙයි.

"කොන්ද පණ නැති යක්කු. උඟට පිස්සු! පොල් ගහලා ප්‍රශ්න විසඳන්න පුළුවන් නම් මේ ලෝකෙ ඔක්කොම පොල් ගහවි... ඔව්. උඟට කොන්ද පණ නැති උණාට මට කොන්ද පණ තියෙනව" නිමල් කියවමින් කඩුල්ලෙන් පැනගත්තේය.

"කුස්සියේ සිටි සොපිහාමිට නිමල්ගේ කෑගැහිල්ල ඇසුණේ ඊට ටික වේලාවකට පසුවය. ඇය කඩුල්ල ළඟට දුවගෙන එන විට ඇඩ්ඩින්ගේ ගෙවල් පැත්තෙන් ඇහෙන කුණුහරුප කියාගැනීම් සොපිහාමිට හොඳටම ඇසුණි. ඇය කඩුල්ල අල්ලාගෙන "කොලුවා කොලුවා" යැයි කෑගැසුවාය. ඒ සමඟම මර ළතෝනියක හඬ සොපිහාමිට ඇසුණේය. "බුදු අම්මෝ! මෙන්න මිනී මරනෝ" කියමින් කෑගසන ඇඩ්ඩින්ගේ පවුලගේ විලාපය සොපිහාමිගේ කන් පතුල් පළාගෙන යන්නට තරම් වේගවත් විය.

"මගේ තාත්තට මොනව හරි උණොත් තොපි ඔක්කොම මකබාවනව යකෝ" යැයි තවෙකෙක් කෑ ගැසුවේය. ඒ හඬ ඇඩ්ඩින්ගේ පුතාගේ බව සොපිහාමි ස්ථිරව ම හිතුවාය.

sinhalaebooks.com

"දෙයියනේ! ලොකු එකෝ... හනික වරෙන්. මෙන්න මූං මිනී මරාගන්නවෝ" කියමින් සොපිහාමි කඩුල්ලේ අත්දෙක ගසාගනිමින් මොරදුන්නාය. තවත් මොහොතකින් ලේ පෙරාගෙන කඩුල්ල පැත්තට දුවගෙන එන නිමල් දුටු සොපිහාමිගේ කෑගැහිල්ල ඉබේම වැඩි විය. නිමල්ගේ පස්සෙන් පොල්ලක් ගෙන පන්නන ඇඩ්ඩින්ගේ පුතා මාරාවේශයෙන් එන සැටි සොපිහාමි කළුවරේ ම දුටුවාය. ඇය කඩුල්ලෙන් මිදුලට පැනගත් පුතා මඟහැර, කඩුල්ල හරස් කළාය.

"අයින් වෙයන් නාකිච්චි! මූ මගේ තාත්තට පිහියෙන් ගැහුව. මං අද ඕකවත් මරාගෙන මැරෙනව. අයින් වෙයන්" යැයි සොපිහාමිව තල්ලු කරගෙන ඔහු කඩුල්ලෙන් මිදුලට පැන්නේය.

"ගෙට දිව ගිය නිමල් කැත්තක් අමෝරාගෙන ඉස්තෝප්පුවට ආවේය. "එකෙක් ඉස්සරහට එන්න එපා. කැතිගානව තොපි ඔක්කොම" නිමල් යටිගිරියෙන් බෙරිහන් දුන්නේය. වටපිටාවේ ගෙවල්වලින් පැමිණි පිරිමි හා ගෑනු කඩුල්ලෙන් මිදුලට පැන, වෙන්න යන්නේ කුමක් ද යි බලාගෙන සිටියේය. ගෙට ගොඩ වීමට බියෙන් පසු වූ ඇඩ්ඩින්ගේ පුතාත් මිදුලට බැසීමට බියෙන් ඉස්තෝප්පුවේ සිටි නිමලුත් දෙදෙනා ම එකිනෙකාට කුණුහරුප කියා බැනගන්නා හැටි සොපිහාමිට ඉවසාගත නොහැකි විය.

"අනේ බේරපල්ලකො.......... බලන් ඉන්නෙ!"

ඇය පැමිණි ගෑනුන් හා පිරිමින් ඉදිරියේ අඬා වැටුණාය.

"දැන් පොලිසියෙන් ආවම චණ්ඩින්ට තේරෙයි වැඩේ!" එකෙක් හයියෙන් කීවේය. ඒ සමඟම හුළු අතු එළි යට

sinhalaebooks.com

කරගෙන විදුලි ලාම්පු එළි මතු වන්නට විය. වේගයෙන් පැමිණ කඩුල්ල ළඟ නතර කළ ජීප් රියෙන් බැසගත් පොලිස් නිලධාරීන් ගේ පැත්තට දුවන හැටි සොපිහාමි බලා සිටියේ කඳුළු සලමින්ය. කැත්ත බිම දමූ නිමල් පොලිස් අණට යටත් විය. ඔහුගේ දෑත් විලංගු ලා ඉදිරියට ගෙන එන හැටි සොපිහාමිට බලා සිටීමට නොහැකි විය. ඈ කෑගසමින් පොලිස් නිලධාරීන්ට කන්නලව් කළාය.

"තාත්තාට මුකුත් උණොත් මං එල්ලුම් ගස් ගියත් තෝව හොයාගන්නව" කියමින් ඇඩ්ඩින්ගේ කොලුවා කෑගසන විට සොපිහාමි ඔහු දෙස අසරණව බැලුවාය.

සිරිසේන ආපහු එන විට නිමල් පොලිස් ජීප් රියේ පිටුපස වාඩි වී සිටියේය. පොල්, කපුරු, හඳුන්කූරු අත්දෙකට හිර කරගෙන සිරිසේන කඳුළු පිරුණු දෑසින් මල්ලී දෙස බැලුවේය. සොපිහාමි සිරිසේනගේ ඇඟේ එල්ලී විලාප නඟද්දී ජීප් රථය නො පෙනී ගියේය.

sinhalaebooks.com

# අම්මාට ලිපියක්

ආදරණීය අම්මේ. අම්මා පිට රට ගියායින් මට වුණු සෙතක් නැතැ යි සිතේ. අද මම අන්ත අසරණ, මාපිය සෙනෙහස අහිමි වූ, අවාසනාවන්ත දියණියක ලෙස හැදී වැඩුණු ගෙයින්ද පිටමං වී සිටිමි.

තමාගේ ජීවිතයේ සිදුවීම්වලට වැරදිකරු වී ඇත්තේ මා බව තාත්තා සිතනවා ඇත. තාත්තාත් මමත් අද ළං විය නොහැකි ලෙස වෙන් ව සිටිමු. ඒ මට තාත්තා එපා වීම නිසා නොව, තාත්තාට මාව එපා වීම නිසා ය.

මහ වැස්සක පෙර නිමිති දුටු වැහිළිහිණියකු මෙන් ද, අහස කඩා වැටේ යයි සිතා දුවන හාවකු මෙන් ද තාත්තා අසරණ වී ඇත කලබල වී ඇත. ගරායක්ෂ නැටුමකට අඳින ලද නැට්ටුවකුගේ මුහුණ මෙන් තාත්තාගේ මුහුණ විකෘති වී ඇත. මහා නියඟයකින් ඉරි තැළී ගිය වැව් පතුලක් මෙන් තාත්තාගේ ජීවිතය ඉරි තළා ඇතැ යි ද සිතේ. මහා මංකොල්ලයක් කර පලා යන හොර දෙටුවකු සොල්දාදුවකු දුටු පරිදදෙන් තාත්තා මා කෙරෙන් ඈත් වෙයි. විෂඝෝර සර්පයකු සපා කෑමට පනින විට අත ඇති ඕනෑම දේකින් දමා ගසා සර්පයා මරා දැමීමට හදන මිනිසකු ලෙස තාත්තාගේ සියලු අකාරුණික වූ බලාපොරොත්තු බිඳ වැටීමෙන් ඇති වූ කෝපය නමැති ආයුධවලින් මට දමා ගසයි. ගිනි අව්වේ දමා වේළන ලද නො මේරූ දිය ලබු ගෙඩියක් ලෙස තාත්තාගේ මුහුණත්, ගතත් වියළී ගොස්ය.

sinhalaebooks.com

තාත්තා මෙතරම් වෙනස් වන්නට මා විසින් කරන ලද වරදක් නැත. එහෙත් තාත්තාට මා වැරදිකාරියක ලෙස පෙනෙයි. ඔහුගේ සියලු කෝපයන් මා මතින් මුදා හැරීමට තරම් ඔහු අකාරුණික වූයේ මන්දැයි මම නො දනිමි.

මේ සියල්ල මට විඳ දරාගත හැකිය. එසේ වුවත් මා ගෙදරින් පිටමං කොට ආච්චිගේ ගෙදර නතර කිරීම නම් කිසි සේත් දරාගත නොහැකිය. එයින් වූයේ තාත්තා කෙරෙහි වූ අනුකම්පාව කලකිරීමකට හැරීම පමණි. අද තාත්තා මගෙන් නිදහස් වී ඇත. එදා මෙදා තුර ඔහු මා බැලීමට එක් වරක් වත් පැමිණ නැත. මා ගැන ආච්චිට එවන ලියුම් කඩදහිත් වියදමට එවන මුදලුත් මට ඇති ආදරයක් නිසා එවන මුදලුත් මට ඇති ආදරයක් නිසා එවන ඒවා යැයි නො සිතේ. එහෙත් එදා පටන් මෙතෙක් සිදු වී ඇති සියලු සිදුවීම් ගුප්තමය බලයකින් තාත්තාව පාලනය කිරීමක් නිසා සිදු වන ඒවා ද යි සැක සිතේ නැත්නම් තාත්තාට පිස්සු විය යුතු ය.

අම්මා පිට රට යන්නට පෙර තාත්තා කොතරම් මට ආදරෙන් සිටියා ද? ඔහු මගේ හිත රිදවන්නට එක් වචනයක් වත් කියා ඇති බවක් මට මතක නැත.

අම්මා පිට රට ගොස් ටික කලක් ගත වන තුරුත් ඒ සෙනෙහසේ අඩුවක් නොවූ බව සිහි වෙද්දී මට ඇති වන්නේ මහත් දුකකි. තාත්තා මට මතක ඇති කාලයේ සිට මෙසේ සැලකුවා නම් දුකක් නැත. ආශාවෙන් රස විඳි අයිස් පලමක් මැද පණුවකු සිටිනු දැකීමෙන් ඇති වන පිළිකුල දැන් මට දැනේ. එතෙක් ආශාවෙන් රස විඳි අයිස් පලමේ රසය උගුරේ අත දමා එළියට ඇද දමන්නට ඇත් නම් යැයි යන හැඟීම තාත්තාගෙන් ලද ආදරය කෙරෙහිද ඇති වේ.

sinhalaebooks.com

තාත්තා වෙනස් වූයේ එකවර නොව; එය පෙරනිමිති පහළ කොට වසින ලද වැස්සක් බඳු විය. එහෙත් හදිසියේ ඇදහැලුණු ධාරානිපාත වර්ෂාවකට තෙමණකු ලෙස මා සීතලෙන් වෙව්ලයි.

තාත්තාට සැබවින් ම පිස්සු යැ යි සිතීමට තරම් බොළඳ යැයි හැඟෙන ක්‍රියා ඔහු විසින් මෙතෙක් කර ඇත. මා කරනා හැම ක්‍රියාවකම ඔහු වරදක් දකියි. ඔහු එම වැරදි සෙවීමට පෙලඹුණේ අනුක්‍රමයෙනි. මුලින් ම ඔහු මට දැඩි ලෙස ආදරය පෙන්නුවේය. අම්මා ගිය දිනවල තාත්තාගේ සියලු කටයුතු මා අතින් සිදු වනු දැකීමේ දී ඔහුගේ මුහුණ අම්මා නැති වීමෙන් ඇති වූ ශෝකී බවේ වලාකුළු ඉවත් වූ දීප්තිමත් අහස මෙන් ප්‍රසන්න වී තිබුණි. ඔහු දිනපතා මට මොනවා හෝ ගෙනාවේය. සතුටින් සිටියේය. ප්‍රිය වචනයෙන් කතා කළේය. තාත්තා මට පමණට වඩා ආදරය කළේය. අප අතර වූයේ දුරස් වූ බැඳීමකට වඩා, මිතුරන් ලෙස එකතු වූ බැඳීමකි.

එහෙත් මේ සබඳකම මා කෙරෙන් උදුරාගැනීමට තාත්තා සාහසික වූයේ මන්ද? තාත්තා ටිකෙන් ටික මගෙන් ඈත් වන්නට විය.

දිනක් තාත්තාට ගෙන යාම සඳහා බත්මුල බඳිමින් සිටින විට කුස්සියට පැමිණි තාත්තා මා දෙස බලා සිටියේය. එය ජීවිතයේ පළමු වන වරට දුටු කෙනකු දෙස හෙළන බැල්මක් මෙන් විය. අනතුරුව ඔහු කතා කළේය.

"උඹ ඔය පෙට්ටියට බත් බඳින්න එපා."

"ඇයි තාත්තෙ, අම්මත් බත් බැන්දෙ මේ පෙට්ටියෙ නෙ?"

sinhalaebooks.com

"උඹට ඒ පැහිච්චකං ඕන නෑ. අම්ම කරන විදියට උඹ කරන්න ඕන්නෑ."

තාත්තා පිළිබඳ ව ජීවිතයේ පළමු වරට බියක් දැනුණි. එසේ තාත්තා සැරෙන් කතා කළ පළමු දවස වුව ද මසිත රිද්දූ පළමු දිනය නො වීය. එහෙත් ඊට පෙර ටිකින් ටික තාත්තා මා අමතක කොට දමා, නො සලකා හැර දමා තිබුණා විනා, වචනයෙන් පහර ගැසීමක් කර නැත. කෙසේ හෝ මම මෙයින් මහත් සේ කැලඹුණෙමි. තාත්තාගේ මේ වෙනස් වීම, අම්මා විසින් තාත්තාට එවන ලද ලිපියක් නිසා හෝ එසේත් නැත් නම්, අම්මාත්, තාත්තාත් අතර වූ පැරණි කෝන්තරයක් නිසා හෝ මතු වන්නට ඇතැයි සිතුවෙමි.

බත් බෑදීම අරභයා තාත්තාගේ විරෝධය දිනෙන් දින ම වැඩි වන්නට වූයේය. "උඹ මොකද බිත්තරය බත් අස්සෙ හංගල තියන්නෙ. කාට පේනවාටද? හැමදාම ලුණුමිරිස් තියන්නෙ, මගේ ගිනි අවුස්සන්නද" තාත්තා වරක් කෝපයෙන් ඇසුවේය. තාත්තාට අම්මා බත් බඳින අයුරු මා කොතෙකුත් දැක ඇත. බිත්තරය බත් අස්සේ හැංගීමත්, ලුණුමිරිස් තැබීමත් මා කළේ අම්මා අනුකරණය කිරීමක් ලෙසට වඩා තාත්තාට අම්මා නැති අඩුව නොතේරෙන්නටය. ලුණුමිරිස ගැන තාත්තා ඉහළින් වර්ණනා කරන හැටි මට හොඳට මතකය. මමද අම්මා මෙන් තාත්තාගේ හිත සතුටු කිරීමට ලුණුමිරිස බත්පතට එකතු කළෙමි. එහෙත් තාත්තාට එවා පෙනුණේ ඇදේටය. මා හදන කෑම රස නැතුවා නොවේ නම් මේ සියලු සිදුවීම්වලින් මට පෙනෙන්නේ තාත්තා මගෙන් ඈත් වීමට මඟක් සෙවූ බවය.

sinhalaebooks.com

තාත්තා වැඩ ඇරී ගෙදර එන වේලාව දිනෙන් දින පහු වන්නට විය. හොඳට ම රෑ බෝවී එන දවස් වැඩිවන්නට විය. තාත්තා මා සමඟ දිනකට කථා කරන වචන ගණන තුන හතරකට වඩා වැඩි නො වන්නට ඇත. මා ඔහුගේ ජීවිතයෙන් බැහැර වූ කෙනකු ලෙස සලකන්නට හේතු වූයේ කාගේ හෝ කේලාම් දැයි මම සැක කළෙමි. එහෙත් මා අම්මාටත්, තාත්තාටත් ද්‍රෝහි වී නැත. මගේ සියලු හැඟීම් අම්මාගේත්, තාත්තාගෙත් දහසකුත් බලාපොරොත්තු වෙනුවෙන් දිය කර හැරියෙමි. ඒ නිසාම මට මව්පියන්ගේ සෙනෙහසේ අඩුව දැඩි සේ දැනෙයි.

තාත්තා දිනක් රා බී ගෙදර ආවේය. ඔහු මරණයට තීන්දු කරන ලද වැරදිකරුවකු අන්තිම මොහොතේ හැසිරෙන ලෙස හැසිරෙන්නේ යැයි මට සිතුණි. මේ තාත්තා බීගෙන ගෙදර ආ පළමු වන දිනය යි. ඔහුගේ මානසික පසුබෑම තුළින් ඔහුගේ ම ජීවිතය විනාශ වෙමින් තිබුණේ ගඟදියෙන් යට වී විනාශ වන කටුමැටි පැලක් ලෙසටය.

ගේ ඇතුළේ නිදාගත් තාත්තා ටිකෙන් ටික ඉස්තෝප්පුවේ නිදන්නට පටන් ගත්තේය. ඔහු එවැනි දිනක කතා කරන්නේ "දොර වහගනිං" යන විධානය දීමට පමණි. මට තාත්තාව ගෙයින් පිටට දමා දොර වසාගෙන නිදාගැනීම කළ නොහැකි වුවත් ඔහු අපේක්ෂා කළේ ඒ දෙයයි. තාත්තා මත්පැන්වලට ඇබ්බැහි වන්නට යන්නේ ය යන සැකය මා තුළ ආත්මානුකම්පාවක් ඇති කළේය. මා තනි වී ඇතැයි යන හැඟීම මගේ සිත කකාරවන්නට විය. තාත්තා බොන්නේ ඇයි දැයි ඇසීමට මා තුළ ඇති වුවමනාව ඔහුගේ කෝපාවිෂ්ට වූ වචන නැමැති ආයුධ පෙන්නා විනාශ කර දමා තිබුණි.

sinhalaebooks.com

මම දිනක් තාත්තාට කහට කෝප්පයක් රැගෙන ඉස්තෝප්පුවට ආවෙමි. මම ඔහුගේ අතට කහට කෝප්පය දුන්නෙමි. ඔහු මා දෙස බැලුවේය; වහාම යළි අහක බැලුවේය.

"ගලවපං ඔය අම්මගෙ චීත්ත රෙද්ද. තොට පිස්සු වැටිලද ඕක ඇඳගත්තේ? දුවපිය මගේ දෑහැට නොපෙනී." තාත්තා මහ හයියෙන් කෑගැසුවේය. මා තුළ ඇති වූ බිය කිරිදරුවකු මා ඉදිරිපිට දී ම වධකයකු විසින් කෑලි කෑලිවලට කපනවා දැකීමෙන් ඇති වන බියට වැඩිවිය. මිනිහකුගේ කනකට යකඩ කූරක් තබා, කුළුගෙඩියකින් ගසා, ඒ කූර අනික් කනින් එළියටගෙන දෙකෙළවර කඹයක් ගැටගසා ලේ පෙරි පෙරී කෑගසද්දී තමා වටේ බඹරයක් මෙන් කරකවමින් හිනැහෙන, අත්පාවල ලොම් පිරුණු, දිග දත් ඇති, කට දෙකොනින් සෙම පෙරෙන යක්ෂයකු දැකීමෙන් ඇති වන බියට වැඩි විය.

මගේ අත වූ කහට කෝප්පය ගිලිහුණා නොව, විසි වුණේය. එය ඉස්තෝප්පු කණ්ඩියේ වැදී පෙරළී ගොස් තාත්තාගේ ඇඟේ වැදී නතර විය. මම දෑතින් මුහුණ වසාගෙන කාමරයට දිවුවෙමි. මට ගේ තුළ සිටීමට මහත් බියක් දැනුණි. පල් හොරුන් විසින් ගේ වට කර පහර දෙන්නට සූදානම් වී ඇතැයි සිතුණි. මහා රූස්ස ගසක් වහලය මතට පහත් වෙමින් ඇතැයි සිතුණි. කැරපොත්තන්, කුරුමිණියන්, පණුවන් මගේ කාමරයේ හැම තැනම අහුමලුවල ඇතැයි සිතුණි.

මම චීත්තපට ගලවා දමා, ඇඳට වැටී, කොට්ටයේ මුහුණ ගසාගෙන හැඬුවෙමි. තාත්තා යක් වෙස් මුහුණක් දමාගෙන අල්මාරිය පිටුපසට වී සිටින්නා සේ දැනුණි.

sinhalaebooks.com

ඔහු චීත්ත රෙද්ද කීතු කීතුවලට ඉරා ලාම්පුතෙල් දමා ගිනි  තියන්නට හදන්නේ යැයි සතුණි. ඒ ගින්නෙන් මුළු වහලය ම ගිනි ගෙන, පරාල යටලී මගේ ඇඟ මත කඩාගෙන වැටෙන්නාක් මෙන් දැනුණි. මම මුහුණ තව තව කොට්ටයට තද කරගතිමි.

මා අවදි වූයේ මැදියම් රැයේ ඉස්තෝප්පුව දෙසින් ඇසුණු ඉකිබිඳුම් හඬ නිසාය. මා ඊට කන් දුන් විට තේරුනේ තාත්තා හඬන බවය. තාත්තාට පිස්සු හැදී ඇතැයි යන හැඟීම මගේ මනස තුළ හොල්මන් කරමින් තිබුණි. තාත්තා අම්මාට වෛර කරන බවත්, ඒ වෛරය මා පිටින් මුදාහරින බවත් මම සිතුවෙමි.

ඊට පසු දිනෙන් දින ඔහුගේ මත්පැන් පානය වැඩි වන්නට විය. ගඳින් රා බී ඇතැයි අනුමාන කළ හැකි ලෙස ගෙදර ආ තාත්තා පසුව දුර සිට ම රා බී ඇතැයි සිතාගත හැකි ලෙස දෙපා වාරු නැතිව ආවේය. ඔහු දෙස බලන හැම විටක ම ඔහු ගැන ඇති වන අනුකම්පාවට වඩා මට මා ගැනම අනුකම්පාවක් ඇති විය. ඒදණ්ඩ මැද දී අත්වැල කඩාවැටීමෙන් අසරණ වූවකු ලෙස මා ද අසරණ වී ඇත.

වරක් තාත්තා වමනය කරනු දැක ඉවසා සිටීමට නොහැකි තැන මම තාත්තාගේ ඔළුවට පොල්තෙල් දමා පිරිමැද්දෙමි. ඔහු දෑස් ඇර මා දෙස බැලුවේය. ඒ බැල්ම තුළ තිබූ ගැඹුරු බව හා ඒ තුළ වූ අසරණ බව, විමතිය, වේදනාව, තාත්තා මට අනුකම්පා කරතියි යන හැඟීම මා තුළ පහළ කළේය. තාත්තා මගේ අත තරයේ අල්ලා ගත්තේය; දිය පහරක ගසාගෙන යන මිනිසෙකු හදිසියේ අතට හසු වූ ගල්පරයක් හැකි වෙර යොදා බදාගන්නාක් මෙන් දැතින්ම මගේ අත බදාගත්තේය. කපුරුපෙති නළල

sinhalaebooks.com

මත තබා පුච්චන්නාක් මෙන් වේදනා දුන් මගේ හිස මත අයිස් වතුර හලන්නාක් වැනි විය. එහෙත් ඒ මොහොතක් පමණි. දෑස් මහත් කොට මා දෙස බැලූ තාත්තා "පලයං පලයං" යැයි යටිගිරියෙන් කෑගැසුවේය. මගේ අතේ වූ තෙල් බෝතලය විසිවී ගොස් බිත්ති කණ්ඩියේ හැපී වීදුරු කටු සීසී කඩ විසිරුණේය.

මා ගෙට දිවුවා ද නැත හොත් මාව කවුරු හරි ඇදගෙන දිවුවා දැයි මතක නැත. ලෝකයේ ම ඇති කපුරු මගේ නළල මත පිච්චෙන්නේ යැයි සිතුණි. මම ඇඳ විට්ටමේ ඔළුව ගසාගතිමි.

තාත්තා මිනී ඔතන ලද රෙද්දක් පෙරවාගෙන, කන් කුණු වූ, පණුවන් ගහන ලද බල්ලකු තුරුලු කරගෙන මා ඉදිරිපිටට එනු සිහිනෙන්ද මම දුටුවෙමි.

මා අවදි වන විට හොඳට ම එළිය වැටී තිබුණි. මම ඉක්මන් කර නැගිට කුස්සියට ගියෙමි. කේතලය ළිප තබා සාලයට ආවත් තාත්තා පෙනෙන්නට සිටියේ නැත. තාත්තා වැඩට ගොස් ඇතැයි සිතුවෙමි. එහෙත් පෙර දා වූ සිදුවීම් සිහි වූ විට තාත්තා මා අතහැර ගියේය යන සැකයද ඇති විය. එය වැඩි වූයේ තාත්තා වැඩට අඳින ඇඳුම් රාක්කයේ තිබුණ නිසාය.

මා අම්මාගේ කාමරයට ගියේ තාත්තා එහි නිදි දැ යි බැලීමටය. මා කාමරයට ඇතුළු වන විටම පයට වීදුරු කටු පෑගුණි. පෙරදා රැයේ මා අතින් බිඳුණු බෝතලේ කටු ද? නැත. එය බිඳුණේ ඉස්තෝප්පුවේය. මම වටපිට බැලුවෙමි. ඉරන ලද කොළ කෑලි වගයකුත් මගේ ඇස ගැටුණි. මම දුව ගොස් ඒ කොළ කෑලි අහුලාගතිමි. ඒ මාත් අම්මාත් එකට සිට ගත් ඡායාරූපයක් බව මට මතක් විය.

sinhalaebooks.com

එය අම්මා විශාල කොට රාමු කර එවා තිබූ පින්තූරයයි. තාත්තා එය පොළොවේ ගසා විනාශ කර පින්තූරය ඉරා දමා ඇත. මෙය තාත්තා විසින් මාත් අම්මාත් දෙදෙනාම අතහැර දමූ බව කියන සංකේතයක්ද?

මාගේ හිස භ්‍රමණය වන්නට විය. තාත්තා අප අතහැර දමා ගොස් ඇත, යන සිතුවිල්ල මගේ හිස පුපුරු ගස්සමින් ඒ මේ අත ඇදෙයි. ගෙට ගිනි ගෙන යටලී පරාල රීප්පපටි මගේ හිස මත කඩා වැටෙමින් ඇතැයි සිතුණි. මගේ කය මෙහි දමා සිත පියඹා යන්නට සැරසෙන්නාක් මෙන් දැනුණි. මගේ ශරීරය විනාශ කළ යුතු යැයි මම සිතුවෙමි. මා ශරීරයෙන් වෙන් වී ඇතැයි සිතුණි. ඒ ශරීරයට ගිනි තබා විනාශ කොට පලායන්නට ඇත් නම් යැයි සිතුවෙමි. වීදුරු කටුවක් ගෙන එය ඇඟ මත ඇතුල්ලුවෙමි. ඉන් ගලන ලේ පොළොව මත වැටිණි. ශරීරයෙන් වෙන් වී සිටින මට වේදනාවක් නොදැනුණි. තව කීප පළකම වීදුරු කටුව ඇතුල්ලුවෙමි. රතු ලේවලින් ශරීරය තෙත්වනු දැක සතුටු වුණෙමි. මගේ ආත්මය ශරීරයෙන් වෙන් වී ඈතට යන්නේ යැයි සිතුණි. ඒ ශරීරය විනාශ කරන්නට මගේ සිතට වූ ශක්තිය හීන වී ගියේය. සියලු දේ උඩුයටිකුරු වී බොඳ වී ගියේය.

මා සිහිය ලබන විට මා ළඟ ආච්චි අම්මා සිටියාය. මගේ අත රෙදි පටියකින් ඔතා තිබුණි. මට ඉන් වේදනා දැනුණි. ආච්චි අම්මා මගේ ඇඳ ළඟට වී මගේ මුහුණ බලා සිටියාය. දියේ ගසාගෙන යන මිනිසකු, අතට අහුවන ඕනෑම දෙයක් බදාගන්නා ලෙස මම ආච්චි අම්මාගේ අඩපණ වූ අත්දඬු බදාගතිමි. ඇගේ අත්දඬු තෙත් වන තුරු මම මුහුණ ඔබාගෙන හැඬුවෙමි.

sinhalaebooks.com

ආච්චි අම්මා සමඟ මා මෙහි පැමිණියා නොව, ඈ මා රැගෙන ආවාය. මට තාත්තා පිළිබඳ බිය, පිළිකුල නැති කරගත නොහැකිය. ආච්චි අම්මා කියන්නේ අම්මා පැමිණි පසු ඔක්කොම හරියන බවයි. මම අම්මා එන තුරු බලා සිටිමි.

sinhalaebooks.com

# මා නොවුණු මම

බැදී කර වී ගිය හාල්මැස්සකු ඇඟිලිතුඩුවලින් අල්ලාගෙන, මම ඒ දෙස බලා සිටියෙමි. මේ හාල්මැස්සා දෙස බලා සිටින මට මතක් වන්නේ උසාවි භූමිය තුළ හඬා වැටුණු අර තරුණයාය. ඔහු මගේ තාර්කික ප්‍රලාපයන් අතර හිර වී අසරණ වී ගියේ මේ හාල්මැස්සා පරිදි නොවේ ද? ඌ මගේ බත්පතට එන්නට පළමුව දියමත කොතරම් අපූරුවට පීනා යන්ට ඇද්ද? උගේ රැළ සමඟ කොතරම් කෙළිදෙළෙන් ගත කරන්ට ඇද්ද? ඌ අපේ ආහාරය පිණිස ජීවිතය පූජා කර ඇත. ඌ එය ඕනෑකමින් කළ එකක්ද? නැත. ඌ මැරුවා මිස මැරුණේ නැත.

අද මට මේවා සිතෙන්නේ ඇයි? හැමදාම හාල්මැස්සන් බැදුම සමඟ බත් කෑ මට ඌ ගැන මෙසේ සිතෙන්නේ ඇයි? හාල්මැස්සාත්, අර තරුණයාත් අතර ඇති වෙනස කුමක්ද? ඔහු පරාජය නමැති මරණය වැලඳ ගත්තේ මගේ වරදින් නො වේ ද? එබැවින් ම ඔහු පරාජයට පත් කිරීමෙන් මා ලද ජයග්‍රහණය කුමක් ද? ඔහු පරාජය වූයේ සාධාරණ නීතිය හමුවේ ද? නීතිය කුමක් වුවත් එය ක්‍රියාත්මක වන්නේ අපගේ තර්ක විතර්කවල සාර්ථකත්වය මත නොවේ ද? මගේ තර්ක කිරීමේ හැකියාව මත මෙම තීන්දුව ඔහුට ලැබුණායි කීම වැරදි ද? ඔහු වෙනුවෙන් මා පෙනී සිටියා නම් මේ තර්ක විතර්ක ඔහුගේ ජයග්‍රහණය වෙනුවෙන් සංවිධානය නොවන්නට තිබුණිද? ඔහු වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරියට මේ නඩුව දිනා

sinhalaebooks.com

දීමේ අවස්ථාව ඕනෑ තරම් තිබුණි. ඇගේ තර්ක මා බිඳ හෙළුවත්, ඇයට මගේ තර්ක බිඳ හෙළීමට බැරිවීමත්, නීති රීති නඩු වාර්තා ඉදිරිපත් කොට ඒ ජයග්‍රහණය ලබා දීමට උනන්දු නො වීමත් නිසා ඈ පරාජය වූවා නොවේ ද? මා ඒ පාර්ශ්වයේ සිටියා නම් මේ තුරුම්පු කොතරම් යසට පාවිච්චි කොට, ඔහු ජයග්‍රහණය කරවනවා ද?

නඩුවල ස්වභාවය එයයි. යථාර්ථය වසාගෙන තර්කය නැඟී සිටිනවා. සැබවින්ම මගේ වෘත්තියේ දී වැදගත් වන්නේ සේවා දායකයායි. ඔහුගේ හෝ ඇයගේ ඉල්ලීම අධිකරණයෙන් ලබා දීම මත මගේ පැවැත්ම තහවුරු වෙයි. යථාර්ථයට එරෙහිව තර්ක කිරීමට සිදු වෙයි. එහි දී එම ජයග්‍රහණයේ තර්ක ගොනු කරනවා මිස යථාර්ථය ගැන සිතෙන්නේ නැත.

නමුත් අද නඩුවත් සමඟ මගේ ජීවිතයේ කඩා වැටීමක් සිදු වූයේ කෙසේ ද? මගේ තාර්කික බුද්ධිය සමඟ හැඟීම් නමැති ධර්මතාව සටන් වදින්නට සැරසෙන්නේ ඇයි? මගේ ජීවිතය ආපස්සට ගමන් කරන්නට උත්සාහ ගන්නේ ඇයි? මා තුළ මා ගැන ම ඇත්තේ කලකිරීමක් ද? අනුකම්පාවක් ද? නැත හොත් මට මාවම එපා වීමක් ද? එසේ වන්නට හේතුව කුමක් ද? මා දිනූ නඩුව මාව පරාජය කිරීමට සමත් වූයේ කෙසේ ද?

බුද්ධිය මඟින් යටපත් කරගෙන සිටි හැඟීම් බුද්ධිය පරාජය කරමින් නැඟී සිටින්නට උත්සාහ කරන්නේ කෙසේ ද? මේ කලකිරීම් සහිත හැඟීම් මා තුළ උපදින්නේ මගේ මුළු ජීවිතය ම අධිකරණයක් කර ගත් නිසා ද? සැබැවින්ම මා මගේ ජීවිතයේ ගත් හැම තීරණයක්ම ගත්තේ බුද්ධිය විසින් මෙහෙයවන ලද තර්කයට අනුකූලව නොවේ ද?

sinhalaebooks.com

නැත. හැඟීම් සමඟ මගේ බුද්ධිය කළ සටනේ දී බුද්ධිය පරාජය වූවා නම් මා අද නීතිඥවරියක නොවන්නට තිබුණි. එසේ නම් ඒ ජීවන ජයග්‍රහණය මා වෙත ළඟා කර දුන් බුද්ධියට නිගරු කරන්නේ කෙසේ ද? එහෙත් අද උසාවිය තුළ සිදු වූ සියලු සිදුවීම් මගේ මනස තුළ නැවත දෝංකාර දීමට පටන්ගෙන ඇත.

"ස්වාමීනි, මේ අහිංසකයා ජීවිතයේ හැම කැප වීමක්ම ඇය වෙනුවෙන් කළා; අධ්‍යාපනය, ආත්ම ගෞරවය, දෙමවුපියන් ගුරුවරුන් ආදි සියලු දේ මෑ නිසා අත් හැර දැමුවා. ආදරය නමැති නෞකාවට කපටිකමේ සුක්කානම වෙනුවට මොහු සවි කළා අවංකකමේ හබල; අවිශ්වාසයේ ඇන්ජිම වෙනුවට මොහු සවි කළා විශ්වාසයේ රුවල නමුත් ඇය ඒ සියල්ල චණ්ඩ මාරුතයක් වී විනාශ කර දැමුවා."

"ස්වාමීනි, මගේ හිතවත් උගත් නීතිඥවරිය මේ ගරු අධිකරණය හැඟීම්බර කතාවලින් අසරණ කිරීමට උත්සාහ දරනවා. නීතිය හමුවේ හඟීම්බර කතාවලට වඩා වැදගත්, තර්කානුකූල අදහසුයි. මැය මොහුට ආදරය කළේ නෑ ස්වාමීනි; කළේ අනුකම්පාවක් විතරයි. මැගේ ලියුම් පරීක්ෂා කර බැලීමේ දී ඒ බව සනාථ වෙනවා. අනාගත බලාපොරොත්තු, මවුපියන්ගේ බලාපොරොත්තු හමුවේ බුද්ධිමත් තරුණියකට ආදරය කියන හැඟීම් බර ත්ත්වයත් එක්ක එකතු වෙන්න බෑ......."

"ස්වාමිනි; මා මේ ගරු අධිකරණයට විත්තිකාරිය විසින් පැමිණිලිකරුට ලියන ලද ලිපි විශාල ගණනක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ එක ලිපියකින් වත් ඔප්පු වෙන්නේ නැහැ මැය ඔහුට දැක්වූයේ ආදරයක් නො වේ

sinhalaebooks.com

කියල. අනික් කරුණ ස්වාමීනි, මැගේ මවුපියන් නිසා ඔහු අමතක කරා යන්න ඉතා බොළඳ කතාවක්. මැය බුද්ධිමත් නම් ඒ බව සිතන්න තිබුණේ කලින්. ආදරය ක්‍රීඩාවක් කරගෙන මැය ඔහු ව පරාජය කළා. නීතිය කියන දේ ක්‍රියාත්මක විය යුත්තේ මනුෂ්‍යයන් වෙනුවෙන් බව මගේ බුද්ධමත් නීතිඥවරිය අමතක කළා. ඒ මනුෂ්‍යයන් දෙස මානුෂික මුහුණුවරකින් බැලිමේ හැකියාව නීතියට නැති නම්, ඒ නීතිය වල්වැදුණු නීතියක් වෙනවා. මේක මනුෂ්‍ය සිතේ පහළ වන උත්තරීතර හැඟීමක් එක්ක සෙල්ලම් කළ කාන්තාවකට විරුද්ධව පැවරූ නඩුවක් ස්වාමීනි. අපි අධිකරණයෙන් ඉල්ලා සිටින්නේ අහිංසක සිතක විවාහය පිළිබඳ බලාපොරොත්තු ඇති කර ඒ බලාපොරොත්තු නිමේෂයකින් සිඳ බිඳ දමා, මේ අහිංසකයාගේ ජීවිතය අඳුරු ආගාධයකට ඇද දැමීම වෙනුවෙන් සාධාරණ තීන්දුවක්."

"ස්වාමීනි, මා හිතන්නේ නෑ අධිකරණයකට පුළුවන් කියල අකමැති සිත් දෙකක් එකතු කරන්න. ඔහු කෙසේ වෙතත්, මැය කැමති නැහැ මොහු සමඟ එකතු වන්න. මා මගේ මිත්‍ර උගත් නීතිඥවරියගෙන් අහන්න කැමතියි. මොහුගේ ආදරය එතරම් උත්තරීතර එකක් නම් ඉල්ලීම් ඉල්ලන්නේ ඇයි කියලා. ස්වාමීනි, මේක උත්තරීතර ආදරයක් නෙමෙයි. මොහු මේ ආදරය වෙළෙඳාමක් කරගෙන සිටින්නේ. මැයට එතරම්ම ආදරය කළා නම් මෙවැනි අධිකරණයක් හමුවට කැඳවා ඇයගේ ආත්ම ගෞරවයට හානි කිරීමට උත්සාහ දරාවි ද? මා මේ ගරු අධිකරණයට යෝජනා කරනවා මොහු මේ සියල්ල කළේ මැයගෙන් පළි ගැනීමට සිතාගෙන බව....."

sinhalaebooks.com

මාගේ තර්ක හමුවේ තීන්දුව මාගේ සේවා දායකයාට වාසිය පිණිස ලැබුණද මගේ  සිත මේ නඩුවෙන් පසු තෝන්තුවා වී ඇත්තේ ඇයි? මගේ ජීවිත කාලයේ ගෙවී ගිය එක් කාල පරිච්ඡේදයක් මතකයට පැමිණියේ මේ නඩුව සමඟ නොවේ ද? මට කිසි විට සිහිපත් නොවූ, වැදගත් යයි ගණන් නොගත් මගේ ජීවිත කතාවේ යටගියාව මෙසේ මගේ සිත තුළ හොල්මන් කරන්නට පටන් ගත්තේ ඇයි? මා අධිකරණයේ දී මෙන්ම පිට දී ද නිතරම හුරු වූයේ, මගේ ජයග්‍රහණය වෙනුවෙන් තර්ක කිරීමටයි. එය කුඩා කාලයේ සිට මා තුළ තිබූ විශේෂතාවකි. ඒ නිසාම මට නීතිඥවරියක වීමට හැකි වූ යේ යැයි දනුදු මම විශ්වාස කරමි. මගේ මෙම තර්ක කිරීම මෙහෙයවූයේ බුද්ධියද? නැති නම් ආත්මාර්ථකාමිත්වයද? යන්න පිළිබඳ මට තීන්දුවක් අවශ්‍ය වී ඇත.

අසේල.... ඔහු මගේ ජීවිතයේ එක් කාල වකවානුවක සෙවණැල්ල වී සිටි සැටි මට මතකය. ඔහුට මා ආදරය කළාට වඩා ඔහු මට ආදරය කළේය. කෙසේ හෝ ඒ සෙවණැල්ල විනාශ කර දමන්නට මා සිත් නැත්තියක ලෙස ක්‍රියාත්මක වූ අයුරු සිහියට එයි. එය මා කළේ සිත් නොමැතිකම නිසා යැයි තීන්දු කරන්ට අවශ්‍ය සාධක මා තුළ මතු වන්නේ අදය. එදා එය තර්කානුකූලව බුද්ධිමත් කෙනකුට ගත හැකි හොඳ ම තීරණයක් ලෙස සිතුවෙමි. මට අද අසේල මතකයට එන්නේ අර නඩුවේ පැමිණිලිකරුගේ මුහුණින් අසේලගේ මුහුණ පෙනුණු නිසා යැයි මම සිතමි. ඔහු අධිකරණ භූමියේ දී හඬා වැටුණේ ආදරය වෙනුවෙනි. එහෙත් එයින් ද ඔහුට සහනයක් නොලැබුණි. ඔහු සැබැවින්ම ඇයට ආදරය කළා නම් ඈ අධිකරණයට ගෙන නොඑන්නේ යැයි මා

sinhalaebooks.com

ගොඩ නැගූ තර්කය සත්‍ය නම් අසේල මට ආදරය කර ඇත්තේ සැබෑවටම නොවේ ද? ඔහු කෙදිනක වත් මගේ ආත්ම ගෞරවයට හානි නොකළේය.

අසේලත්; මාත් අතර වූ බැඳීම කෙළවර වූයේ මාගේ වාසිටි ගමනින් පසුවයි. අසේලත් මාත් අතර ඇති පරතරය පිළිබඳ තර්ක ගොඩ නැගීමට මා උත්සාහ කළේ එතැන් සිටයි. ඔහුගේ තත්ත්වය මාගේ තත්ත්වයට නොගැළපෙතැයි යන තර්කය බුද්ධිය විසින් මා තුළ ගොඩ නැගුවක් ද? ආත්මාර්ථකාමිත්වය විසින් ගොඩ නැගුවක් ද යන්න පිළිබඳ ව ගැටලුව මතු වන්නේ අදය. එදා නම් සැබෑ ලෙස අසේල මගේ ළඟ කදෝ පැණියකු ලෙස පෙනෙන්නට වූයේ ඇයිද යන්න පිළිබඳව මට ගැටලුවක් නො තිබුණි.

මා හැගීම් සමඟ එකතු වී කටයුතු කළ කාලයක් තිබුණි. එය ඔප්පු වන්නේ මා ඔහුට ලියූ ලිපිවලින්ය. ඔහු අතහැර නොයන බව කියා කොතරම් ලිපි ලියන්න ඇතිද? කොටින් ම අපට ලැබෙන දරුවන්ට කල් තියා නම් පවා මා යෝජනා කළ අයුරු අමතක කළ නොහැක. නමුත් අධ්‍යාපනික දැනුම, සමාජ අවබෝධය තුළින් මා ලත් පන්නරය හමුවේ ඔහුට සමු දීම මට ඒ තරම් ගැටලුවක් නොවීය. ඔහුට මා සමු දුන්නේ හේතුවක් ඇතිව නොවේ යයි ඔහු සිතන්නට ඇත. ඇත්තටම ඔහුගේ ආදරය එදා මට ගැටලුවක් වූයේ නැත. ඔහු පණ දෙවැනි කොට මට ආදරය කළ බව විශ්වාසය. නමුත් අප අතර ගැළපීමක් නැතැයි තීන්දු කොට ඔහුට සමු දුන්නෙමි. ඒ නොගැළපීම අප අතර වූයේ සමාජ තත්ත්වය මත පමණකි. නමුත් එය එදා මම ප්‍රධාන ම මිනුම් දණ්ඩක් ලෙස භාවිත කළෙමි. ඒ මිනුම් දණ්ඩට අනුව අසේලත් මාත් අතර විවාහයක්

sinhalaebooks.com

කෙසේවත් සිදු වීමට නොහැකිය. මගේ බුද්ධිය විසින් ගොඩ නඟා දුන් තර්කයට මම එදා ප්‍රමුඛ තැන දුන්නෙමි. අසේල මගේ දෙපා බදාගෙන හැඬූ මොහොතේ ඔහු පිළිබඳව මා තුළ ඇති වූයේ අනුකම්පාවක් පමණි. ඔහුගෙන් ඈත් වීම කෙරෙහි මානුෂික හේතූන් නොතිබුණද, තාර්කික හේතූන් තිබූ නිසා ඒ වෙන්වීම මට එදා දැනුණේ සැනසිල්ලක් ලෙසය. මා වාසිටිය තුළ සිටි කාලය තුළ ඔහුගේ ජීවිතය කෙමෙන් කෙමෙන් විනාශ වී යන බව ආරංචි වුවත්, මට ඒ වෙනුවෙන් කළ හැකි යමක් වූවත් එසේ කිරීමට මම ඉදිරිපත් නොවීමි. මගේ උගත්කම බුද්ධිය හමුවේ ඔහු තව තවත් ඈතට ගියේය. ඔහු මහා බොළඳ, හැඟීම්බර නූගතෙකු තීන්දු කිරීමට මගේ තර්කඥානය කිසවිටක පසුබට නොවුණි. මානුෂික හැඟීම් යන වචනයේ අර්ථය මා විග්‍රහ කළේ නූගත් සමාජ ලක්ෂණයක් ලෙසය.

අද මගේ සිත අතීතය තුළින් වර්තමානයට ද, එයින් යළි අතීතයට ද ගමන් කරයි. මේ සියල්ල මගේ මතකයට අද එන්නේ ඇයි? බුද්ධිය විසින් මෙහෙයවන තර්කය තවදුරටත් ජීවිත මිනුම් දණ්ඩක් යැයි නොපිළිග න්නා නිසා ද? එසේ නම් මා මේ වෘත්තියෙන් ද ඈත් විය යුතුය. එසේ නම් සියල්ල හැඟීම් මත සිදු වන්නට ඉඩ හැරිය යුතු ද? බුද්ධියට වඩා හැඟීමට තැන දිය යුතුද? එය එසේ නම් මා අද සිටින්නේ මෙතන ද? නැත. ඒ බුද්ධිය විසින් මෙහෙයවූ තර්කය මා මේ තත්ත්වයට ගෙනත් ඇත. හැඟීම් විසින් මේ තර්කය මෙහෙයවූවා නම් අසේලත් මාත් විවාහ වී පවුල් ජීවිතයක් පමණක් ගත කරමින් ජීවත් වන්නට තිබුණි. විවාහය වැනි ජීවිත මංසන්ධියක දී එය තීන්දු කිරීමේ අයිතිය පවරා දිය යුත්තේ බුද්ධිය විසින්

sinhalaebooks.com

මෙහෙයවන තර්කයකට ද යන්න ගැටලුවක් වී ඇත්තේ අදය. මට එදා එය ගැටලුවක් නොවූ නිසා ධනවත් තරුණයකු සමඟ විවාහ වුණෙමි.

නමුත් ඒ නිසා ම මගේ හිත අද හඬා වැටෙන්න උත්සාහ දරන්නේ ඇයි? අසේලට මගෙන් අසාධාරණයක් වූ නිසා ද? නැති නම් හැඟීම් මගින් මෙහෙයවන ලද තර්කය මත ගොඩ නැගුණු විවාහ සබඳතාවක් මගේ යටි සිත පතන නිසා ද?

එය මට විග්‍රහ කිරීමට නොහැක. එහෙත් අසේලගේ ආදරයේ සුවඳ මගේ ළඟ දැවටෙන්නට පටන් ගෙන ඇත.

එදා අසේල මගෙන් ආදරය ඉල්ලා හඬා වැටෙද්දී ඔහුට මා එය නුදුන්නේ ඇයි? මගේ බුද්ධිය, තර්ක ආදිය එදා ඇති කළේ යහපත් අනාගතයක බලාපොරොත්තුය. ඒ බලාපොරොත්තු හමුවේ අසේලට තැනක් තිබුණේ නැත. ඔහු අමතක කිරීම හැර මගේ සුරක්ෂිතතාව කෙරෙහි බලපෑ හැකි කිසිදු ශක්තියක් ඔහු තුළ තිබුණේ නැත. නමුත් ඔහු අමතක කිරීමෙන් පසු ඒ ශක්තිය සහිත ආදරයක් මා බුද්ධියෙන් ඉල්ලා නො සිටියේ ද? එයින් පසු මා විවාහ වූයේ ද මිනිසකු සමඟය. විවාහයට හැඟීම් අදාළ නොවේ නම් මට රොබෝ කෙනකු සමඟ වුව ද විවාහ වීමේ හැකියාව තිබිය යුතුය. ආදරය හැඟීමක් නම් ඒ හැඟීම තිබිය යුත්තේ හැඟීම්බර මිනිසුන් තුළය. මා හැඟීම්බර ගැහැනියක නොවුණි නම් විවාහ වූයේ ඇයි? මේ මානුෂික හැඟීම හා සසඳන කල අසේලත් ඔහුත් අතර පරතරය කෙබඳු එකක් ද? ඔවුන් දෙදෙනා ළඟින්ම මට අවශ්‍ය වූයේ ආදරය නොවේ ද?

sinhalaebooks.com

අසේලගෙන් මා ඒ දෙය ලබා නො ගත්තේ ඇයි? මා සිත් පිත් නැති ගැහැනියක නිසා ද? ජීවිතයකට ලැබිය යුතු සියලු දේ එක තැනකින් අපේක්ෂා කිරීමේ පුරුද්ද මා තුළ ඇති කළේ බුද්ධිය විසින් මෙහෙයවූ තර්කයද? නැති නම් ආත්මාර්ථකාමිත්වයද?

මට දැන් තර්ක කිරීමේ හැකියාවක් නැත. මගේ හිත කිණිහිරයක් මත තැළෙන රත් වූ යකඩයක් වී ඇත. මා අද පෙනී සිටි නඩුව නො වන්නට මේ කිසි හැඟීමක් මාගේ තාර්කික බුද්ධයට අභියෝග නො කරන්නට තිබුණි. මේ සියල්ල ම තුළින් මෙතෙක් මා එළියට නොගත්, හිත පතුලේ සඟවා තබා තිබූ මානුෂික ධර්මතා හෙවත් හැඟීම් එළියට එන්නට පටන්ගෙන ඇත. එය බුද්ධිය සමඟ ප්‍රසිද්ධියේ සටන් කරන්ට සූදානම් වෙයි. මෙයින් කවුරු දිනුවද අද දවස තුළ කලකිරීම හැර වෙන කිසිවක් මා තුළ ඉතුරු නො වනු ඇත.

sinhalaebooks.com

# පහන් කූඩුව

සුදු වැලි මළුවට තදින් හිරු රැස් වැටීම නිසා පුංචි තිරිවානා ගල් කැට මැණික් කැට සේ දිස්නය දෙයි. දෑතින් හිස් මුවා කරගෙන එහෙ මෙහෙ දුවන ළමයින් වැලි මළුවේ දෙපා තබන්නේ යන්තමටය. රත් වූ වැලි මත ඇවිදීමට නොහැකි වූ මලිති ඇඟිලි තුඩුවලින් පමණක් එහෙ මෙහෙ ඇවිද්දාය. මලිතිගේ මුහුණ මත පිපී තිබූ දහඩිය බින්දු මත පතිත වූ හිරු රැස් නිසා ඒවා ද පුංචි තිරිවානා කැට මෙන් දිස්නය දෙයි. මලිති දෑතින්ම බට පතුරු මිටියක් ඔසවාගෙන අරලිය ගහ ළඟට දිවුවාය. අරලිය ගහ මුල භාවනාවේ යෙදී සිටි උපාසක පිරිස මලිති විසින් බිම හෙළන ලද බට පතුරු මිටියේ ශබ්දයෙන් තිගැස්සී ගිය බව මලිති නොදැක්කාය. ආවාස ගෙයි සිට පිය මනින සුජාත පොඩි හාමුදුරුවන්ගේ එක් අතක ඇති පිහියත් අනෙක් අතින් ගුළි කරගෙන එන නූල් ගුළියත් මලිති දුරදීම දුටුවාය. සුජාත පොඩි හාමුදුරුවන් මළුවට එනතුරු ඇය අරලිය ගහ මුල රැඳී සිටියාය.

අරලිය ගහ මුලට පැමිණි පොඩි හාමුදුරුවෝ බටපතුරු එකින් එක පිහියෙන් කපා ශුද්ධ කරන්ට පටන් ගත්හ. මේ ශබ්දයෙන් පිබිදුණු උපාසක පිරිස ඒ දෙස බලා සිටියෝය. ශුද්ධ කර ගත් බට පතුරු වලින් කිහිපයක් මලිති අතට දුන් පොඩි හාමුදුරුවෝ පිහිය තවත් ළමයෙක් අතට දී බට පතුරු ශුද්ධ කර දෙන ලෙස කීහ. පොඩි හාමුදුරුවන්ගේ වචනය පිළිගත් ළමයි ටික බට පතුරු කපා ශුද්ධ කරන්ට

sinhalaebooks.com

පටන් ගත්හ. මලිතිගේ අතේ තිබුණු බට පතුර අතට ගත් පොඩි හාමුදුරුවෝ උක්කුටිකයෙන් බිම ඉඳගත්හ. මලිති තවත් බට පතුරක් ගෙන පොඩි හාමුදුරුවන් අනුගමනය කරමින් එසේ ඉඳගත්තාය. බට පතුර කෙළින් අතට බිම සිටුවා බිම සිටුවූ කොන එහාට මෙහාට නොයන සේ දකුණු කකුලේ මාපටැඟිල්ලටත් මැදෑඟිල්ලටත් හිර කරගත් පොඩි හාමුදුරුවෝ එහි අනෙක් කොන මලිතිගේ පැත්තට නැමූහ. මලිතිද එසේ තද කරගත් බට පතුර පොඩි හාමුදුරුවන්ගේ පැත්තට නැමුවාය. ළා බට පතුරු දෙකේ අග එකිනෙකට සමීප වන තුරු බට පතුරු දෙක නැමූ පසු මලිති නූල් කැබැල්ලක් කටින් කඩා පොඩි හාමුදුරුවන්ගේ අතට දුන්නාය. පොඩි හාමුදුරුවෝ බට පතුරු දෙකේ අග එකතු වූ තැන නූල් පොටවල් කීපයකින් වට කර තද වන සේ ගැටයක් ගැසූහ. භාවනාවේ යෙදී සිටි උපාසක පිරිස අරලිය ගස් සෙවණින් නික්මී පහළ මළුවට ගමන් ගත්හ. මලිතිත් පොඩි හාමුදුරුවනුත් අනතුරුව මේ බටපතුරු දෙකේ අනෙක් දෙකෙළවර එකතු කර, ඒ පැත්තද ගැටගැසුවේ බට පතුරු දෙකින් නෙළුම් පෙත්තක් හැදෙන සේය. නෙළුම් පෙත්තේ හැඩය දෙස මලිති කිහිප වරක් ඔළුව හරව හරවා බැලුවේ එය සැදුණේ කෙසේ ද යි එකවර වටහාගැනීමට නොහැකි වූ නිසාය. පොඩි හාමුදුරුවන් පහළ මළුව දෙස බැලුවේ උපාසක පිරිසට ඒ නෙළුම් පෙත්ත පෙන්වීමට සිතාය. එහෙත් ඔවුන් ජේන මානයක නැත. ඔවුන් නෙළුම් පෙත්ත හැදීමට පෙර එක කොනක් ගැට ගසද්දී ම පහළ මළුවට ගිය එක ගැන පොඩි හාමුදුරුවන්ට දැනුණේ දුකකි.

අනෙක් ළමයින් ශුද්ධ කරගත් බට පතුරුවලින් නෙළුම් පෙති සාදා, ඒ සියලු නෙළුම් පෙති අරලිය ගහ

sinhalaebooks.com

මුලට ගෙනැවිත් පොඩි හාමුදුරුවන්ගේ අතට දුන් පසු පොඩි හාමුදුරුවෝ ඒ නෙළුම් පෙති සියල්ල ශක්තිමත් බට කැබැල්ලක් වටේට තබා මලිති සමඟ එකතු වී බඳින්නට පටන් ගත්හ. මලිති පොඩි පෙති මුදුනටත් ලොකු පෙති පහළටත් සිටින සේ තබා ඇතින් තද කර අල්ලාගෙන සිටියාය. පොඩි හාමුදුරුවෝ නූල් ගුළියෙන් දිග නූල් කැබැල්ලක් කපා එයින් සියලු නෙළුම් පෙති බට ගහට තද වන සේ වෙළුහ. සියලු ළමයි සුජාත පොඩි හාමුදුරුවන්ගේ දක්ෂකම දැක මවිතයෙන් බලා සිටින්නට වූහ. සුජාත පොඩි හාමුදුරුවෝ නෙළුම් මල අරලිය ගහ මුලට ගෙන ගොස් උඩ මළුවත් පහළ මළුවත් වෙන් වන සීමාවේ තැබූහ. පහළ මළුවේ අයින දිගට වැවී ඇති ලාඩප්පා ගස් යටට වී සිටින උපාසක පිරිසට මේ නෙළුම් මල නොපෙනෙන්නේ ඔවුන් දෑස් පියාගෙන භාවනා කරන නිසා ද? නැති නම් ඒ දෙස නොබලන නිසා දැ යි පොඩි හාමුදුරුවෝ කල්පනා කළහ. උසට වැවුණු ලාඩප්පා ගස්වල ඉදුණු කොළ සුළඟ දිගේ ඇදී උඩ මළුවේ සුදු වැලි මතට වැටෙන හැටි පොඩි හාමුදුරුවෝ බලා සිටියහ. මලිතිත් පොඩි හාමුදුරුවනුත් ඒ ලාඩප්පා කොළ එකතු කර කුණු ගොඩට ගෙන ගොස් දැමුවත් ඔවුන් ආපසු එන විට ඊට වඩා කොළ මළුව පුරා වැටී ඇත. ලාඩප්පා කොළ ඇහිලීම අතහැර දමූ පොඩි හාමුදුරුවෝ නෙළුම් මලේ කොළ ඇලවීමට යෝජනා කළහ.

සුදු පාට නෙළුම් පෙත්තක හැඩයට කපන ලද වෙසක් කොළය මලිති ගෙනැවිත් පොඩි හාමුදුරුවන්ගේ අතට දුන්නාය. තව ළමයෙක් ගෙන ආ පාප්ප ඇතිළියෙන් පාප්ප ටිකක් ඇඟිලිවලට ගත් මලිති බට පතුරේ ඒ පාප්ප ඉලුවාය. පොඩි හාමුදුරුවෝ ඒ පාප්ප ගෑ බට පතුරේ

sinhalaebooks.com

සුදු පාට කොළය ඇලවූහ. සියලු බට පතුරුවල මලිති පාප්ප ගෑ අතර, සුදු පාට පහන් කූඩු කොළ ඒ බට පතුරු වැසී යන පරිදි පොඩි හාමුදුරුවෝ ඇලවූහ. පාප්ප උලන මලිතිගේ දිග කොණ්ඩ කරල් දෙක ඇගේ ගෙල දෙපසින් මුහුණ පැත්තට වැටී ඒ මේ අත පැද්දෙද්දී ඈ එම කරල් දෙක අතින් ගෙන පිටුපසට දැමුවාය. ඇගේ අතේ තිබූ පාප්ප කොණ්ඩ කරල්වල තැවරී තිබෙන හැටි පොඩි හාමුදුරුවන්ට පෙනෙයි. කවුරුන්දෝ ළමයෙකු පහන් කූඩු කොළ කෑල්ලක් මලිතිගේ හිසේ ඇලෙව්වේ මලිතිට නොදැනෙන්නටය. ඒ දුටු පොඩි හාමුදුරුවන්ට සිනා ගියේය.

"ඇයි සාදු?"

පොඩි හාමුදුරුවෝ බිම බලාගෙන සිනහව නතර කර ගත්හ. එහෙත් අනෙක් අයගේ සිනහව නතර නොවූයෙන් ඇගේ මුහුණ අඳුරු වී ගියේය.

"මං ගෙදර යනවා. ඇයි කට්ටියම මට හිනා වෙන්නේ?" මලිති පොඩි හාමුදුරුවන්ගේ මුහුණ දෙස බලාගෙන නොමනාපයෙන් කූඩුව ළඟින් ඉවත් වීමට උත්සාහ කළාය. එසේ ඈ හැරෙන විට ඇගේ අත වැදී, කූඩුවේ පහන් කූඩු කොළයක් ඉරී ගියේය. සුජාත පොඩි හාමුදුරුවෝ එක් වරම හිස ඔසවා කූඩුව දෙසත් මලිතිගේ මුහුණ දෙසත් බැලූහ. මලිතිගේ දෑස් රතු වී තිබෙනු දුටු පොඩි හාමුදුරුවෝ කතා කළහ.

"අනේ මලිති, විහිළුවක්නේ කළේ... ඔයාගේ කොණ්ඩෙ සවරං කොළයක් අලවලා. "කෝ" යි මලිති හිස දෙපස බලමින් පොඩි හාමුදුරුවන්ගේ පැත්තට හිස පහත් කළාය. පොඩි හාමුදුරුවෝ ඇගේ කොණ්ඩ කරලක

sinhalaebooks.com

අලවා තිබූ පහන් කූඩු කොළ කැබැල්ල ගලවා දැමූහ. කූඩුව දෙස බැලූ මලිතිට එහි ඇලවූ කොළයක් ඉරී තිබෙනු දැක දැනුණේ දුකකි.

"ඉන්න, මං පාප්ප ගාන්නම්. වෙන කොළයක් අලවමු. මලිති ඉරුණු කොළය ගලවා එහි නැවත පාප්ප ඉලුවාය. පොඩි හාමුදුරුවෝ තවත් නෙළුම් පෙත්තක හැඩයට කැපූ කොළයක් ඒ මත ඇලවූහ.

කූඩුවේ සම්පූර්ණ කොළ අලවා ඉවර වන විට අනෙක් ළමයින් නෙළුම් මල සවි කිරීමට තැනක් සකස් කර තිබුණි. අරලිය ගහ මුල නොගැඹුරු රවුම් වළක් කපා, ඒ මත ඉටි රෙද්දක් එළා වතුර පුරවා තිබුණි. ඒ මැද නෙළුම් මල සවි කළ යුතු යයි යෝජනා කළේ මලිති ම ය. අනතුරුව පොඩි හාමුදුරුවෝ ඒ නෙළුම් මලක හැඩයට තැනූ වෙසක් කූඩුව විල මැද උස බෙලෙක්කයක් තබා එයට වැලි පුරවා එහි කූඩුව සිටවූහ. බෙලෙක්කය වටේට ඉටි රෙදි කැබැල්ලක් එතූ පසු එය විලක් මැද පිපුණු සැබෑ නෙළුම් මලක් සේ පෙනෙන්නට විය. සැබෑ නෙළුම් කොළ කිහිපයක් ගෙන ආ ළමයෙක් ඒවා ද විලේ තැනින් තැන දැමුවේය.

"සාදු, අපේ කූඩුව තේරේවිද? මලිති පොඩි හාමුදුරුවන්ගේ මුහුණ දෙස බලමින් ඇසුවාය. පොඩි හාමුදුරුවන් කූඩුව දෙස වරින් වර බැලුවා මිස යමක් කීවේ නැත.

රාත්‍රිය උදා වන තුරු අහස බලා සිටී. ළා කහ පාට සඳමඬල අහස් සළුපට අතරින් යාන්තමින් එබී බලයි. විල මැද පිපී ඇති සියපතක් බඳු වූ වෙසක් කූඩුව දෙස පොඩි හාමුදුරුවෝ බලා සිටියහ. පහළ මළුවේ ලාඩප්පා වැට අයිනේ සිටි උපාසක පිරිස මේ නෙළුම් මල බැලීමට උඩ

sinhalaebooks.com

මළුවට පැමිණෙන්නේ නම් හොඳ යයි පොඩි හාමුදුරුවන්ට සිතෙයි. ඔවුන් පහළ මළුවේ සිට වරින් වර මේ පහන් කූඩුව දෙස එබී බලන සැටි පොඩි හාමුදුරුවෝ දුටහ.

වෙසක් කූඩුවේ නෙළුම් මලක හැඩය තිබේ දැයි පොඩි හාමුදුරුවෝ වරින් වර තමාගෙන් ප්‍රශ්න කළහ; කූඩුව දෙස බලා සිටි මලිතිගෙන්ද ඒ බව ඇසූහ.

"මලිති, අපි ඉටි පන්දම් පත්තු කරමු ද?"

"ඔව්. එතකොට ලස්සනට හිටීවි" අනෙක් ළමයිද එය අනුමත කරමින් ඉටි පන්දම් දැල්වීමට උදව් කළෝය. අතේ වූ ඉටි පන්දම පොඩි හාමුදුරුවන් අතට දුන් මලිති බෝ මළුවට දුව ගියාය. දැල්වෙන පහනක් රැගෙන ආ මලිති පොඩි හාමුදුරුවන්ගේ අතේ වූ ඉටි පන්දම දැල්වීමට පහන් දැල්ල ළං කළාය. දැල්ලට උණු වී යන ඉටි මලිතිගේ උඩු පතුලට වැටීමෙන් ඇයට දැනුණේ වේදනාවකි. පහළ මළුව පැත්තෙත් හමා එන සුළඟට පහන් දැල්ල ඒ මේ අත යයි. මලිති අතින් පහන් දැල්ල මුවා කරගනිමින් ඉටි පන්දම දැල්වූවාය. දැල්වූ ඉටි පන්දම පොඩි හාමුදුරුවෝ ගෙන ගොස් විල මැද වූ පහන් කූඩුවේ සවි කළහ. කූඩුව ඇතුළේ දැල්වෙන ඉටි පන්දම් එළිය දැන් ඒ මේ අත නොයයි. සුදු පහන් කූඩු කොළ අතරින් එළියට ගලා එන ඉටිපන්දම් එළිය නිසා කූඩුව ඉතා හොඳින් පෙනෙයි. ඒ දෙස ළමයි සියලු දෙන ම ඉතා වුවමනාවෙන් බලා සිටියෝය. "අට ශ්‍රේණිය" යනුවෙන් ලියූ කොළ කැබැල්ලක් නෙළුම් මලේ පෙත්තක අග එල්ලා ඇත.

අහස පුරා විසුරුණු සඳ වතුර අරලිය ගස් ගොන්නට වැටී බිමට බේරෙයි. කහපාට අරලිය පොකුරුවල සෙවණැල්ල සුදු වැලි මළුවේ තැනින් තැන වැටී ඇත.

sinhalaebooks.com

කුඩා විල මැද වූ පහන් කූඩුවේ සෙවණැල්ල යාන්තමින් මළුවේ සටහන් වී ඇත. ඒ සටහන දිගේ දකුණු කකුලේ මාපට ඇඟිල්ල ඇදගෙන ගිය මලිති ඒ ඇඳී ඇත්තේ නෙළුම් මලක් දැයි සුජාත පොඩි හාමුදුරුවන්ගෙන් ඇසුවාය. සුජාත පොඩි හාමුදුරුවෝ මලිති විසින් පසේ ඇඟිලි තුඩින් ඇඳි නෙළුම් මලේ ඡායාව දෙස බොහෝ වෙලාවක් බලා සිටියහ.

පහන් කූඩු තෝරන විනිශ්චය මණ්ඩලයේ සිටියේ වයස්ගත කිහිප දෙනෙකි. ඔවුහු කූඩු පරීක්ෂා කරමින් එක් එක් කූඩුව ළඟ නතර වෙමින් ඒවා නැරඹූවෝය. පහළ මළුවේ සිටි උපාසක පිරිසද ඔවුන්ගේ පිටුපසින් යමින් පහන් කූඩු නැරඹූවෝය. විනිශ්චය මණ්ඩලයේ සිටි කීප දෙනා තම කූඩුව දෙසට එනු දුටු ළමයි ටික ඒ ආසන්නයට ගියෝය. මලිතිත් පොඩි හාමුදුරුවෝත් මුහුණට මුහුණ බලාගෙන, මොහොතක් වේලා කතාවකින් තොරව පසුවූහ. නෙළුම් මල් කූඩුව ළඟ නතර වී සිටි විනිශ්චය මණ්ඩලයේ කිහිප දෙනා ඒ දෙස ඉතා උනන්දුවෙන් බලන බව මලිති දුටුවාය.

සුළඟ හමන තාලයට ඉටි පන්දම් දැල්ල සෙලවෙයි. සුදුපාට නෙළුම් පෙති යටින් වරෙක ඉතා දීප්තිමත්ව පෙනෙන දැල්ලෙන් පහන් කූඩුව පිච්චී යතැයි මලිති සිතුවාය. ඉටි පන්දම් දැල්ල පහන් කූඩුව මතින් විශාල වී පෙනෙන හැම වරෙකදීම මලිති දෑස් පියාගත්තාය.

පහන් කූඩුව පරීක්ෂා කළ විනිශ්චයකරුවන් බණ මඩුව ඇතුළට යන හැටි පොඩි හාමුදුරුවෝ බලා සිටියහ.

ඔවුන්ගෙන් කෙනකු මයික්‍රපෝනයෙන් ප්‍රතිඵල ප්‍රකාශ කරන බව මලිතිද දැන සිටියාය. පොඩි හාමුදුරුවෝත්

sinhalaebooks.com

මලිතිත් ඉතා වුවමනාවෙන් බණ මඩුවෙන් මෙපිට සිටගෙන යකඩ කටට සවන් දෙති.

සුදුපාට වැලි තලයේ සටහන් වී තිබූ පහන් කූඩුවේ සෙවණැල්ල ක්‍රමයෙන් නැති වී ගියේය. සඳරැස් වැටීමෙන් ඉතා හැඩට පෙනුනු කහපාට අරලිය පොකුරු අඳුරේ නොපෙනී යන්නට විය. ඒ සමඟම වැසෙන්නට වූ පොද වැස්සේ වැහි බින්දු "ටික් ටික්" යන හඬින් පහන් කූඩුව මතට වැටෙන්නට විය. ලහි ලහියේ මිදුලට පැනගත් බොහෝ ළමයි තමන්ගේ පහන් කූඩු ලිහා බණ මඩුවේ ගෙනැවිත් එල්ලුවෝය. මලිති පොඩි හාමුදුරුවන්ගේ මුහුණ දෙස බැලුවාය. පොඩි හාමුදුරුවෝ කිසිවක් කතා නොකර බිම බලාගෙන වැහි පොදට අත් දෙක අල්ලාගෙන සිටියහ. මලිති වැහිපොද මැදින් අරලිය ගහ යටට ගියාය. පහන් කූඩුව ගැලවීමට උත්සාහ දැරුවත් ඇයට එය ගැලවීමට නොහැකි විය. වැහි පොද ටිකෙන් ටික වැඩි වෙද්දී ඒ වැහි බිංදු වැටීමෙන් දිය වී යන පහන් කූඩුවේ පෙති දෙස මලිති බලා සිටියාය. මලිතිගේ හිස දිගේ බේරී ගලන වැහි බින්දු නළල මතින් ඇගේ ඇස් ඇතුළට බේරෙයි. ඇස්වලින් එළියට එන දිය බින්දු උණුසුම් වෙමින් කම්මුල් දිගේ බේරෙයි. තෙතබරිත වූ පහන් කූඩු කොළ දිය වී යෑමෙන් ඉතිරි වූ බට පතුරු පමණක් මලිතිට පෙනෙයි. ඒ කූඩුව ඇතුළේ දැල්වුණු ඉටි පන්දම නිවී ගියේ කොයි මොහොතේ දැයි මලිති නොදැක්කාය. තෙත් වූ ළමා සාරිය දෑතින් ගුළිකර වතුර පෙරා හැර අරලිය ගහ මුලින් ඈත් වූ මලිති පඩිපෙළ බැස යන අයුරු බණ මඩුව අයිනට වී සිටි පොඩි හාමුදුරුවෝ බලා සිටියහ. විනිශ්චය දුන් කිප දෙනාද රාජකාරිය නිමාකොට යන්නට පිටත් වූහ. බණ මඩුවෙන් පිටත සිටි උපාසක පිරිස සන්සුන් ගමනින් බණ මඩුවට පැමිණ, පැදුරු මත වාඩි වී බවුන් වඩන්නට පටන් ගත්හ.

sinhalaebooks.com

# ඇතුළ සහ පිට

මගේ පන්සලේ මහණ වීම පිණිස පසුගිය දිනක කොලුවෙක් පැමිණියේය. ඒ කොලුවා පසුවදාම මටත් නොකියා හොර රහසේම පැන ගොස් තිබුණි. මේ කොලුවා පැවිදි වීමට පළමුව දක්වූ උනන්දුවත් ඒත් සමඟම කොලුවා තුළ ඇති වූ කලකිරීමත් කුමන හේතු නිසා ඇති වූ ඒවා දැයි මට අද තීරණය කරගත නොහැකිය. සමහර විටක ඔබට එම තීරණය ගැනීමට හැකියාවක් තිබිය හැකිය.

මේ කොලුවා මට හම්බ වුණේ අහඹු ලෙසය. දිනක් මම දායකයකුගේ දනකට පා ගමනින් වඩින විට තුංමංහන්දියේ කජු ගහ යට පුහුලන් අහුලමින් සිටි කොලු රැළ අතර මේ කොලුවා ද සිටියේය. හේවිසි හඬ මැද සුදු වියන් යට වඩින අප ජීවිතයේ පළමු වරට දුටු කෙනකු පරිද්දෙන් මෙම කොලුවා අප දෙස බලා සිටියේය. උඩුකය නිරුවත් මේ කොලුවා ඉණ දිගේ බේරෙන ජංගිය අතින් හදහදා අප දෙස බලා සිට, කොලු රැළින් මිදී අප පසු පසින් දානෙ ගෙදර දක්වා පැමිණියේය. මේ එන කොලුවා පිළිබඳ මගේ අවධානය වැඩි වූයේ, කොලු රැනේ කිසිවකු මෙම කොලුවාට එකතු නොවීමත්, එම කොලුවාගේ අපූරු හැසිරීමත් නිසාය.

දානේ ගෙදර ඉස්තෝප්පුවට ආ මේ කොලුවා අප ගේ ඇතුළට ගමන් කරන හැටි වුවමනාවෙන් බලා

sinhalaebooks.com

සිටියේය. අපේ පා සෝදා සුදු රෙදි කඩකින් පිහිදාන විට මේ කොලුවා පුදුම දෙයක් දෙස බලා සිටින්නකු ලෙස ඒ දෙස බලා සිටියේය. කොලුවාගේ උඩ යට යන ඇස් දෙක දෙස මම චුවමනාවෙන් බලා සිට ගෙට ගොඩ වුණෙමි.

දානේ ගෙදර උන් පිරිසගේ අවධානය මේ කොලුවා දෙස යොමු වූවා නම් ඒ උඩුකය නිරුවත් නිසා මිස වෙන දෙයක් නිසා නො වීය. ඒ වයසේ ම කොලු ගැටව් පිරිසක් එහි සිටි නිසා මේ කොලුවා විශේෂිතයෙක් නොවීය. එහෙත් අනෙක් ළමයි ළඟ නැති විශේෂ උනන්දුවක් කුතුහලයක් අප දැකීමෙන් මේ කොලුවා තුළ ඉපදී ඇති බව මට තේරුම් ගියේය.

මම දානය වළඳනා අතර මේ කොලුවා දෙස වරින් වර බැලීමට අමතක නොකළෙමි. උළුවස්ස ළඟ ඇන තියාගෙන ඒ කොලුවා අපේ දානේ පාත්තර දෙස ඉතා උනන්දුවෙන් බලා සිටියේය. මම බත් පිඬක් ගුළි කරන මොහොතේ සිට මුවට ළං කරන මොහොත දක්වා මේ කොලුවා ද ඇස් ඇරගෙන බලා සිටියේය. අපට දායකයන් විසින් බෙදන ලද බත් ව්‍යාංජන දීසි දෙස මේ කොලුවා බලා සිටියේ ජීවිතයට එවැනි ව්‍යාංජන මාළු වර්ග නො දැකපු බව හඟවන පරිද්දෙන්ය. මේ කොලුවාට බත් ටිකක් දෙන්නැයි කියන්නට කිහිප වරක් සිතුණත් මේ කොලුවා දෙස බලා සිටීමට මට තිබූ චුවමනාව නිසාම එවැනි දෙයක් නොකියා සිටියෙමි.

මේ කොලුවා දෙස බලා සිටින මට හැඟී ගියේ, කොලුවා තුළ හැංගිච්ච පිනක් ඇති බවයි. ඒ පින මතු වී, කවදා හෝ සැප විඳින කෙනකු විය හැකි යයි අනුමාන කළෙමි.

sinhalaebooks.com

දානය වළඳා, දානානිසංස බණ දේශනාවෙන් පසුව අපි මඟට බැස්සෙමු. අර කොලුවා බත් කෑමට නතර වෙතැයි සිතා සිටියත් ඌ අප පස්සෙන් එන්නට විය. මේ කොලුවා පෙරහැරට ම එකතු වී මා සමඟම ගමන් කළේය. කොලුවාට යමක් අසන්නට වුවමනා බව කොලුවාගේ ඉරියව්වලින් මට වැටහිණ. කොලුවා තුළ ඇති ලජ්ජාව හෝ බිය නිසා කතා නොකර මා දෙස බලමින් ගමන් කරයි. මම හිතූ විදිහට කොලුවා කෑදරයකු නම් බත් කෑමට නතර විය යුතුය. එහෙත් කොලුවා නතර නොවුණේ වෙනත් ගැටලුවක් ප්‍රධාන වී ඇති නිසා විය යුතුය.

"ළමයා, බත් කන්න නතර නොවුණේ මොකෝ"

"සාදු, බඩගිනි නැහැ." කොලුවා සමඟ මම පළමුව කතා කළ නිසා කොලුවාගේ බය ගතියක් ආරූඪ වී තිබූ මුහුණේ සිනාවක් මතු විය.

"සාදු..."

"ඇයි දරුවෝ?" කොලුවා අත්ල ඔළුව පුරා අතුල්ලමින් කියන්ට ආ දෙය ගිලගත්තේය. කොලුවාට යමක් මගෙන් ඇසීමට ඇති බවත්, ඒ සඳහා බොහෝ වේලාවක් කරුමානම් අල්ලන බවත් මට තේරුම් ගියේය.

"මොකද ළමයා ප්‍රශ්නේ?"

"නෑ සාදු, මාත් මහණ වෙන්න ආසයි." කොලුවා එතෙක් හිත ඇතුළේ ගුළි කරගෙන තිබූ අදහස එළියට දැමීමත් සමඟම බලාපොරොත්තු නොවූ ගැටලුවකින් මගේ සිත පිරී

sinhalaebooks.com

ගියේය. කොලුවාට එක් වරම උත්තරයක් දීගත නොහැකිව මා කොලුවාගේ තත්ත්වයට පත් විය. මේ කොලුවා ඇත්තටම ඊට කැමති නම් මා එයට විරුද්ධ විය යුතු ද? සෝපාක වැනි අහිංසකයන්ට සුනීත වැනි අසරණයන්ට මේ සාසනයේ ඉඩ තිබුණි නම් මේ කොලුවාටද ඒ ඉඩ කඩ තිබිය යුතුය.

"හොඳයි. මං මහණ කරන්නම්." මා උත්තරය අවසන් කරනවාත් සමඟ කොලුවා මා සමීපයට වී ගමන් කරන්ට විය. එසේ මා කීවත් කොලුවා කවුද? කොහේද? අම්මා තාත්තා සිටිනවාද? මේ ආදි ප්‍රශ්න මගේ සිතට ඇතුළු වූයේ මේ පොරොන්දුව දුන්නායින් පසුවය.

"ළමයාගේ අම්මා තාත්තා ඉන්නවද?

"තාත්ත නැහැ සාදු, අම්මා ඉන්නවා."

"ගම?"

"මේ කිට්ටුවමයි සාදු"

"හොඳයි. පන්සල පැත්තේ එනවකො බලන්න.

"හෙටම එන්නද සාදු?"

"කමක් නැහැ." කොලුවා මගෙන් නිදහස් වී දුවන්නට පටන් ගත්තේය. මම මොහොතක් නතර වී, මේ කොලුවා දෙස බලා සිටියෙමි.

කොලුවා තුළ මේ බලාපොරොත්තු කෙසේ ඇති වූවා ද යි මම කල්පනා කළෙමි. මේක පුංචි කාලේ සිට ම හිතේ තිබුණු දෙයක් ද? නැති නම් අද අප දැකීම නිසා ඇති වූ

sinhalaebooks.com

හැඟීමක් ද? කෙසේ වෙතත් කොලුවා ගිජු ලිහිණියකු සේ අප දෙස බලා සිටි හැටි නම් අපූරුය.

පසු දා උදෑසන මා මේ කොලුවා අම්මාත් සමඟ පන්සලට පැමිණියේය. කලින් දාට වඩා ප්‍රසන්න පෙනුමකින් යුක්තව, කොලුවා සුදු කමිසයක් හා නිල් කොට කලිසමක් ඇඳ, හිස කෙස් තෙල් ගා පීරා තිබුණේය.

"හාමුදුරුවනේ, දරුවා මහණ වෙන්න කැමතියි කියන්නේ..." කියමින් කොලුවාගේ මව මට දණ නමා වැන්දාය.

"උපාසක අම්මා මට දකල පුරුදුයි"

"හාමුදුරුවනේ, කරෝලිස්ගේ පවුල මම."

"හා! එහෙනම් මේ අර මැරුණු කරෝලිස්ගේ දරුවා"

"එහෙයි හාමුදුරුවනේ."

"හොඳයි හොඳයි. මිනිහත් ගුණ යහපත් මිනිහ නේ..."

"අනේ හාමුදුරුවනේ, අකාලේ මළා නේ..."

"දූන් ජීවත් වෙන්නේ කොහොමෙයි?"

"කඩයප්පන් ටිකක් කඩයට දානව හාමුදුරුවනේ."

"ළමයා ඉස්කෝලේ යන්නේ නැතෙයි?"

"අනේ හාමුදුරුවනේ, පහ කැලෑසියට ගියා. කොහෙද උවමනාවක් නැහැ නේ..."

sinhalaebooks.com

"හැබැයි මහණ උණොත් ඉගෙනගන්න ඕන"

"හා සාදු." එවර උත්තර දුන්නේ කොලුවාය.

කොලුවා මට බාර දුන් මව යන්නට ගියේ, මහණ කරන දවස පසුව දැන ගැනීමට එන බව කියාය. අම්මා ගිය පසු කොලුවා පන්සල ඉතා හුරු පුරුදු කෙනකු ලෙස හැසුරුණේය. එහෙත් නැති වූ දෙයක් සොයන්නකු පරිද්දෙන් කොලුවා ආවාසය පුරා ඇවිද්දේය. ගේ පුරා ඇති බඩු බාහිරාදිය පිළිබඳ දැඩි විමසිල්ලක් මේ කොලුවා තුළ විය. එයින් සාලය මැද තබා තිබූ කවිච්චිය කොලුවාගේ වැඩි අවධානයට යොමු වී තිබුණේය. මේ කවිච්චිය මා පන්සලට පැමිණෙන විට ද තිබූ එකකි. කවිච්චිය අසල සිටගෙන සිටින කොලුවා කවිච්චියේ ලියවැල් අතගායි. ඒ ලියවැල් කොතනින් පටන් ගෙන කොතනින් ඉවර වන්නේ දැයි දැනගැනීම කොලුවාගේ අරමුණ විය හැකි බව මගේ හැඟීම විය. ලියවැල් කොතනින් පටන් ගෙන කොතනින් ඉවර වන්නේ දැයි දැනගැනීම කොලුවාගේ අරමුණ විය හැකි බව මගේ හැඟීම විය. ලියවැල් ඇඟිලි තුඩුවලින් පිරිමදිමින් සිටින කොලුවා ගැන මගේ සිතේ ඇති වියේ අනුකම්පාවකි. රතු විල්ලුද රෙද්දෙන් අලංකාර කර තිබූ කවිච්චියේ විල්ලුද රෙද්ද දෙස ඉතා ආසාවෙන් බලමින් ලියවැල් ඇඟිලි තුඩු වලින් පිරිමදී. වරෙක ඒ ඇස් ලියවැල් දිගේ ඉහළට පහළට ගමන් කරයි.

මම කොලුවාට කාලසටහනක් පිළියෙල කර දුන්නෙමි; එහි අවදි විය යුතු වේලාව, කළ යුතු වතාවත් පාඩම් කළ යුතු පොතපත, ඒවා පාඩම් දිය යුතු වේලා ආදිය සටහන් කර කොලුවා අතට දුන්නෙමි. කොලුවා කාලසටහන අතේ

sinhalaebooks.com

තියාගෙන කච්චිය ළඟ එහාට මෙහාට යමින් කියෙවුවේය. ඒ කියවන ගමන් කච්චියේ ලියවැල් අතගෑමට අමතක නොකළේය. කාලසටහන කියවා අවසන් වූ කොලුවා නැවතත් ලියවැල් දෙස බලා සිටින්නට විය. කච්චියේ ලියවැල් දෙස මමත් කුඩා කල බලා සිටි හැටි මතකය. විශේෂයෙන් කච්චි ඇන්දේ මැද කොටසේ නෙළා ඇති මල් වැල ලස්සන වුණත් කුමන වර්ගයේ එකක් දැයි තේරුම් ගැනීමට මට ද නොහැකි විය. එහි අගක් මුලක් නැත. පටන් ගැන්ම කොතනද? අවසානය කොතනද? යයි සොයාගත නොහැකි වූ ලියවැල පිළිබඳ උනන්දුව මා තුළ තිබුණේ කුඩා කාලයේ පමණි. එය ඉබේට ම වාගේ මනසින් ඉවත් වී ගිය අතර, මගේ ගුරු හාමුදුරුවන්ගේ අපවත් වීමෙන් පසුව මම එහි වූ පරණ මෙට්ටය ඉවත් කොට අලුත් රතු විල්ලුද උරයක් දැමූ මෙට්ටයක් දැමුවෙමි. ඒ වුවත් මා පුංචි කාලයේ වෙහෙසුණු ලියවැලේ මුල අග සෙවීම මට මතක් වූයේ නැත. මේ කොලුවාද මා කුඩා කල පත් වූ වෙහෙසට පත් වී සිටිනු දැකීමෙන් මගේ කුඩා කාලය යළිත් සිහි වන්නට විය. මා මෙන් ටික දිනක් කච්චියේ ලියවැල් පිළිබඳ ගැටලුවෙන් මේ කොලුවාද නිදහස් වෙතැයි මම සිතුවෙමි. කුඩා කාලයෙන් පසු ඒ ලියවැල් පිළිබඳ අවධානයක් මා තුළ නොතිබුණු නිසා ඒ පිළිබඳව යමක් කොලුවාට විස්තර කර දීමට ද හැකියාවක් නැත. කොලුවා ඒ පිළිබඳව යමක් මගෙන් අසාවි යැයි සිතු නමුත් කොලුවා එය පරීක්ෂා කරනු විනා ප්‍රශ්න කිරීමක් නොකළේය.

එදා දවල් දානය නොතිබුණු බැවින් යමක් උයා ගැනීමට අපට සිදු විය. දානය වැරදීම මසකට දෙතුන් වතාවක් සමහර විටක සිදු වේ. සමහර දිනට අමු දානය

sinhalaebooks.com

ලැබේ. සමහර දිනක මුදලක් ඒ වෙනුවෙන් ලැබේ. සියල්ල එකතු කර බැලූ කල මාසයකට හය හත් වතාවක් දානය පන්සලේ උයාගැනීමට සිදු වේ. එවැනි දිනකට බොහෝ විට කෙරෙන්නේ ඉක්මනට පිළියෙල කරගතහැකි යමක් පිළියෙල කරගැනීමයි.

මම කොලුවාත් එකතු කරගෙන දහවලට හාල්මැස්සන් හොද්දක් සහ බත් උයා ගත්තෙමි. කොලුවා මේ කෑම කෑවේ කුහුලකින් බව මට වැටහුණි. එකක් සමඟ ගෙදරදී කෑවත් එය රසට හදා වෙන්නට ඇත. එහෙත් එවැනි පුහුණුවක් නැති මා හැදූ හොද්ද කොලුවාට රස නැතුවා වන්නට ඇත. සවස් වන්නට වන්නට කොලුවාගේ තොන්තුවා ගතිය වැඩි වෙමින් තිබුණි. සමහර විට ගෙදර මතක් වීම නිසා හෝ පරිසරය නුහුරු නිසා එසේ වන්නට ඇතැයි මම සිතුවෙමි. කවිච්චිය ඇස නොගැසෙන තැනක වාඩි වී කොලුවා බලාගත් අත බලාගෙන සිටියේය. මේ තොන්තුවා ගතිය කුඩා කල මා තුළද තිබූ නිසා මෙය එතරම් මම ගණන් නො ගත්තෙමි.

මට නම් දින කීපයකින් සියල්ල අමතකව ගොස් මේ පරිසරයට හුරු වීමේ හැකියාව ලැබුණි. උදේ කාලයේ පාඩම් කිරීමට දුන් සාමණේර බණදහම් පොතේ පිටු බාගයක් විතර කොලුවා කටපාඩමින් දුන්නේය. කොලුවාගේ දක්ෂතාව ගැන මම බෙහෙවින් ප්‍රසාදයට පත් වීමි. තෝන්තුවාවෙන් දවස ගෙවූ කොලුවා කටපාඩම් කිරීමට වැඩි කාලයක් නොගන්නට ඇත. ඒ කාලය තුළ කටපාඩම් කර ඇති හැටියට මේ කොලුවාට හොඳ අනාගතයක් ඇතැයි මම සිතුවෙමි.

sinhalaebooks.com

කොලුවාගේ කාලසටහන මුළුමනින් ම ක්‍රියාවට නොනැග්ගත් මුල් දවස නිසා මම ඒ ගැන ඉවසුවෙමි. රාත්‍රි බුද්ධ වන්දනාවෙන් පසුව තවත් පැය දෙකක් පොත අතේ තියාගෙන කිරා වැටුණු කොලුවා සාලයේ බිම වැටී නිඳාගත්තේය. කොට්ටයක් සහ පැදුරක් දී කොලුවා කී ද්දූ මම එය එළාගෙන නිඳාගන්න කියා මම ද කවිච්චිය උඩ ඇලවුණෙමි.

පසුදා උදෑසන බලන විට කොලුවා නොසිටියේය. නිඳාගත් පැදුර අකුළා කවිච්චියට හේත්තු කර තිබුණේය. කොලුවා මෙසේ නොකියා යන්ට යාවි යයි මම නොසිතුවෙමි. කොලුවා තුළ මහණකම කෙරෙහි වූ උනන්දුව පන්සලට ආ මොහොතේ සිට නැති වී ගියේ කෙසේද? ඒ කොලුවා පිළිබඳ ඉන් පසු මම සෙව්වේ නැතත් කොලුවා තුළ වූ ප්‍රසාදයත් කලකිරීමත් කිනම් හේතු නිසා වූ ඒවා දැයි මට ගැටලුවකි.

sinhalaebooks.com

# ආත්ම ශක්තිය

"කොහෙද ඕයි පෙල්ලගෙන දුවන්නෙ?" ගේට්ටුවේ සිටි ආරක්ෂක භටයා කෑගැසුවේය. මම ඔවුනට කන් නොදී පෝලිම බිඳගෙන ඇතුළට ගියෙමි. රජයේ සේවකයකු වශයෙන් නීතිය විශේෂයෙන් ගරු කළ යුතු බව ගේට්ටුවෙන් ඇතුළු වන්නට පෙරම මා දැනසිටියත් මරණය විසින් ටිකින් ටික කාදමමින් ඇති මගේ දුවගේ ජීවිතය හා ඉන් අසරණ වූ මුහුණ සිහි වත්ම මා කෙරෙන් ඒ සියලු දේ ගිලිහෙයි.

ළමා වාට්ටුවට යන පාර දැන් මට හොඳට පුරුදුය. ඇස් පියාගෙන වුව එය හොයාගෙන යෑමට තරම් මගේ අනෙකුත් ඉඳුරන් සමත්ය. සුදු සිවිලින් තහඩුවට වදින හිරු එළිය කැඩපතක් අල්ලා මා දෙසට එල්ල කරන්නාක් මෙන් මගේ ඇඟ මත වැටෙයි. ඒ එළිය මගේ ඇස් නිලංකාර කරවයි. චණ්ඩ හිරුඑළිය විසින් මඬනා ලද මගේ කයින්ද දුවගේ අසරණ බව විසින් පෙළන ලද සිතින්ද මා හෙම්බත් වී ඇත. සුදු රෙදිවලින් ඔතන ලද මළමිනීද මරළතෝනි දෙමින් කෑගසන තුවාලකාරයන් ද, වැඳුම් ගෙය ඇතුළෙන් ඇහෙන කෙඳිරි ගෑම්ද, කම්මලේ බල්ලාට කිණිහිරයට ගසන සද්දය හුරු මෙන් දැන් මට හුරුය.

එහෙත් ඒ ළතෝනි කෙඳිරිගෑම්වලට මම දිනපතා ශාප කළෙමි. මට මේ සියල්ල දැනුණෝත්, පෙනුණෝත් උදේ පාන්දර දොට්ට බහින විට කෑරලකු කෑගහන හඬකට නැත හොත් බල්ලකු ගසන හඬකට සමානවය.

sinhalaebooks.com

මම ළමා වාට්ටුව ළඟට යන විට සුපුරුදු ලෙස වාට්ටුව බාර මිසී සිනා සුණාය. මා එයට දුන් ප්‍රතිචාර දක්වන්නේ නැති තරම්ය. ඇය සාප්පුවක තබා ඇති ඉටිබෝනික්කකුගේ රූපයකට සමාන යැයි සිතේ. ඒ තරම් ඇයගේ ඉරියව් එකාකාරය; මට හුරුය. ඇය නටන උණුවතුර බඳුනකට එන්නත් කටු දමමින් සිටියාය. මා ඇයට පිටුපා වාට්ටුවට ඇතුළු වනවාත් සමඟ ම ඈ මට කතා කළාය. මම ආපසු හැරී බැලුවෙමි.

"දූන් ඩොක්ට එනව කිව්ව, ඔයාට ඉන්න කිව්ව ටිකක්...... අනේ මන්ද මිස්ට සිරිල්, ඔයා හරියට දුක්විඳිනව, අපිටත් දුකයි. බලන්න දං කොච්චර කල්ද? අඩු ගානෙ කතා කරනව නං ඒකත් ඇති." ඇය එන්නත් කටු නටන උණුවතුරේ එහාට මෙහාට කරමින් කීවාය. මම හිස වනා දුවගෙන ඇඳ ළඟට ගියෙමි. දුවගේ ඇඳට ඉහළින් ඇති විදුලි පංකාව "ටක ටක" ගාමින් වේගයෙන් කරකැවෙයි. උඩුකුරුව ඇඳ මත උන් මගේ දුව දෙස මම බලා සිටියෙමි. දයාබර බිරිඳ විසින් මට ඉතුරු කර ගිය එකම වස්තුව ඇය පමණි. මගේ අතීත දුක් වේදනාවන් සියල්ලට ම ඔරොත්තු දීමේ හැකියාව මට ලබා දුන්නේ මේ දරුපැටියා නො වේ ද? යෞවනය විසින් මට හිමි කර දී තිබූ සියලු ආශාවන් විවාහය තුළින් සපත වේ යැයි සිතුව ද ඇගෙන් මා ලැබුවේ තනිකමට මුහුණදීමට දුන් පෙරහුරුව පමණි. ඇය මාත් දරු පැටියාත් මෙලොව තනි කර දමා සීතල කය මෙහි දමා යන්නට ගියාය. තුන් බියෙන් පෙළෙන විසාලා වැසියකුසේ අසරණ වූ මට ඇගේ සිහිවටන සමරු පලකයක් සේ තබාගන්නට දියණිය මෙහි තබා ගියාය. දුව ඉපදෙන්නටත් පෙර අහිංසා හංසමාලි යැයි නම් තැබු වේ ද ඇය මය. අහිංසා මෙහි දමා හංසමාලිය ඇය රැගෙන

sinhalaebooks.com

ගොස්ය. බිරිඳගේ සුවඳත්, රුවන් මුසු කොට අඹන ලද පිළිරුවක් සේ මට ඇය පෙනෙයි. මම දියණිය වැලඳගතිමි.

එදා මෙදා තුර පැස්බරකු තම බිත්තර රකින්ට දරන වෙහෙස සේ මම දරුවා රකින්ට වෙහෙසුණෙමි. මගේ අතීත සමරු පලකය අතහැර දැමීමට නොහැකිය. මම කීපවරක් දුවගේ මැලවුණ මුහුණ සිපගතිමි.

වෛද්‍යවරයාත්, හෙදියත් ඇඳ ළඟට පැමිණි බව දැනුණේ ඔහු මගේ පිටට තට්ටු කිරීමෙන්ය. මම ඔහු දෙස බලා සිටියෙමි. ඔහු විදසුන් වඩන තවුසකු ලෙස නිහඬව සිටියේය. "ඩක ඩක" හඬගෑ විදුලිපංකාවේ වේගය අඩුවී ගොස් නතර විය. මලකඩ විසින් විනාශ කරමින් තිබෙන හුළං පෙති දෙස මම බැලුවෙමි. දොස්තර එහි සුවිචයට අතින් ගැසුවේය. නැවතත් "ඩක ඩක" හඬ නඟමින් විදුලිපංකාව කැරකැවෙන්නට පටන් ගත්තේය.

"මිස්ට සිරිල්......" අනතුරුව ඔහු ශාන්ත ස්වරයෙන් මා ඇමතුවේය. මගේ දෑස් ඔහු වෙත යොමු කළෙමි. ඔහුගේ විවර වූ දෙතොල් අතරින් සුදු වන් දත්පෙළ පෙනෙයි. ඒවා ඉතා දීප්තිමත්ය. ඔහුගේ ගැඹුරු දෑස් ක්‍රමයෙන් විවර විය කළු පිහාටුවලින් යුත් දෑස් පියන්පත් රාජාලියකු තටු විදා හැර තම පැටවා වසාගත්තා සේ මොර ඇටවන් දීප්තිමත් දෑස් ගුළි වසා ගත්තේය.

"මේ දරුව ගැන මිස්ට සිරිල්ට වැදගත් තීරණයක් ගන්න වෙලා තියෙනව" ඔහු හෙමින් කීවේය. "මොකක්ද?" මම වහා දරුවා දෙස බලා ඇසුවෙමි. එය මා දොස්තර සමඟ මෙතෙක් කතා කරද්දී පිට වූ වේගවත්ම වචනය විය හැකිය. ඔහු කතා නොකළේය. විදුලිපංකාවේ හැපුණු කෘමියෙක් දොස්තරගේ ඇස් පියාපත් අතරින් රිංගා ඇසට

sinhalaebooks.com

වැටුණේය. ඔහු දෑතින් ම ඇස බදාගත්තේය, පිටි අත්ලෙන් ඇස පොඩි කළේය. කෘමියා ඇස තුළම මියෙන්නට ඇත. කඳුළු පිරුණු ඇස අත්ලේන්සුවෙන් වසාගෙන මට ඔහුගේ කාමරයට එන්නැයි කියමින් යන්ට ගියේය.

මම අත්ඔරලෝසුව දෙස බැලුවෙමි. එය නතර වී ඇත. දකුණු අතින් ඔරලෝසුවට ගැසුවෙමි. එහි තත්පර කටුව ඉලක්කම් කිහිපයක් පසු කොට නතර විය. මම නැවත පෙරට වඩා වේගයෙන් එයට ගැසුවෙමි. එය නැවත ටික දුරක් ගොස් නතර විය. ඔරලෝසුව අතින් ගලවා ඇඳවිට්ටමේ ගසා දුවනවා දැයි නොබලා සාක්කුවේ ඔබාගෙන දොස්තර මහතාගේ කාමරය සොයා දිව්වෙමි.

සියලු ඉන්ද්‍රියන් අක්‍රිය වූ සීතල කෙසෙල් කඳක් බඳු වූ මගේ දුවගේ ළඟින් මගේ ලේ සුවඳත් බිරිඳගේ ලේ සුවඳත් හැර යමක් නො දැනෙන ලෙස මාරයා විසින් කළු රෙදි දමා දුවගේ ජීවිතය වසාගෙන ඇත. දුවගේ ජීවිතය හා බැඳුණු මගේ සිතුවිලි දුවගේ ශරීරය මෙන් අඩපණ වී ඇත. මගේ ජීවිතය ඇගේ අක්‍රිය බව විසින් ම ගිලගෙන ඇත. මගේ ජීවිතයේ ඕනෑම ක්‍රියාවක් හේතුඵල රහිතව වරෙක සිදු විණි. යම් ක්‍රියාවක ඊළඟ පියවර වෙනුවට තවත් ක්‍රියාවක් කෙරෙයි. නැත් නම් එහි පරතරය වැඩි වෙයි. වරෙක බත් කන මම එය අතරමඟ දමා දිය නෑවෙමි. දිය නාන අතරතුර ගොස් දුවගේ බෙහෙත් තුන්ඩුව සෙව්වෙමි. මෙසේ මගේ ජීවිතයේ සියලු දේවල් පටලැවී තිබිණි.

මම දොස්තර මහතාගේ කාමරයට යන විට ඔහු පුටුවක වාඩි වී වම් අත පුටු ඇන්ද මත තබාගෙන ඇඟිලි තිකට මත රඳවාගෙන කල්පනා කරමින් සිටියේය. "වාඩි වෙන්න මිස්ටර් සිරිල්..." ඔහු මා දුටු ගමන් කාරුණිකව

sinhalaebooks.com

කීවේය. ඔහුගේ වචන තුළ මට ආරක්ෂාව ඇතැයි සිතුවෙමි. "මොකක්ද මං කරන්න ඕන?" මම ඔහුගේ මුහුණ දෙස කෙළින් බලාගෙන ඇසුවෙමි. සාන්තුවරයකුගේ වැනි ඔහුගේ ගැඹුරු දෑස් තුළින් මගේ දෑස් ඉවත් කරගත නොහැකිය. මා කුඩා කල පොල්කුරුම්බියකු මගේ ඇගේ වසා මරහඬ දී කෑ ගැසූ විට ඌ ගලවා දමා මා තුරුලු කරගෙන සිටි සීයාගේ ජවයෙන් පිරුණු අත්දඬුත් මනාව වැඩුණු වූ උඩු කයත් ඔහුට ඇතැයි සිතුවෙමි. "දරුව බේරගන්න එන්නතක් දෙන්න වෙනව සිරිල්, හැබැයි මේ එන්නත සාමාන්‍ය එන්නතක් නොවෙයි. මේක යම් විදියකින් දරුවාගේ ඇඟට දරාගන්න බැරි උණොත් දරුවගෙ ජීවිතය ගැන මේ තියෙන බලපොරොත්තුවත් නැති කරගන්න වෙනවා. යම් විදියකින් ක්‍රියාත්මක උණොත් අපි ඔක්කොගේම වාසනාව. සිරිල්ගෙ තීරණයක් නැතිව මම අකමැතියි තනියෙන් තීරණයක් ගන්න." මම දෑතින් හිස බදාගත්තෙමි. නිදාගෙන සිටි මගේ මොළය අඬු පුප්පා නැගිට්ටු දැනුණි. මුහුදින් මතු වන බූවල්ලකු මෙන් ඔළුකටු කුඩු කර ගෙන ඉහළටම එන්නාක් මෙන් දැනිණි. "සිරිල් කලබල වෙන්න එපා. මේක වෛද්‍යවරයෙක් වශයෙන් ඔබට දිය යුතු තීරණයක් නොවෙයි. නමුත් ඔයා මං ගාවට ආවේ මං ගැන දාහක් බලාපොරොත්තු තියාගෙන. මෙතෙන්දි මං ගන්න තනි තීරණය වැරදුණොත් සිරිල් මට වෛර කරාවි. ඒකට මං බයයි. ඉතිං ඒකයි ඔයා මේ තීරණයට එකතු කරගන්න හිතුවෙ. දැන් ටිකක් ගෙදර ගිහින් හිතන්න. දරුවා ඔහොම මැෂින්වලින් ජීවත් කරවනව ද එන්නත දෙනව ද කියල." ඔහු සන්සුන් ලෙස කීවේය.

ඉණිමඟක් තබා එය අල්ලාගෙන කුලුනකට නංවා ඉණිමඟ අතහැර බහින්නට ඔහු මට අණ කරයි. මාව

sinhalaebooks.com

කර මත තබාගෙන ගැඹුරු දියඹට පීනා ඔහු ඔහුව කර තබාගෙන පීනන්නට මට කියයි. සුක්කානම අතහැර රිය පැදවීමට ඔහු මට අණ කරයි. මම ඔහුගේ මුහුණ දෙස බලා සිටියෙමි. කලින් සතකු වැටීමෙන් පීඩා වූ ඔහුගේ ඇස ලොවි ගෙඩියක් මෙන් රතු වී ඇත. නාගයකු වෙතින් පහර කෑ උකුස්සකු පියාපත් සලන්නාක් මෙන් ඔහුගේ ඇසිපිය ගැහෙයි.

මම කාමරයෙන් පිට වුණෙමි. මඩ වගුරක කරත්තයක් ඇදගෙන යන ශක්තිමත් ගවයකු ලෙස මගේ ආත්මය විසින් ශරීරය ඇදගෙන යන්නට විය. කෙවිටෙන් පහර කන ගවයා මෙන් මගේ ආත්මය දොස්තර මහතාගේ වචනවලින් පහර කයි. මම නැවත ළමා වාට්ටුව දෙසට ගියෙමි. දෑස් පියාගෙන ළමා වාට්ටුවේ යාමට හැකියාව තිබූ මට මෙවර වාට්ටු කිහිපයකට එබිකම් කරන්නට සිදු විය.

මම දුවගේ අප්‍රාණික දෑත් නළල මත තබාගතිමි. ඇඳ පාමුල ජීව වායුව පිරවූ සිලින්ඩරයකින් ගත් බටයක් දුවගේ නාසයට ගසා තිබිණි. හෙදිය මගේ පිටුපසට වී සිටියාය. දොස්තරත් ඇයත් මගේ ශරීරය කල්දේරමකට දමා උණු දිය වත් කොට කබල්ගාන්නේ යැයි සිතුණි.

"අනේ දුවේ, කියන්න මට, මං මොනව ද කරන්න ඕන දෙයියනේ........?"

මම දරුවාගේ හිස මත අත තබාගෙන කෑගෑවෙමි.

"දරුවට කරදර කරන්න එපා." මිසී මා වැළකුවාය. මම හෙදියගේ මුහුණ බැලුවෙමි. ඇගේ මුහුණු බොඳ කරමින් මගේ බිරිඳගේ මුහුණ මතු වෙමින් තිබිණි.

"අනේ කියන්න ඔයාවත්. ඔයාගේ නේද දරුව?"

sinhalaebooks.com

මම ඇගේ අත් දෙක අල්ලාගෙන කීවෙමි. ඇය නිහඬ වී සිටියාය. අප්‍රාණික වූ මගේ දෑත් ඇගේ දෑත් මතින් ගිලිහී ගියේය.

මා රෝහලින් පිට වූයේ අබ සොයන්නට ගිය කිසාගෝතමිය සේ විකල් වූ මනස විසින් මගේ දෑස් විවරයන් තුළ සටහන් කරන ලද දුවගේ අප්‍රාණික කයේ ඡායාව තද කරගෙනය.

මට හමු වන සෑම කෙනකුම මගේ දරුවාගේ ජීවිතය රැකදෙන්නට මිනිස් වෙසින් පෙනී සිටින දේව දූතයන් යැයි සිතුවෙමි. මා ගත යුතු තීරණය ඔවුන්ගෙන් ඇසුවෙමි. ඔවුන් මා පිස්සකු යැයි කල්පනා කරන්නට ඇත.

අපට බැරි වන ඕනෑ ම විටක අසරණ වන ඕනෑ ම විටක දෙවියන්ගේ පිහිට ලැබෙතැයි මම කල්පනා කළෙමි. අසහාය දෙවි කෙනකු සිය බල මහිමයෙන් තෝන්තු වූ මගේ මනසට දිව්‍ය ඖෂධ ලබා දී සුවපත් කරාවි යැයි කල්පනා කළෙමි. දරුවාගේ ජීවිතයේ අවසාන තීරණය දෙවි කෙනකු අත ඇතැයි මම සිතුවෙමි. මට දේවාලයකට යන්නට කෙනෙක් පාර කීවේය. කිසාගෝතමිය බුදුගෙට යැවූ දේව දූතයා ඔහු යැයි මම එක්වර ම සිතුවෙමි. ජීවිතයේ තීරණ ගැනීම තුළින් භයානක ප්‍රතිඵල ඇති විය හැකි බව විශ්වාස කළෙමි. දෙවියෝ සියල්ල දනිති. බුද්ධිමත් තීරණයක් ගැනීමට දෙවියන්ගේ උපකාරය අවශ්‍යමය.

දෙවියන් පිළිබඳ මා තුළ වූ භක්තිය විශ්වාසය තුරුලු කරගෙන, ඔහු කී පාර දිගේ දේවාලය සොයා ගියෙමි. ඒ දේවාලය මිල්ල, නා කණු යොදා ශක්තිමත්ව තනන ලද එකකි. සකල ලෝක වාසීන්ගේ සියලු දුක් කරදර දරා සිටීමට එයට හැකියාව ඇතැයි විශ්වාස කළෙමි. කපුරු,

sinhalaebooks.com

සුවඳ කොට්ටන්, අගිල් පිච්චෙන සුවඳ විසින් මගේ ආත්මය නළවන්නාක් වැනි විය. මම දේවාල දොරකඩට ගියෙමි. දේවාල දොරටුව වසා ඇති රතු රෙද්දේ ත්‍රිශූලයක් අතදරා ගත්, විශාල පෙණගොබ සහිත නාගයන් කර පලඳාගෙන, අශ්වයකු පිට සිටින දළ වැනි දත් සහිත වටකුරු මුහුණකින් යුත්, සියලු තේජසින් යුත් මිනිසකුට සමාන රූපයක් ඇඳ තිබුණි. දොස්තරගේ මුහුණට වඩා මෙම මුහුණ දෙස ඕනෑම කෙනකුට බලා සිටිය හැකි යයි සිතුවෙමි. ඔහු සමඟ ඕනෑම දිය දහරක පිහිනීමටත්, ඕනෑම වේගයකින් රිය පැදවීමටත් හැකි යයි සිතුණි.

තිර රෙද්ද මෑත් කොට, නවගුණ වැලක් පළඳින ලද දිගු කෙස්වැටියක් හා දිගු රැවුළක් ඇති කාක වර්ණ තර බාරු මිනිසෙක් දුම් කබලක් හා වේවැලක් ගෙන ඉදිරියට ආවේය. මා මෙතෙක් බලා සිටි රූපයට ජීවය ලැබී ඇතැයි සිතුවෙමි.

"එන්න දරුවා..." ඔහු මට ආමන්ත්‍රණය කළේය. ප්‍රතාපවත් රජකුට අවනත වන සේවකයකු ලෙස මම ඔහු අබියසට ගියෙමි.

"කාරණය ගැන හිතේ තබාගෙන පඬුරු තියන්නැ" යි ඔහු මල් බුලත් තටුවක් පෙන්නුවේය. පර වෙන්නට ගිය හා පර නො වූ රක්ත වර්ණ මලින්ද නොපිට හා හොඳ පිට හැරවූ බුලතින්ද යුක්ත වූ තටුව මත පඬුරු තැබුවෙමි. කාරණය අමුතුවෙන් කිව යුතු නැත. මා ආවේද ඉන්නේද එක අරමුණක් මතය.

ඔහු ආරූඪ විය. දිගු කෙස්වැටිය ටිකෙන් ටික දිගහැරී දෙවුර මත වැටී, දෙවුරේ මස් පිඬු ගොඩ දමූ මාළුවකුගේ මෙන් නටන්නට විය. දොර රෙද්දේ ඇඳ

sinhalaebooks.com

තිබූ නාගයන්ට වාසයට තැනූ බෙන මෙන් නාස්පුඩු දිගහැරී විශාල විය. ඇස් දෙකේ කළු ඉංගිරිය, වැසී සුදු ඉංගිරිය, මතු වී පෙනෙන්නට විය. දෙවුර මත වැටී තිබූ කෙස් වැටිය කෙමෙන් කෙමෙන් ඉහළට එසවෙන්නට විය. දෙපය ලූ සිලම්බු මිණිගෙඩි සණ්ටාර සිය ගණනක් එකවර නාද කරන්නාක් මෙන් නාද වන්නට විය. බරවා පයකින් දොරකට ගසන්නක් මෙන් මර හඬ නගමින් පොළොවේ අඩි හප්පන්නට විය. ගව් ගානක් පසු පස පන්නාගෙන ආ සතුරෙකු ටිකෙන් ටික කිට්ටු වී එක වරම පැන උගුරු දණ්ඩ අල්ලාගත් කල ගෑගසන මිනිසකු ලෙස යටි ගිරියෙන් කෑ ගැසුවේය. මල් තටුව මත වූ මල් පඬුරු, බුලත් ඔහුගේ යකඩ අත වැදී සී සී කඩ විසුරුණේය. උගුරු දණ්ඩ මිරිකීමෙන් පණ යන්නට හදන මිනිසා මෙන් ඔහු ටිකෙන් ටික නිසල වන්නට විය. පෙරහැරක කස ගසන්නාක් මෙන් ගුවනේ නැටූ කෙස් කැරලි ටිකෙන් ටික පාත් වී යළි දෙවුර මත වැටිණි. "දරුව...... දරුව...... නුඹ පැමිණ සිටින්නේ ප්‍රාණකාරයකු ගැන දැනගන්න."

"එහෙමයි දෙවියනි."

"ඒ ප්‍රාණකාරයාගේ ජීවිතය ගැන වැදගත් තීරණයක් ගන්න වෙලා තියෙනව."

"ඔව් ඔව්, දේවතාවුනි."

"ඔව්....... නුඹ හොඳට හිතල තීරණයක් ගන්න ඕන. දරුවාගේ ජීවිතය තියෙන්නෙ නුඹේ අතේ. නුඹට දෙවියන්ගේ පිහිටයි."

මෙසේ කීවූ ඔහු කපා බිම හෙළන ලද කෙසෙල් කඳක් මෙන් බිම වැටුණි. ආවතේවකාරයෙක් ඇවිත් ඔහුට වතුර ඉස්සේය.

sinhalaebooks.com

දේවාලයේ මිල්ල නා කඳන් මගේ ඔළුව මත කඩා වැටී හිස පොඩි වී ලේ ගලන්නාක් මෙන් මට දැනිණි. මා විසින් මෙතෙක් අනුන් මත තබා පිහිටක් පැතූ සියලු බලාපොරොත්තු විශාල දිය සුළියකට හසුව විනාශ වී ගියේය. මා විසින් ගලවාගත යුතු දුවගේ ආත්මය අනුන්ට බාර දීමේ පාපය මා පිටුපස සිට දත් විළිස්සමින් මට සිනා සුණේය.

යකැදුරා විසින් මුහුණ බැඳ, සිලම්බුලා අත්පා කළු කරගෙන පුරාලයට නැග නැටීම සඳහා මටම අණ කරයි. කපුවා විසින් දෙවියන් කෙරෙහි මා තුළ වූ භක්තිය විනාශ කර දමන ලදී. අබ නොලද කිසාගෝතමිය මෙන් හිස් අතින් විකාර වූ සිතුවිලිවලින් යුතුව මම ගෙදර එන්නට ආවෙමි. බොරු පාද දැමූ කිහිලිකරුවකුගේ ගමන මෙන් මගේ ගමන බාල වී ඇත. පිපාසය හා කුසගින්න විසින් මඩනා ලද මගේ කයට කුසගින්න හා පිපාසය විසින්ම දිය හා ආහාර එපා කර තිබුණි. හිරුගේ චණ්ඩ බව විසින්  කතා කරන ලද ලේ විසින්ම දෙපැතෙන් ගිනිග න්නා මද්දහන සිරුරට හුරු කර තිබුණි. ජීවිතයේ එක ම බලාපොරොත්තුව විසින් ඒ බලාපොරොත්තුවද උදුරාග නිමින් තිබිණි. ඉබාගාතේ ඇවිදින කුෂ්ඨ හැදුණු සුනඛයකු ලෙස ඇවිද්දෙමි. මා සිටින තැන් ගිය තැන් යායුතු තැන් බිඳී ගිය ආත්මශක්තිය විසින් අමතක කර දමා තිබිණි. අහස වසාගෙන නැඟුණු වලාකුළු පසාරු කරගෙන මතු වන විදුලි රේඛාවක් ලෙස දරුවා පිළිබඳ මතකය විසින් මගේ ආත්මයේ හැම තැන හෙණ පුපුරුවන ලදී. එළි වන රෑ වන හැම දිනයක් ම කළුවරින් යුක්ත විය. බැම්ම පුපුරා පිටාර ගලන වැවක් මෙන් අනාථ වූ සිතුවිලි ආත්මයේ ඉවුර බිඳ පිටාර ගලයි. වාරකන් මුහුදේ කුණාටුවකට

sinhalaebooks.com

හසු වී විනාශ වූ බෝට්ටුවක් සේ මගේ ජීවිතය වාවාගත නොහැකි අසරණකමේ කුණාටුවට හසුව විනාශ වෙයි.

මා විසින් කුමන තීරණයක් ගත යුතු දැයි මොළය නොකියයි. එය අනුන් මත පවරා මගේ ආත්මයට නිදහස් වීමට අවශ්‍ය වී ඇත. එහෙත් එහි වගකීම මා වෙතම යළි ඔවුන් විසින් පවරා දී ඇත.

මම යළි රෝහලට ගියෙමි. ඒ ගියේ තීරණයක් ගෙන නොව, බිරිඳක කෙරෙහි සැමියකු දක්වන සෙනෙහසත් ඒ සෙනෙහස අහිමි වීම තුළින් පිපාසිත වූ පියකු දරුවකු වෙතින් පතන බලාපොරොත්තුත් ඒ බලාපොරොත්තු බිඳ වැටීමෙන් ජීවිතයේ පතුළටම වැටුණු අසරණයකු යන හැඟීම්වලින් මතු වූ සාංකාව විසින් ගසන ලද අතුල් පහරවල පෙලඹවීම නිසා ය.

මරා දමන ලද වැහිළිහිණියකු වැනි වූ දරුවාගේ අප්‍රාණික සිරුර දෙස බලා සිටීමට නොහැකිය. එහෙත් මේ වැහිළහිණි පැටවා මෙසේ වත් දකින්නට නොලැබේ ද? දෙවියනි, ඒ භයානක එන්නත දරුවා ජීවත් කරවනවා වෙනුවට මරා දැමුව හොත්... යකඩ කූරු අගට උල් සවි කොට මගේ ඇඟට අනින්නාක් වැනි වේදනාවක් දැනුණි. සුදු ලේස් රෙද්දෙන් ඔතන ලද දරුවාගේ සිරුර බට පතුරු පෙට්ටියක දමා ගිනි තබනු මැවී පෙනුණි. මට දොස්තර පිළිබඳ වෛරයකුත් පිළිකුලකුත් ඇති විය. තවත් මොහොතකින් ඇඟපත පාගමින් දුව පැන යන දරුවෙක් පෙනෙන්නට විය. මගේ දුව වායු බට ගලවා දමා, සේලයින් කටු ගලවා විසි කර ඇඳෙන් පැනැවිත් මා බදාගෙන මගේ උරගොබ හපමින් ඇඟිලි තුඩුවලින් පපුවේ රෝම ගලවමින් "මට සනීපයි" කියමින් කෑගසන දුවගේ මුහුණ මැවී පෙනුණි.

sinhalaebooks.com

මම ළමා වාට්ටුව දෙසට ගියෙමි. කකුල් කපා රෙදිපටි ඔතා ට්‍රොලියක ගෙන යන කොටෙක් ද, ඔළුව පමණක් එළියට ආ මර හඬ ලමින් දරුවෙකු වදන්නට දඟලන ගැහැනියක තබාගත් ට්‍රොලියක්ද මා පසු කර ගියේය. ළිප මත පණපිටින් තැම්බෙන කකුළුවකු මෙන් මා මරණ බයෙන් පෙළෙන්නට විය. වදකයකු විසින් මොට්ට වූ කඩුවකින් මගේ බෙල්ල කපා කඩුව උලමින් මුවහත් කරනු මැවී පෙනුණි.

සුදු සිවිලිම, සුදු දොර රෙදි අතරින් රිංගා මම දරුවා සොයාගෙන ගියෙමි. ජීව වායු බට ගලවා ඇඳ පාමුල දමා තිබිණි. ඇඳ ඉහළින් එල්ලූ සේලයින් බෝතලයේ බටය කටුව සමඟ ඇඳ උඩ දමා තිබුණි. බෝතලයේ සේලයින් බටේ දිගේ විත් ඇඳ රෙද්ද තෙත් කරමින් තිබුණි.

"කෝ දරුවා.......?" මම යටිගිරියෙන් කෑ ගැසුවෙමි.

"දෑඩි සත්කාර ඒකකේ" කවුදෝ කියනු ඇසුණි. වට පිටාව කළු දුමකින් වැසී යනු පෙනිණි. දොස්තරවරුන් මුළු රෝහලට ම බෝම්බ දමා පුපුරුවා සී සී කඩ දිව යනු පෙනිණි. සේලයින් බෝතලයේ අන්තිම බින්දු කිහිපය බටය දිගේ ගලාගෙන විත් ඇඳ මත වැටුණි. උල් කටු ගසන ලද මෝල්ගසක් මගේ කටින් දමා ගුදයෙන් පිටකර දොස්තරත්, මිසීත් දෙපැත්තෙන් අල්ලාගෙන දෙපැත්තට අදින්නාක් මෙන් දැනුණි. මා අවට ඇති සියල්ල කෙමෙන් කෙමෙන් නොපෙනී යන්නටත් යළි පෙනෙන්නටත් විය. බොර දිය කඳකට හසු වී උඩ යන මිනිසකු ලෙස මගේ ඇස් ගිලි ගිලී මතුවන්නට විය.

කවුදෝ මා වත්තන් කර ඇඳ මත තබනවා දැනුණි. මම හිස ඔසවා ඔහු දෙස බැලුවෙමි. උඩ යට ගොස් මතු

sinhalaebooks.com

වන දෑස්වලට දොස්තරගේ සේයාව පෙනුණි. "කෝ දරුවා......? මම ආත්මයේම ශක්තිය එක තැනකට ගෙන ඇසුවෙමි.

"දරුවට එන්නත දුන්නා. සාර්ථකයි."

ඔහු මගේ උරහිස අල්ලාගෙන කීවේය. මම ඔහු දෙස බලා සිටියෙමි.

"දරුවට අමාරු උණා. බලා ඉන්න බැරි තැන ඒක කළේ වාසනාවට ඒක ක්‍රියාත්මක උනා. දැන් සිරිල් බය වෙන්න එපා."

අත් පා තුඩු නහර ගැට අතරින් පිට වන්නට නොහැකිව දඟලූ මගේ ප්‍රාණය එකතු කොට දෙපයට ගෙන මම නැඟී සිටියෙමි. කඳ මැදින් දෙකට කපන ලද දෙපත් නාගයකු ලෙස මරණය සමඟ පොර බැදූ මම ඔහුගේ දෙපා අල්ලාගෙන හැඬුවෙමි; කඳුළු ගඟ පිටාර යන්නට දෑස් ඉවුරු කඩා දැම්මෙමි. ඔහුගේ පා ඒ කඳුළින් සේදී යන්නට ඇත. ඔහු මගේ හිස අත ගෑවේය.

sinhalaebooks.com

# පළිගැනීම

සේකර මාමාගේ මිනිය කපන හැටි බලන්නට යෑමට මා කීපවරක් උත්සාහ කළත් අම්මා එය වැළකුවාය.

"පිරිමින්ගෙ මිනී කපනව බලන්න ගෑනු ළමයි යන්නෙ නෑ" අම්මා කීවාය. මම අම්මා දෙස රවා බැලුවෙමි.

"අම්මත් යං" මම අම්මාගේ අතේ එල්ලුණෙමි.

"පිස්සු නැතිව මෙහාට වෙලා ඉඳහං" අම්මා මගේ අත ගසා දැමුවාය. මට අම්මාගෙන් මිදී, මිනිය කපන හැටි බලන්න යෑමට අවශ්‍ය විය.

සේකර මාමගේ මිනිය කපන කාමරයේ ජනේලයක් ඇති බව මට මතක් විය. මම පිළිකන්න පැත්තෙන් ජනේලය ළඟට ගියේ අම්මාට හොරෙන්ය. එහෙත් ජනේලය වසා තිබුණි. මම අත්තිවාරම් බැම්ම උඩට ගොඩ වී ජනෙල් පලු දෙක අතරට ඇඟිල්ල දමා ජනෙල් පලු දෙක ඈත් කිරීමට උත්සාහ කළෙමි. නමුත් ඇතුළත බැලීමට තරම් හිඩසක් එයින් හදාගැනීමට නොහැකි විය. වටපිට බැලූ මට බිත්තියට හේත්තු කර තිබූ ඉදලක් දකින්ට ලැබුණි මම ඉදල් මිට ජනෙල් පලු දෙක අතරට දමා ඉදල එක පැත්තකට නැව්වෙමි. "කටස්" යන හඬක් නැඟුණෙන් මම බිය වීමි. මොහොතකින් ජනෙල් පලු දෙක අතර වූ කුඩා ඉඩ අතරට ඇහැ තබා ඇතුළ බැලුවෙමි. මට සේකර මාමාගේ මිනිය නො පෙනුණි. කීපදෙනකු හිටගෙන සිටින හැටි පමණක්

sinhalaebooks.com

මට පෙනුණි. ජනෙල් පියන් හිඩැසට ඇහැ තබාගෙන ඉදල් මිටෙන් ජනෙල් පියන් දෙක තවත් පළල් කිරීමට උත්සාහ කළත් එසේ කිරීමට නොහැකි විය. මම ඉදල් මිට දමා හදාගත් ඉඩ අතරට දබරැඟිල්ල ඔබාගෙන ඉදල්මිට ගැලෙව්වෙමි. "පටස්" යන හඬින් ජනෙල් පියන් දෙක ඇඟිල්ලේ හැපී නැවතුණි. මගේ ඇඟිල්ල කැඩී යන්නට ඇතැයි සිතුණි. එහෙත් ඒ වේදනාව මම ඉවසාගතිමි. සේකර මාමාගේ මිනිය කපන හැටි පෙනෙන්නේ නම් ඇඟිල්ලට කුමක් වුවත් කමක් නැතැයි සිතුවෙමි. මම අමාරුවෙන් ඇඟිලි හතරක් ජනෙල් පියන් අතරට දමා ජනේලය මෑත් කළෙමි. ඉදල් මිට දමා හදාගත් ඉඩට වඩා ඉඩක් හැදුණත් සේකර මාමාගේ මිනිය නොපෙනුණි. මගේ ඇඟිලිවලින් ලේ බේරෙතැයි මම සිතුවෙමි. මම අනෙක් අතත් ජනෙල් පියන් අතරට දැමීමට උත්සාහ කළත් එසේ කිරීමට නොහැකි විණි. ජනෙල් පියන් දෙක අතර හිර වූ ඇඟිලි හිරිවැටී තිබුණි. මම සේකර මාමාගේ මිනිය යාන්තමින් හෝ බැලීමට උත්සාහ කළෙමි. සුදු නැෂනල් එකක් ඇඳගත් කොරනේල් රාලහාමි හිටගෙන සිටින හැටි පෙනුණි. ඔහුගේ මුහුණ හරිහැටි නොපෙනුණත් ඔහු හා ඇතුළට යනවා මා බලාගෙන සිටි නිසා ඒ කොරනේල් රාලහාමි බව මම තීරණය කළෙමි. මට ඔහු හා කතා කිරීමට ආශාවක් තිබුණි. ඔහු කෙතරම් නිර්භීත ගම්භීර කෙනෙක් විය යුතු ද? ඔහුගේ දෙපා මුල වැඳවැටෙන්නට මට ආශාවක් ඇති විය. ඔහුගේ නිර්භීතකම ඉදිරියේ සේකර මාමා පඹයකු සේ සියල්ල ඉවසා සිටින හැටි දකින්නට මා තුළ වූයේ දැඩි ආශාවකි.

මම ඇතුළේ සිටියා නම් මිනිය කපන්නට කොරනේල්ට උදව් කරමි. ඔහුට අවශ්‍ය පිහිතලය මම

sinhalaebooks.com

වහාම මුව තියා දෙමි. ඔහු ලොකු පිහියක් ඉල්ලන විට මම වඩාත්ම ලොකු පිහිය ඔහුට තෝරා දෙමි. ඔහු එහි මුව අත ඇතැයි කී විටත් මම තවත් මුවහත් කර දෙමි. ඔහු එම පිහියෙන් සේකර මාමාගේ ලොම් පිරුණු පපුව පළන විට කොරනේල්ගේ ගම්භීර මුහුණ දෙස බලා සිටිමි. සේකර මාමාගේ ඇඟෙන් විදින ලේ කොරනේල්ගේ මුහුණට විසි වුවහොත් මම වහාම මගේ ගවුම කොනින් එය පිහ දමමි.

මට ඇතුළට යෑමට ඇති වුවමනාව දැඩි සේ දැනුණි. මට මේ නිසාම අම්මා කෙරෙහි ඇති වූයේ කෝපයකි. මගේ අත හිරිවැටී, එය මොළය දක්වා පැතිරී ඇත. කතුරු පිහි එහාට මෙහාට කරන හඬ මට හොඳින් ඇසුණි. මම ඒ හැම වාරයකම සේකර මාමාගේ මිනිය කපන හැටි මනසින් මවාගතිමි. බෙල්ල ළඟ සිට පිහිතලය ඇදගෙන එන කොරනේල් පෙකනිය දක්වා පිහිතලය ඇද නතර කරයි. අනතුරුව ඔහු දෑතම කැපුම් පාර මැදට දමා දෙපැත්තට හම අදියි. සේකර මාමාගේ බොකු බඩවැල් ඇතුළු අවයව රතුපාට මස් ගුළියක් සේ එළියට පනියි. පිළි ගඳ කාමරය හැම තැනම පැතිරෙයි. සේකර මාමාගේ සිරුරින් ගලන ලේ පාරට පොලිතින් උරයක් තබාගෙන කිසිවෙක් ලේ එකතු කරයි. බොකු බඩවැල් එළියට ඇද කොරනේල් ඒවා එකින් එක පරීක්ෂා කරයි. පරීක්ෂා කර දෙන මස් කැලි තව එකෙක් පනිට්ටුවකට පුරවති. අනතුරුව කොරනේල් බඩ ඇතුළට පුළුන් පුරවා ගෝණි කටුවක් වැනි කටුවක් ගෙන එයට හන නූල් දමා බඩ මසයි......

මගේ දකුණු අත නැතැයි මට එක්වරම සිතුණි. එය ජනෙල් පලු දෙක අතර හිරවී ඇත. එයින් නැඟෙන වේදනාවට වඩා හිසේ කැක්කුම නිසා දැනුණු වේදනාව වැඩිය.

sinhalaebooks.com

ඊළඟට මම ඒ සියලු වේදනා ඉවසාගෙන සේකර මාමාගේ කුකුල් පළන හැටි සිතින් මවාගතිමි. සේකර මාමාගේ ඉකිලියේ ලොකු කැලලක් ඇති බව මම දනිමි. එය උපන් ලපයක් ද කුෂ්ටයක් ද නොව, අමුතු ලපයකි. කළු පාටටත් දුඹුරු පාටටත් අතර පාටක් එහි ඇත. මගේ දබරැඟිල්ල එම ලපයේ එක්කොනක තබා මාපටඟිල්ල අනෙක් කෙළවරේ තැබිය හැකි තරම් ලපය විශාල එකකි. එම ලපය උඩ ඇති කෙස්ගස් මගේ මැදඟිල්ල තරම් උසය. එහි එවැනි උස කෙස් ගස් කීපයක් තිබූ බව මට මතකය. කොරනේල් මේ ලපය දැළි පිහියකින් පතුරු ගසා ගලවා ගන්නා හැටි මැවී පෙනුණි. ඔහු එය ගිනිවතුර භාජනයකට දමා මූඩිය තද කර සේවකයකු අතට දෙයි. ඔහු එය කොරනේල්ගේ ගමන් මල්ලේ පරිස්සමින් තැන්පත් කරයි. කොරනේල් අත් දෙක ඔසවා සියල්ල හමාර බව පවසයි. ඔහුගේ මුහුණ යුද්ධයක් ජය ගත් සෙබළකුගේ මුහුණ මෙන් පිම්බී ඇත. දැවැන්ත කළු ඇතකුගේ ඔළුව පළාගෙන මොළය ඇද ගිල දැමූ සිංහයකුගේ ආඩම්බර ලීලාව ඔහු තුළද ඇත.

මගේ ශරීරයේ සියලු ශක්තිය යොදා ජනෙල් පලු අතර හිර වී තිබූ මගේ අත එළියට ඇද්දෙමි. "පටස්" යන හඬින් ජනෙල් පියන් දෙක වැසී ගියේය. මගේ ඇඟිලි දම්පාට වී තිබුණි. මගේ ඇඟ පණ නැති වීගෙන එන්නාක් මෙන් දැනුණි. මම හිමින් බිත්තිය අල්ලාගෙන කුස්සියට ගියෙමි. කළය උඩ උඩුකුරුව තිබූ පොල්කටුවට වතුර නවාගෙන එක හුස්මට බීවෙමි. එහෙත් එයින් මගේ පිපාසය සංසිඳුණේ නැත. වතුර නවාගැනීමට තරම් ශක්තියක් මට නොවූයෙන් කුස්සිය දිගේ විත් සාලයට ගොඩ වුණෙමි.

sinhalaebooks.com

සේකර මාමාගේ මරණය ගැන රේඩියෝ එකේ ප්‍රවෘත්තිවලට කියන බව කවුදෝ කියනු ඇසුණි. මම අමාරුවෙන් රේඩියෝව ඇති කාමරයට ගියෙමි. එහි කීපදෙනෙක් රේඩියෝව වට කරගෙන සිටි අතර මම ද ඒ පිරිසට එකතු වුණෙමි. හමුදා සේවයෙන් විශ්‍රාම ගෙන සිටි සේකර ජයතිලක සියදිවි නසාගෙන ඇති බව එහි කීවේය.

මට සේකර මාමා එල්ලී මැරුණු කොස් ගහ බැලීමට අවශ්‍ය විය. ඉක්මන් කර මම ගෙයින් එළියට ආවෙමි. ශරීරය අප්‍රාණික වී ගොස් තිබුණත් හිතේ හයියෙන් මම දෙණිය පැත්තට දිව්වෙමි. ගොක් අතු කපාගෙන එන කීපදෙනකුත්, මිනීවළ කපන්නට ගොස් එන කීපදෙනකුත් මට අතරමග දී හමු වූවත් ඔවුන්ගේ මුහුණු නොබලාම දෙණියට දිව්වෙමි.

රැහැයියන් කෑගසන හඬත් කපුටන් කෑගහන හඬත් මට හොඳින් ඇසුණි. සේකර මාමාගේ මිනියෙන් පිට වූ ලේ අහසට විසි කර ඇතිවාක් මෙන් අහස රතුපාට වී තිබුණි. කොස් ගසේ අත්තක එල්ලෙමින් තිබූ කඹය මම දුටුවෙමි. එය සේකර මාමා එල්ලී මැරුණ කඹය විය හැකි ය යි සිතුවෙමි. එය අතගා බැලීමට මට අවශ්‍ය විය. මම එයින් දෑස් මෑත් කර කොස් ගස දෙස බැලුවෙමි. මම කොස් ගහ මුලට ගොස් ගහේ කඳ අත ගෑවෙමි. එහි පතුරු ගැලවී රතුපාට හම මතු වී ඇත. මම නියපොතු ගසාගෙන එයින් කෑල්ලක් කටේ තබාගෙන හැපුවෙමි. නෙල්ලි ගෙඩියක රසයක් එයින් දැනුණි. මම කෙළ ගිල්ලෙමි. සටාස් සටාස් ගාමින් වවුල්ලු කොස් ගහේ අතු අතරින් එහාට මෙහාට පියඹති. මම ගලක් අහුලාගෙන වේගයෙන් වවුලකු ඉලක්ක කොට ගැසුවෙමි. ගල අහකට විසි වී ගිය අතර වවුලා මගේ ඔළුව ළඟින් පියඹා ගියේය. මම තවත් කොස් පොතු

sinhalaebooks.com

කැල්ලක් කටේ දමාගෙන කොස් ගහට දකුණු පැත්තෙන් වූ මැස්සේ වාඩි වුණෙමි. එය සේකර මාමාගේ මිනිය තබා තිබූ තැනයි. මැස්ස උඩ මිනිය තබා තිබූ හැටිත් මිනිය වට කරගෙන ගැහැනුන් පිරිමින් ඇඬූ හැටිත් මතක් වන්නට විය.

සේකර මාමා එල්ලී මැරුණු ආරංචිය අපේ ගෙදරට ගෙනාවේ තාත්තාය. ආරංචිය කන වැටුණු ගමන් ඇඳගෙන සිටි රෙද්ද පිටින්ම අම්මා විලාප නගමින් එහි දිව්වාය. තාත්තා මටත් කතා කළේය. මම පසුව එන බව කියා නැවතුණෙමි. තාත්තාද ඉක්මනින් එහි ගියේය. මම ඉන් ටික වේලාවකට පසු මුහුණ කට සෝදාගෙන අලුත් ඇඳුමක් අඳගෙන එහි ගියෙමි.

මම එහි යන විට සේකර මාමාගේ මිනිය මැස්සට බා තිබූ අතර, පොලිස්කාරයෙක් ද එහි සිටියේය. මම මිනිය දෙසත් පොලිස්කාරයා දෙසත් මිනිය බදාගෙන අඬන නැන්දා ඇතුළු ගැහැනුන් දෙසත් වරින් වර බැලුවෙමි. ඒ සියලු දෙනා අතරින් දෑවැන්ත කොස් ගහත් එහි අත්තක එල්ලෙමින් තිබූ කඹ කැල්ලත් දුටුවෙමි.

මම එහි සිටි කාලය තුළ බොහෝ දෙනකු අනිත් වැඩපළ සඳහා එහාට මෙහාට ගිය අතර, පොලිස්කාරයා මිනිය මුර කළේය. නැන්දා වත්තන් කරගත් ගැහැනියක් දෙණිය දිගේ ගේ පැත්තට ගියාය. එහි ඉතුරු වූයේ මාත් අම්මාත් තවත් කීපදෙනකුත් පමණි.

මම යළිත් සේකර මාමාගේ උඩුකය නිරුවත් මළ සිරුර දෙස බලා සිටියෙමි. ඔහුගේ ඇඟ දිගේ යන දිමියකු අල්ලා ඇඟිලි තඩුවලින් පොඩි කර දැමුවෙමි.

sinhalaebooks.com

මම මැස්සෙන් බැස දෙණිය දිගේ ගොස් කුස්සිය පැත්තෙන් ගෙට ඇතුළු වන විට සුදු ඇඳුම් ඇන්දූ මිනිය පෙට්ටියක දමා සාලයේ තබා තිබුණේය. නැන්දා නාහෙන් අඬමින් කවුදෝ සමඟ කතා කරකර සිටියාය. සේකර මාමාගේ ඉහ ඉද්දර පිත්තල පහනක් දැල්වෙමින් තිබුණි.

මට සේකර මාමාගේ මිනියෙන් පෝමලින් සුවඳ දැනුණි. එය සුවඳක් නොවූව ද නාස්පුඩු අතරින් රිංගා පපුවට කිඳා බසියි. ඉව අල්ලන සතකු මෙන් මම පෝමලින් සුවඳ රැඳි වාතය නාස්පුඩු අතරින් වැඩිපුර ගෙන පපුව තුළ සිර කරගත්තෙමි. ඉඳහිට ගේ තුළට වදින සුළඟ පහන් දැල්ල අඩු වැඩි කරමින් පලා ගියේය. සේකර මාමාගේ මිනියට උඩින් ඇති පියනේ වටේට එල්ලන ලද වතුසුද්ද මල් මලානික වී තිබුණි. ඒවා පර වී ඇත්තේ සේකර මාමාට ඇති බියට යැයි මම සිතුවෙමි. ගෙට එන සුළඟට හසුවූ මලානික මල් වැල් ඒ මේ අත පැද්දෙයි. මම ඒ මල් වැල් දෙස බලාගෙන සිටියෙමි. ඒ මල් වැල්වලට වතුර ඉසිය යුතු යැ යි සිතුණත් එයින් පලක් නොවේ යැයි මම කල්පනා කළෙමි. මම මිනිය දෙස යළි බැලුවෙමි. සුදු ඇඳුම් සේකර මාමාට නොගැළපෙතැයි මම විශ්වාස කළෙමි. පූජකයකුගෙන් ගලවාගත් සුදු ඇඳුමක් ඔහුට අන්දවා ඇතැයි සිතුණි.

සේකර මාමාගේ අවසන් කටයුතු දා සේකර මාමාගේ ගුණ කියමින් හාමුදුරු නමක් බණ දෙසූහ. මම ඒ කතාවට ඇහුම්කන් දීමට උත්සාහ නො කළෙමි. මම ඇස් පියාගෙන කොරනේල්ගේ රූපය මවා ගැනීමට උත්සාහ කළෙමි. කොස් ගහ, මැස්ස, පෝමලින් සුවඳ, කොරනේල්, පොලිස්කාරයා වරින් වර මගේ මනස තුළ සක්මන් කළේය. පැන් වඩන විට නැන්දා විලාප දෙමින්

sinhalaebooks.com

ඇඬුවාය. පෝච්චියේ තිබුණු වතුරින් හිස් කෝප්පය පිරී ඉතිරී ගියේය. අනතුරුව අනිත්‍යතාව පිළිබඳ ව තවත් හාමුදුරුනමක් දෙසූ බණට මම ඕනෑකමින් කන් දුන්නෙමි.

සුදුපාට ඉටිරෙදි ගැසූ චිතකය වටේ මිනිය කර තියාගත් පිරිස තුන්විටක් ගමන් කළහ. මිනියට ගිනි තියන්නට තදබල ආශාවක් මා හට ඇති විය. එහෙත් මම එය මැඬගෙන බලා සිටියෙමි. මම සියලුදෙනා අතරින් රිංගා චිතකය අද්දරට ම ගියෙමි. නැන්දාත් බොහෝ ගැහැනුත් විලාප නඟමින් අඬන හැටි මට පෙනෙයි. සුදු ඇඳගෙන හිසේ තලප්පා බැඳගත් දෙදෙනකු ගිනිපන්දම් දෙකක් ගෙන චිතකය වටේ දුවන හැටි මම බලා සිටියෙමි. මාමාගේ මිනිය පිච්චීම සඳහා අවසර ලබා දී තිබුණේය. මිනිය භූමදාන කරනවාට වඩා පිච්චීම ගැන මගේ සිත තුළ තිබුණේ සතුටකි. පන්දම් දෙක ගත් දෙදෙනා දුවන වේගයට පන්දම් දෙකේ ගිනිදැල් වැඩි වෙමින් තිබුණි. සියලු දෙනාගේ විලාප හඬ මැද ඔවුහු සේකර මාමාගේ මිනියට ගිනි තිබ්බෝය. හිමින් දුම් දමමින් චිතකය ඇවිළෙන්නට විය. දවුල්වල සුදු රෙදි බැඳගත් හේවිසිකාරයෝ මළබෙර වැයුවෝය. සුදු ඉටිරෙදි පිච්චි පිච්චී කුඩාවට නැගුණු ගිනි දැල් ටිකෙන් ටික විශාල වන්නට විය. චට පට ශබ්දය ගිනි දැල් නගින ශබ්දය සමඟ එකතු වී තිබුණි. තුන්වෙනි මාලයේ ඉටිරෙදි රීප්ප පටි පිච්චි පිච්චී ගිනි ගොඩට වැටුණි. මාල තුනේම ඉටිරෙදි පිච්චුණත් සේකර මාමාගේ මිනිය නොදුටුවෙමි. ගිනි ගොඩ මැද තිල්පාටට නැගුණු ගිනි දැල්ලක් දුටු කෙනෙක් "දැනුයි ඔන්න මිනියට ගිනි ඇවිළුණේ" යැයි කීවේය. මම ගිනි රස්නය නොතකා තව ටිකක් ළං වුණෙමි. දර අඟුරු ගිනිදළු මැදින් සේකර මාමාගේ මිනිය පිච්චෙන හැටි බලන්නට මට හොඳටම

sinhalaebooks.com

වුවමනාව තිබුණි. ගිනි රස්නයත් ඒ සමඟ සුළඟේ පාත්වෙන අළුත් මගේ ඇඟේ වැදෙයි. නිල්පාට ගිනි දැල් අතරින් තද රතු පාට ගිනි ගුළියක් එකවරම මතු විය. මා ඒ දෙස බලනවාත් සමඟම සිහි වූයේ සේකර මාමාගේ ඉකිලියේ ඇති ලපයයි. එය පිච්චෙන්නට ඇතැයි මම සිතුවෙමි. මගේ ඇස් නිලංකාර වී තිබුණි. වුවමනාවෙන් නැඬුවත් ඇස් අගින් කඳුළු පිට වන බව තේරුණි. මා කෙතරම් උත්සාහ කළත් ඔහුගේ මිනිය පිච්චෙන හැටි වත් ඉකිලියේ ලපය පිච්චෙන හැටි වත් බලාගැනීමට නොහැකි විය.

පිරිස ටිකෙන් ටික අඩු වන්නට විය. නොපිච්චුණ දර කොට ගිනි මැලයට තල්ලු කරමින් නාකි මිනිසෙක් ගින්න නොනිවා රැකගැනීමට උත්සාහ කළේය. නැන්දා ද ඔහු ළඟට වී සිටියාය. නාකි මිනිහා ගිනි ගොඩ ඇවිස්සීම නිසා ගිනි ගොඩින් නැඟෙන අළු මගේ ඇස්වල වැදීමෙන් ඇස් පුපුරු ගසන්නට විය. මම එතැනින් ඉවත් වී, අම්මා සමඟ ගෙදර ආවෙමි.

මූණ වත් නොසෝදා ඇඳට වැටුණු මගේ හිස පුපුරු ගසමින් තිබුණි. ඇස් ඇතුළේ මිරිස් කුඩු වැටුණාක් මෙන් ඇස් දෙක දැවිල්ල ගෙන තිබුණි. මට යළිත් නිල්පාට ගින්දර අතරින් මතු වූ රතු පාට ගිනි ගුළිය මතක් විය. ඒ සමඟම කොරනේල්ගේ තේජවන්ත රූපය මගේ ඇස් ඉදිරිපිට මැවී පෙනෙන්නට විය. රතු ගිනි ගුළිය සිහි කිරීම වෙනුවට මම කොරනේල්ගේ රූපයත් කොස්ගහත් සිහි කිරීමට උත්සාහ කළෙමි.

sinhalaebooks.com

# උපන් ලපය

අපේ තාත්තාගේත් ඔහුගේ සහෝදරසහෝදරියන් තුන්දෙනාගේත් උපන් ලප ඇත. මෙවැනි උපන් ලපයක් පියාගේ මුහුණේ ද තිබුණු බව තාත්තා කීවේය. මේ උපන් ලප ඔවුන්ගේ මුහුණුවලත් ශරීරයේ වෙනත් තැන්වලත් තිබුණි. කෙසේ හෝ මේ උපන් ලප දෙවැනි පරම්පරාවේ ද කිහිපදෙනකුගේ ශරීරවල තිබීම ගැන තාත්තා බෙහෙවින් සතුටු වූවේය. දෙවැනි පරම්පරාවට අයත් වූයේ මාත්, මල්ලීත්, බාප්පලාගේ හා ලොකු තාත්තාගේ දරුවෝත්ය. මේ සියලු දෙනාගේම උපන් ලප නොවුණත් මගේ ඉණේත් බාප්පාගේ දුව වන මංගලිකාගේ මුහුණෙත් වම් කම්මුලේ පහළත් උපන් ලප තිබුණි. මේ උපන් ලප පිහිටීම පරම්පරාවෙන් පරම්පරාවට දිගටම යන බව තාත්තාත් නිතරම කියනු මට ඇසී ඇත.

"අපේ ලේ නෑයෝ අඳුරගන්න තියෙන සලකුණ තමයි ඔය උපන් ලපය" බාප්පා තාත්තා සමඟ උජාරුවෙන් කීවේය.

මේ උපන් ලප කතා ගැන මාගේ කුඩා කාලයේ එතරම් දැනීමක් නොතිබුණ ද මා පාසලේ ඉහළ පන්තිවලට සමත් වෙමින් දැනුම් තේරුම් ඇති කාලය වන විට අපේ පවුලේ අය පමණක් නොව, පිට අයත් මේ උපන් ලප කතාව ගැන කතා කරන බව මට තේරුම් ගියේය. මගේ උපන් ලපය ඉණේ තිබෙන බව මම කිසි කෙනකුට නො

sinhalaebooks.com

කියා තිබුණත් තාත්තා එය හැමෝටම කියා ඇත. මේ නිසාම පාසලේ ළමයි බොහොමයකටත්, ගුරුවරුන් කිහිප දෙනකුටත් ඉණේ ඇති උපන් ලපය පෙන්වීමට සිදු විය. මගේ උපන් ලපයත් මුහුණේ තිබුණා නම් එය ආඩම්බර වීමට තරම් කරුණක් බව මම කල්පනා කළෙමි.

මංගලිකා ඉගෙනගත්තේ මට වඩා පහළ පන්තියකයි. ඇගේ උපන් ලපය මුහුණේ තිබෙනු දකින විට සියුම් ඊර්ෂ්‍යාවක් මා තුළ උපදින්නට විය. ඒ නිසාම මගේ උපන් ලපය ඉණේ පිහිටියේ පවක් නිසා බව සිතන්නට මම පෙලඹුණෙමි. මා උසස් පෙළ විභාගයට වාඩි වන විට මංගලිකා සිටියේ මට පහළ පන්තියේය. ඇයට උසස් පෙළ විභාගය සමත් වීම සඳහා මගේ විභාගයෙන් පසුව උදව් කළ යුතු බව බාප්පා නිතර ම කීවේය. මා සාමාන්‍ය පෙළ විභාගය ද ඉතා ඉහළින් සමත් වීම පිළිබඳව බාප්පාද බෙහෙවින් සතුටු වන බව ඔහුගේ කතාවෙන් මට තේරුණි.

මා මගේ විභාගයෙන් පසු නිතර හවස්වරුව ගත කළේ බාප්පාගේ ගෙදරය. මංගලිකාට පාඩම් කියාදීමේ රාජකාරිය පළමුවෙන් කරදරයක් සේ දැනුණත් පසුව මම ආශාවෙන් ඈට පාඩම් කියා දුන්නෙමි. පාඩමින් වෙහෙසවන විට මම මංගලිකා සමඟ ගඟට ගොස් වතුර නෑවෙමි. එයත් ක්‍රමයෙන් දිනපතා සිදු වන දෙයක් බවට පත්විය. අපට පාඩමින් වෙහෙසක් නොදැනුණ ද ගඟේ නෑමට යාම සිරිතක් කරගත්තෙමු.

මංගලිකා සමහර විටක මට වඩා දිය යට කිමිද සිටියි. ඈ දිය යට ගිය විට මට ගණන් කරන්නට කියයි. මම දිය යට ගිය විට ඈට ගණන් කරන්නට කියමි. මා පරදින වාර ගණන වැඩි වන විට මම හොරට ගණන් කර ඇයව

sinhalaebooks.com

පරද්දමි. එවිට ඇය මට "හොරා හොරා" කියමින් දියට පැන එගොඩ පීනයි. මමත් ඈ පිටුපසින් පීනා එගොඩ යමි. ගඟ අයිනේ සරුවට වැඩුණු බටතුඹ ගහකින් ගෙඩි කිහිපයක් කඩා මම ඇයට දෙමි. ඈ මා ගහට නඟින විට "පරිස්සමින් පරිස්සමින්" යැයි කෑගසයි. මම වීරයකු ලෙස බටතුඹ ගෙඩි කඩා ඇගේ අතට දමමි. ගහ උඩ සිට අතට දමන බටතුඹ ගෙඩි සමහර ඒවා අතින් දියට වැටී පාවන විට ඇය පිහිනා ගොස් ඒවා එකතු කරයි. මම හිතා මතාම බටතුඹ ගෙඩි කඩා එහාට මෙහාට විසි කරමි. ඇය නෝක්කඩු කියමින් එහාට මෙහාට පනිමින් ඒවා එකතු කරයි. ඇය දියට ඇඟි රෙදිපට වතුරපාරට හසු වී උඩට ඉස්සෙයි. ඈ හතික දිය යට ගොස් රෙදිපට හදාගෙන දිය මතුපිටට එයි. මම බටතුඹ ගහේ පහළ අත්තකට බැස ඈ අහක බලන විට දියට පනිමි. එය මා මුලින්ම කළ දවසේ ඈ කෑගැසුවාය.

"මම බය වුණ තරමක්!, එන්න එපා විහිළුවට, හොරා!" කියමින් ඈ අතේ ගුළි කරගෙන සිටි බටතුඹ ගෙඩියකින් මගේ මුහුණට ගැසුවාය. මම දිය යට කිමිදී ඇගේ කකුලෙන් ඇදගෙන දියඹට ඇදුණෙමි. ඇයත් ඒ සමඟම දිය යට කිමිදී මාව කොනිත්තා අහකට පිහිනුවාය.

මංගලිකාට පාඩම් කියා දීමට වඩා ගඟේ නාන්නට යෑමෙන් මම ලොකු සතුටක් ලැබුවෙමි. සමහර දිනක ඇස් රතු වන තුරු ගඟේ කාලය ගත කරන අපි ගෙදර විත් බාප්පාගෙන් බැනුම් ඇසුවෙමු. පුංචි අම්මා එවිට අපේ පැත්තට කතා කරයි.

"මොනව උණත් ඉතිං මේකිට වෙන අයිය කෙනෙක් ඉන්න එකක් යැ?" බාප්පා ද එය අනුමත කරමින් සිනාසෙයි.

sinhalaebooks.com

දිනක් මම මංගලිකාට මට "අයියේ" කියා ඇමතීම ගැන විරුද්ධත්වය ප්‍රකාශ කළෙමි. එය මා කලක සිට කීමට සිතාගෙන සිටි දෙයකි.

"ඇයි ඒ?"

"මං දන්නෑ, මං ආස නෑ" මම කීවෙමි. මා ඇට "නංගී"යැයි ඇමතීම නතර කළේ කල්පනාකාරී වීමෙන් පසුව මේ දිනයේ යැයි මතක තබාගත හැකි දිනක නොවූවත් මංගලිකාට පාඩම් කියා දීමට පැමිණීමෙන් පසුව බව මට විශ්වාසය. එය ඉබේට ම නතර වන්නට ඇත. පසුව කෙසේවත් එසේ නොකීමට මම ප්‍රවේසම් වීමි. පාසලේ දී නම් මා ඇට ඇමතුවේ "නංගී" යන නමින් නොවන බව හොඳට මතකය. එහෙත් බාප්පා ළඟ සිටින විටක මට "මංගලිකා" යැයි නම කියා ඇමතීමට බියක් දැනෙයි. එවිට මම ඇයට ආමන්ත්‍රණයක් නොකර පාඩම් කියා දෙමි. එක්කෝ "මේ" යන වචනය පමණක් පාවිච්චි කිරීමට ප්‍රවේසම් වීමි.

මංගලිකා මගේ යෝජනාවට කැමති වූයේ මගේ පෙරැත්තය නිසාය. ඇය ගඟේ දී නාන අතරත් ඊට හේතුව අසයි. මම එයට පිළිතුරක් නො දී, දිය යටින් ගොස් ඇගේ කකුලෙන් අදිමි. එවිට ඇය සමහර විට පිට මැදට අත්ලෙන් කිස්කන්නට පහරක් ගසා මා වළකයි. මංගලිකාගේ විභාගය ළං වන විට මා රාත්‍රිය ගත කළේ ද වැඩිපුරම එහි මය. රෑ එකොළහ පමණ වනතෙක් පාඩමක් කියා දීම මා අතින් සිදු වෙයි. ඈ ඉතා උනන්දුවෙන් ඒවාට සවන් දෙයි. ඇයට විභාගය ඉහළින් සමත් වීමට දැඩි ආශාවක් තිබුණු බව ඈ පාඩම් කරන විදියෙන් මට තේරුණි. එවැනි විටක මා විහිළුවක් කිරීමට උත්සාහ ගත්තත් ඇය ඊට අනුබල

sinhalaebooks.com

නොදී, කරන වැඩය දිගට ම කරගෙන යයි. මට එයින් තරහ එන අවස්ථා ද නැතුවා නොවේ.

මංගලිකාගේ මුහුණේ වූ උපන් ලපය මට විශේෂ වී පෙනෙන්නට වූයේ මේ අතරය. පාසලේ දී මට ආඩම්බරයක් වූ ඒ උපන් ලපය දැකීම දැන් මට ඉතා අප්‍රියජනක වී ඇත. උපන් ලපය හා සම්බන්ධ අපේ පරම්පරාවේ කතාව තාත්තා හෝ බාප්පා ඉඳහිට කියයි. මා එවිට තදබල කෝපයක් ඇති වෙයි.

"වීරසේකර පරම්පරාව හඳුනගන්න තියෙන ලකුණ, ලේ නෑයෝ හඳුනාගන්න තියෙන ලකුණ" මේ කතා ඇසීම මට ඉතා පිළිකුල් සහගත වීමට හේතුව කුමක් දැයි මට ම නො තේරෙයි. ඒ හැම විටකම මංගලිකාගේ මුහුණේ ඇති උපන් ලපය මකා දැමීමට ක්‍රමයක් මගේ සිත හොයයි.

මංගලිකා විභාගයට වාඩි වීමෙන් පසු ව මට ඈ මුණගැහුණේ කලාතුරකින්ය. ඇය දකින්නට මා තුළ ඇති ආශාව උපන් ලපය නිසා එකවර ම නැති වී යයි. ඒ උපන් ලපය ඇගේ මුහුණට අවලස්සනක් නොව, ඇස්වහ කටවහ වදිනවට තැබූ තිලකයක් බව පුංචි අම්මා සමඟ තව ගෑනියක් කියනු මට ඇසී ඇත. ඒ දිනවල මට ද පෙනුණේ එසේය. එහෙත් පසුව එය මගේ හිතට වද දෙන ලපයක් විය.

සමහර දිනක මම මංගලිකාගේ මුහුණ සිහිනෙන් දුටුවෙමි. එහි ඇති උපන් ලපය ලොකු වී, මුළු මුහුණම කළුපාට වී යක්ෂ මුහුණක් මෙන් වෙනස් වෙයි. එවිට බිය වී ඇහැරෙයි. දාඩිය දැමීමෙන් තෙත් වූ මගේ කය අප්‍රාණික වී යයි. සමහර දිනක ඒ උපන් ලපය නැතිව ඇගේ මුහුණ සිහිනෙන් පෙනෙයි. එදාට අවදිවන්නේ අම්මා ඇවිත් ඇහැරවූ පසුවයි.

sinhalaebooks.com

මංගලිකාට දිනක් මම ගඟට එන්නට කීවෙමි. ඇය කී වෙලාවට ද කලින් එහි පැමිණ සිටියාය.

"මංගලිකා, ඔය උපන් ලපේ නැති කරගන්න මොකක් හරි කරමු."

"ඇයි! කැත ද මේක තියෙන කොට?"

"නෑ නෑ. ඒ උණාට මම කැමති නෑ ඕකට"

"ඒක නැති කරන්න පුළුවන් ලපයක් නොවෙයි මං හිතන්නෙ" ඇය බිම බලාගෙන කීවාය.

"අපි ඩොක්ටර් කෙනෙක් මුණගැහෙන්න යමු."

"තාත්තා කැමති වෙන එකක් නෑ. තාත්ත කියන්නෙ අනිත් සහෝදරයන්ගෙ දරුවන්ට ඒ උපන් ලපය නැති එකේ පාඩුව. එහෙම එකේ මගේ උපන් ලපය මකන්න කැමති වේවි යැ?"

"අපි හොරෙන් යං" මම උද්යෝගයෙන් කීවෙමි.

ඇය ගං ඉවුරේ වැලි තලය උඩ වාඩි වී සිටියාය. මම ද ඇය අසලින් වාඩි වී සිටියෙමි. ඇගේ මුහුණේත් මගේ මුහුණේත් වෙනදාට වඩා ගැඹුරු බවක් ඇතැයි මට සිතුණි. ඇය වැලි දිගේ ඇගේ දෙපා ලිස්සවමින් වතුරේ ඔබා ගත්තාය. මම තවත් ඇයට ළං වුණෙමි. මගේ මුළු ඇඟම හිරිවැටී ඇතිවාක් මෙන් මට තේරුණි. පිට දිගට කඩා දමූ දිගු කෙස්වැටිය සමඟ පොර බදන සුළඟ වරෙක ඒ කෙස් ගස් කිහිපයක් මගේ මුහුණට ළං කළේය. ඇය දකුණතින් හිමින් යළිත් කොණ්ඩය ඇද, අනෙක් උරය මත දමාගත්තාය. අත් දෙක යටින් මුළු ඇඟම වැහෙන්නට ඇඳි දිය රෙද්ද ඇගේ දෙපාවල අඩක් මට පෙන්නුවේය.

sinhalaebooks.com

"මංගලිකා" මම වටපිට බලමින් ඇයට හිමින් ඇමතුවෙමි. ඇය මගේ මුහුණ දෙස බැලුවාය. මට ඇගේ මුහුණ දෙස බලා සිටීමට තදබල ආශාවක් තිබුණ නමුත් ඇගේ උපන් ලපය දැකීමත් සමඟ ඒ ආශාව වියළී යයි. මම සුළඟින් ඒ මේ අත ගසාගෙන යන බටතුඹ කොළයක් අහුලාගතිමි. එහි එක පිටක කෙළ ගා එක්වරම මංගලිකාගේ මුහුණේ ඇති උපන් ලපය මත තබා තද කළෙමි. ඇය කිසිත් නොදොඩා ඇගේ යටිපතුල්වලට කොටන පුංචි මාළු පැටවුන් දෙස බලා සිටියාය. මම අත ඉවතට ගෙන බටතුඹ කොළයෙන් වැසුණු ඇගේ මුහුණ දෙස බලා සිටියෙමි. ඇය යාන්තමින් සිනා සෙන්නට උත්සාහ කළාය. මම හිමින් ඇගේ අත ගෙන, මගේ ඔඩොක්කුවේ ඔබාගත්තෙමි. තොටුපළට නාන්නට එන කිසිකෙනකු මේ වෙලේ නැති බව මම දන සිටියෙමි. එහෙත් මගේ සිතට යම් බියක් දැනෙන්නට විය. ඇය ද ඒ බියෙන් පෙළෙන බව මට දැනුණි. ඒ බිය අතරින් අපට දැනුණු සතුට අපේ මුහුණුවලින් අප දෙදෙනාටම පෙනුණි. මම මගේ අතින් ඇගේ අත්ල පිරිමැද්දෙමි. ඈ එයින් සුරතල් වන්නට ඇත. ඈ හිමින් හිමින් හිස පහත් කර, මගේ වම් උරයට බර වූවාය. ගිනියම් අව්වට රත් වූ වැලි තලයේ අපට වාඩි වී සිටීමට බැරි විය. වතුරත් අප වාඩි වී සිටි වැලි තලයත් අතර පරතරය අඩි කිහිපයකි. ඇය තවමත් දියට කකුල් දමාගෙන සිටී. එහෙත් අපේ මුළු ඇඟම රත් වූ වැල්ලෙන් පීඩාවට පත් වී ඇත.

මංගලිකාගේ මුහුණේ ඇලවූ බටතුඹ කොළය ගැලවී බිම වැටුණි. මම වහාම මගේ අත ඇගේ අතින් මෑත් කරගත්තෙමි. මට තවත් ඇගේ මුහුණ බලා සිටීමට නොහැකිය. මම ඇගේ දෙපා දෙස බැලුවෙමි. පුංචි මාළු පැටවු වට වී අගේ යටි පතුලටත් උඩු පතුලටත්

sinhalaebooks.com

කොටති. ඇයට ඉන් වේදනාවක් දැනුනා නම් එය උඩට ගත යුතුය. ඈ මාළුන්ට කොටන්ට හැර ඒ දෙස බලා සිටියාය. මම එතනින් නැඟිට වතුරට පැන්නෙමි. මම එගොඩට පීනනතුරුත් මංගලිකා වතුරට නො පැන්නාය. මම එගොඩට ගොස් බටතුඹ ගහට ගොඩ වූයෙමි. එහි ඉහළම අත්තට නැඟ වතුරට පැන්නෙමි. මංගලිකා තාමත් හිටි ඉරියව්වෙන්ම වාඩි වී සිටියි. මා දිනක් බටතුඹ ගහෙන් පනින විට ඇය කෑගැසූ හැටි මට මතක් විය. එහෙත් අද ඈ නිසොල්මන්ව සිටී.

"මංගලිකා, එන්න පීනල මෙහාට. බටතුඹ පිරිල ගහේ" මම හයියෙන් කෑගැසුවෙමි. ඇය එක්වරම හිස ඔසොවා මා දෙස බැලුවාය. මම නැවතත් "මංගලිකා එන්නකෝ" යැයි කෑගැසුවෙමි. ඇය කිසිත් නොදොඩා හිස පසෙකට හරවාගෙන බලා සිටියාය. මම දිය යටින් පීනා මෙහා ඉවුරට ආවේ ඇගේ නිහැඬියාව නිසාය.

"අපි නාන්නැද්ද?"

"අයිය නාන්න."

"අයිය...... නාන්න."

මට එක්වරම ඈ කියූ දෙය නැවත කියවුණි. මට මා ගැනම අනුකම්පාවක් ඇති විය.

"අපි අමතක කරමු හැම දෙයක්ම නංගී. ඔයාගෙ උපන් ලපය ඔහෙ තිබ්බිච්චාවෙ. අපි නාගෙන ගෙදර යං. ආයි කවදා වත් බටතුඹ කඩන්න එගොඩහට නොගිහින් ඉමු" මම බිඳුණු හඬින් කීවෙමි.

sinhalaebooks.com

# දුක් විඳින හදවතක්

මම මහා පව්කාරයෙක්මි. ඒ පව්කාරකම මා විසින් කරනු ලැබුවේ මීට ටික කලකට පෙරය. උගත්කම, බුද්ධිය, සමාජ මට්ටම විසින් ඒ පව්කාරකම කිරීම සඳහා මගේ මනස මෙහෙයවනු ලැබීය. සැබැවින් ම ඒ නිසා ම මම අද පසුතැවිල්ලටත්, කලකිරීමටත් පත් වී සිටිමි.

පන්සලට ගොස් ලොකු හාමුදුරුවන්ගේ දෙපා අල්ලා සමාව ගැනීමටත්, ගමේ වැඩිහිටියන්ගෙන් සමාව ගැනීමටත් මගේ සිත මට බල කරයි. මා එසේ කළ යුතුය. නැති නම් මේ පාපකර්මයෙන් මට ගැලවීගත නොහැකි යැයි යන හැඟීම මා තුළ පවතී.

ගැමියාගේ දුක් වේදනා භාර ගැනීමට සැදී පැහැදී සිටි රූස්ස නුග ගස මගේ මෙහෙයවීමෙන් පසුගිය කලක බිම හෙලනු ලැබීය. ඒ නුග රුක නැති වීමේ පාඩුව අද මට සියල්ලට ම වඩා තදින් දූනේ. ඒ මගේ මානසික වේදනාව කියාගන්නට අද කෙනකු නැති නිසාය. එහෙයින් මා විසින් කරන ලද ඒ පව්කාර ක්‍රියාව ඔබට කියන්නට අදහස් කළෙමි. ඔබ මට සමාවක් දුන්නත් නුදුන්නත්, මා මෙය කිව යුතුව ඇත. පරිගණක වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් සිටි දියණිය මට කතා කළාය. මම පරිගණකය ඉදිරිපිට වූ අනෙක් පුටුවේ වාඩි වුණෙමි. දුව පරිගණකයෙන් නොයෙක් ප්‍රයෝජන ගැනීම පිළිබඳ ව මා තුළ වූයේ දැඩි සතුටකි.

sinhalaebooks.com

"ඇයි දුව?"

"තාත්තට තෑන්ක්ස් මට කොම්පියුටරයක් අරන් දුන්නට!"

"ඕක කියන්න ද කතා කෙරුවේ?"

"නැහැ තාත්ති, තාත්ති මට කොච්චර ආදරේ ද කියල දැනගන්න"

"ඉතින් දුව, ඕක මං අමුතුවෙන් කියන්න ඕනැයි?. දුව දන්නව නේ මං දුවට කොච්චර ආදරේද කියල" ඈ පරිගණක තිරය දෙස බලාගෙන සිටියාය. ඇත්තටම මේ පරිගණකය දුවට අරන් දුන්නේ කොතරම් අමාරුවෙන් ද? මගේ පඩිය ජීවත් වීමටත් නො සෑහේ. මම ආයතනයෙන් ණයක් ගෙන දුවට මේ පරිගණකය රැගෙන දුන්නේ ඇය මගේ එකම දරුවා නිසාය. මේ පරිගණකය අරගෙන දීමේ වැදගත්කම ඇගේ පාසල් ගුරුවරුන් මට වටහා දීමෙන් පසු, ණය වී හරි එය අරගෙන දිය යුතු යැයි මම තීරණය කළෙමි. ඔවුන් එදා කී පරිදි දුව අලුත් ලෝකයක අත්දැකීම් එකතු කරමින් සිටින්නේ යැයි හැඟීම මා තුළ ඇති වුණි.

"තාත්තා ඇත්තටම මට ආදරෙයි ද?" දුව නැවත වතාවක් එසේ ඇසීමෙන් පසු මගේ හිත නොසන්සුන් විය.

"ඈ......ඇයි දුව එහෙම අහන්නේ? දුවට විශ්වාස නැද්ද?"

"නෑ තාත්ති ඇත්තටම මට ආදරෙයිද කියල ඕන නම් මේ කොම්පියුටරයෙන් දැනගත හැකි!" දුව මෙසේ කියද්දී හිත කීරිගැහී ගියේය. දුවට මගේ ආදරය සැකයක් වී ඇද්ද?

sinhalaebooks.com

අම්මා නැති වුණ දා සිට මගේ ඇස්දෙක වගේ රැකගත් මගේ දුව ආදරය ගැන ප්‍රශ්නයක් කරගෙන ඇද්ද? ඇට මා දක්වන ආදරය ඇට විශ්වාසයක් නැද්ද? ඈ එය පරිගණකයෙන් දැනගැනීමට උත්සාහ දරන්නේ ඒ නිසාද? මගේ වචනයට වඩා ඇය ඒ පරිගණකය කියන දේ විශ්වාස කරන්නේ ඇයි?

"දුව, මොනවද මේ කියවන්නේ? ඔයාට ලැජ්ජ නැද්ද මාව පරිගණකයට දාල පරීක්ෂා කරන්න?"

"තාත්ති, මං කිවුවේ විහිළුවට. තාත්ති මට ආදරේ බව දන්නවා. ඒත් ඕනි නම් ඒක කොම්පියුටරෙන් බලාගන්නත් පුලුවන්."

"ඒ කියන්නේ දුවට මගේ වචනෙට වැඩිය මේ යකඩ ගොඩ විශ්වාසයි?"

"තාත්ති කල්පනා කරන්නේ ඉස්සර විදියට. අලුත් විදියට හිතනව නම් තාත්තිට ඕක ප්‍රශ්නයක් නොවෙයි."

මට මගේ දුව ගැන ඇති වූ දුක හා පරිගණකය කෙරෙහි ඇති වූ වෛරය වචනවලින් කිව නොහැකිය. දුව තාම ළපටිය. එහෙත් ඈ මට වඩා ඇගේ පරිගණකය විශ්වාස කරයි. දෙවියනේ! කොහොමද පියකුගේ ආදරයක් මේ උපකරණයකින් මනින්නේ? මගේ හිත කණස්සල්ලට පත් වී ඇත. දුව දෙස බැලීමට මට මහත් බියක් දැනේ. දුවගේ ඇස් දෙක දෙසත් පරිගණක තිරය දෙසත් මම වරින් වර බැලුවෙමි. මගේ ගෙල ප්‍රදේශය දහඩියෙන් තෙත් වී ගොස්ය.

"ඇයි තාත්ති බය වෙලා වගේ? තාත්ති හරි මෝඩයි! කොම්පියුටරයෙන් තව කොච්චර දේවල් දැනගන්න පුළුවන්

sinhalaebooks.com

ද කියල තාත්ති දන්නව නම්, තාත්ති තවත් පුදුම වෙයි." මට තවත් දැනගන්නට දෙයක් නැත. දුව මැෂිමක් බවට පත් වූයේ මේ පරිගණකය නිසා නො වේ ද? කිසිවක් කියාගන්නට නැති තැන මම බිම බලාගතිමි.

"තාත්ති, මගේ ම තාත්ති ද කියලත් ඕනි නම් මේ කොම්පියුටරයෙන් අහගන්න පුළුවන්!."

"නවත්තපන් ඔය කතාව! විසි කරනව මං ඔය ඉළව්ව එළියට!" කෝපය ඉහ වහා ගිය මම පුටුව පස්සට ඇද නැඟිට්ටෙමි. මගේ අත්පා වාරු නැති වීගෙන එයි. මම එතනින් සාලයට ආවේ කෙසේ දැයි මට වත් මතක නැත. මගේ කෝපාවිෂ්ට වචනවලින් හිත රිදවාගත් දුව අඬන හඬ මට ඇසේ. ඇයව තුරුලු කරගෙන අඬන්නට සිතේ. දෙවියනේ! මේ මළ ඉළව්ව හදපු එකා අපේ ලේ, ඇට, මස්, නහර මේක ඇතුළට දමා කිරන්නටත් මනින්නටත් හැකි ලෙස හැදුවේ ඇයි? අප මෙතෙක් කල් ජීවත් වූයේ මේ අවිශ්වාසය හිත්හි දරා ගෙන ද? මම දුව ගැන කවර දාකවත් සැක නොකෙළෙමි. මගේ බිරිඳගේ සෙනෙහස ගැන සැක නොකෙළෙමි. අපේ සියලු බැඳීම් පැවතුනේ විශ්වාසය නමැති බැම්ම නිසාය. එහෙත් පරිගණකය භාවිතා කරන්නට පටන් ගත් මගේ දුවට අද මගේ සෙනෙහස පරීක්ෂා කරන්නටත් මා ඇගේ පියාද නැද්ද යන වග පරීක්ෂා කරන්නටත් සිත් පහළ වී ඇත.

මම මගේ දුවට ලබා දුන් දායාදය මෙයද? දුවගෙන් මා අපේක්ෂා කළේ මෙවැනි අලුත් දැනීම් සම්භාරයක් ද?

මා විසින් මගේ දරුවා මනුෂ්‍යත්වයෙන් ඈත් කර ඇතැයි යන හැඟුම මගෙන් තුරන් නොවේ. ඈ අද තම තාත්තා පරීක්ෂා කරන්ට ඇගේ හදවතින් උපකාර

sinhalaebooks.com

නොකරගත්තේ ඒ නිසාය. මට දැන් මගේ දුවගේත් පරිගණකයේත් කිසිදු වෙනසක් නොපෙනේ. තවත් මොන මොන දේවල් මේ විජ්ජා පෙට්ටියට කරන්නට හැකියාව ඇද්ද? මට දුක ඒ විජ්ජා පෙට්ටියට මගේ දුවගේ හදවත මැෂිමක් කිරීමට හැකි වීම පිළිබඳවය.

මට මතක් වන්නේ මීට ටික කලකට උඩ දී අපේ ගමේ පරිගණක පාසලක් ආරම්භ කිරීමට මා ලබාදුන් සහයෝගය පිළිබඳවයි. එදා මම පාසල් ගුරුවරයකු ලෙස පෞද්ගලික මට්ටමින් හරි මෙවැනි පාසලක් ගමේ ආරම්භ වීම පිළිබඳව සතුටු වීමි. ගමත් පන්සලත් එකතු වී මේ පරිගණක පාසල ආරම්භ කිරීම පිළිබඳව විරෝධතාවක් ගොඩනැඟීම පිළිබඳව, එය ඉතා ම්ලේච්ඡ ක්‍රියාවක් බව මම ප්‍රසිද්ධියේ කියා සිටියෙමි. පන්සලේ හාමුදුරුවනුත් ගමේ වැඩිහිටි පිරිසකුත් මේ වැඩපිළිවෙලට විරුද්ධ වූයේ ගමේ පැරණි නුග ගහක් මේ පරිගණක පාසල වෙනුවෙන් රජයෙන් මිලදී ගත් ඉඩමට ඇතුළු වී තිබීම නිසාය. මේ නුග ගහ කැපීමට ඒ පාසලේ බලධාරීන් ගත් උත්සාහයේදී ඊට එරෙහිව මේ පිරිස නැඟී සිටියහ. ඔවුන් ඒ නුග ගහේ වැදගත්කමත් එය ගමේ උදවියගේ වන්දනාවට ලක් වී තිබෙන ගහක් බවත් කියා සිටි අතර, මම නුග ගහ කපා හෝ පරිගණක පාසල ආරම්භ කළ යුතුය යන පැත්ත නියෝජනය කළෙමි. මා උගත් පුද්ගලයකු ලෙස ගම පිළිගෙන සිටි නිසා හාමුදුරුවන්ගේ මතයටත් වඩා මගේ මතය වැදගත් විය. මම එහි දී පැරණි මතවාදවල ඇති නොවැදගත්කමත්, අලුත් ලෝකයට ඒවා නොගැළපෙන බවත්, නුග ගහකට වඩා අනාගතය බාර ගන්නට සිටින දරු පිරිසකට මෙවැනි පාසලකින් සැලසෙන සෙත පිළිබඳවත් දීර්ඝව කරුණු ඉදිරිපත් කළෙමි. අවසානයේ දී

sinhalaebooks.com

පොලිසියේ ද මැදිහත් වීම මැද නුග ගහ කැපීමට තීරණය විය. නුග ගහ කපන්නට කෙසේ වත් ඉඩ නො දෙමියි කියා කෑගැසූ හාමුදුරුවන්ගේ සිවුරෙන් ඇද ජීප් රියට දමන විට මට අපමණ සතුටක් දැනුණි. මෙවැනි ගල් බිල්ලන් සිටින තාක් රටට යහපතක් නොවෙතැයි මම කල්පනා කළෙමි. ගම්මුන්ගේ බලය හාමුදුරුවන්ගේ පසුබෑමත් සමඟ නැති වී ගිය අතර, මැෂින් කියත්වල දැති පහර ලද නුග ගහ ඒ ප්‍රදේශය තුළ අත්පත් කරගෙන තිබූ ශ්‍රී විභූතිය, ගම්භීර බව යන සියලු ගුණ සමඟ මහා හඬක් ලමින් පොළොව බදාගත්තේය.

sinhalaebooks.com

# නැන්දයි ලේළියි

මම විවාහයෙන් පසු සඳුනිකා කිසි උත්සවයක් නොගෙන ගෙදර කැඳවාගෙන ආවෙමි. මගේ කාර්යාලයේ යාළුවන් කීපදෙනකුට පමණක් කෑම ටිකක් පිළියෙල කොට දුන්නේ අම්මාගේ පෙරැත්තය නිසාය. අපි නීත්‍යානුකූලව විවාහ වූ දා සඳුනිකාගේ ගෙදර කීපදෙනකුත් අපේ පැත්තෙන් හතර පස් දෙනකුත් සහභාගි වූ අතර, ඔවුන්ට හෝටලයකින් දවල් කෑම අරන් දුන්නෙමි. සඳුනිකා ගෙදර එක්කගෙන ආවේ ඊට ටික දවසකට පසුවයි. ලොකුවට උත්සවයක් නොගැනීම පිළිබඳව අප තුන්දෙනා අතර ගැටුමක් නොතිබුණි. මට අවශ්‍ය කළ විදියට සියලු දේ කිරීමට අම්මා හෝ සඳුනිකා හෝ වෙතින් වචනයකින්වත් බාධාවක් නොවීය.

සඳුනිකා සමඟ මා විවාහ වූයේ සැබැවින්ම අම්මාගේ වුවමනාවටය. අම්මා විසින්ම සොයාගත් ඇ මට විවාහ කර දීමට ඇය බොහෝ වෙහෙසුණාය.

"පුතේ, මං කියන එක අහපං. ඒකි ගුණයහපත්; උඹට දෙවියෙකුට වගේ සලකාවි."

"මට සැලකුවට වැඩක් නෑ නෙ අම්මෙ, අම්මට නොසැලකුවොත්?"

"උඹ එහෙම හිතන්න එපා පුතේ, ඒ දරුව මට අම්මට වගේම සලකාවි, මං කියන දේට කැමති වෙයං." අම්මා නිතර ඇවිටිලි කළාය. "මට ගෑනු ජාතිය එපා වෙලා

sinhalaebooks.com

තියෙන්නෙ" අම්මාගේ යෝජනාවෙන් බේරීමට මා නිතර කියන දෙයක් විය. "උඹ හිතන්නෙ අරකි උඹට කරපු හරිය හැමෝ ම කරාවි කියලද?" මට නයෝමිගේ අතීතය, අම්මා මතක් කර දීමෙන් සිහියට නැඟෙයි. ඇයත් මාත් අවුරුදු හතරක් ප්‍රේමසම්බන්ධතාවක් පවත්වාගෙන ආවත් නයෝමි අවසානයේ වෙනෙකකු සමඟ විවාහ වූවාය. ඇය අප අතර තිබූ හැම සම්බන්ධතාවක්ම ඉතා කෙටි කලකින් අමතක කර දමා, එය සාධාරණීකරණය කළාය. ඇය මට ආදරය නොකළ බවත්, අවුරුදු හතරක් තුළ මා කෙරෙහි වූයේ අනුකම්පාවක් බවත් ලියා එවා තිබුණි. එතැන් පටන් මට ගැහැනුන් කෙරෙහි වූයේ විශාල කලකිරීමකි. ඒ ප්‍රේමය බිඳවැටීම නිසා මා විසින් විඳින ලද නොයෙක් දුක් වේදනා නිසා ම විවාහය පිළිබඳ මගේ සිතෙහි කිසිම බලාපොරොත්තුවක් ඇති නොවීය.

කෙසේ හෝ සඳුනිකා විවාහ කරගැනීමෙන් මා බලාපොරොත්තු වූයේ අම්මාට සැලකීමත්, ඇය විසින් ජීවිතයේ මෙතෙක් මා වෙනුවෙන් විඳින ලද අපමණ දුක් කන්දරාවෙන් නිදහස් කර තැබීමත් විනා මගේ සැපතක් නොවේ. මගේ කුසීත ජීවිතය සැපවත් කිරීම සඳහා අම්මා සඳුනිකා සොයා දුන්නා විනා, ඇගේ පහසුවක් ඇය නොසිතන්නට ඇත.

කෙසේ හෝ සඳුනිකා ගෙදර ගෙනා පළමු දිනයේ සිට ම ගැහැනුන් කෙරෙහි මා තුළ තිබූ කලකිරීම නැති කර දමන්නට ඇගේ හැසිරීම, ක්‍රියා කලාපය පොහොසත් විය. ගම්බදව හැදුණු වැඩුණු ඇගේ අව්‍යාජ බවට මම ප්‍රිය කළෙමි. ඇගේ අහිංසකත්වය කෙනකුගෙන් ලබන ආදරය සදාකාලිකවම රැකගැනීමට ඈ ලබා තිබූ ඉහළම සුදුසුකම විය හැකිය.

sinhalaebooks.com

සඳුනිකාගෙන් මා බලාපොරොත්තු වූයේ අම්මාට යහපත් දියණියකි. ඇය මා තේරුම් ගෙන තිබුණේ මගේ වචනවලින් නොව, මුහුණෙන්ය. අම්මාට ඇය සැබෑ දියණියක ලෙස සලකන්නට වීම මා තුළ සඳුනිකා කෙරෙහි වූ සෙනෙහස වැඩි වීමට හේතු විය.

තාත්තා අහිමි වීමෙන් පසු මාත් අම්මාත් මේ ලොව තනි වූ දා සිට මා ලොකුමහත් කිරීමට අම්මා අපමණ වෙහෙසුණාය. වීවින් එකේ රෙදි වියන රස්සාවට ගිය අම්මා මට ඉගැන්වීමට දුක් වින්දාය. පවුලේ එකම දරුවා වූ මා අම්මාට මෙලොව තිබූ එකම වස්තුව බව මම දැන සිටියෙමි. මට රස්සාව ලැබුණ දා සිට අම්මා වීවින් රස්සාව මගේ පෙරැත්තය නිසා නතර කළාය. අම්මා විසින් මා වෙත කරන ලද යුතුකම්වලට මම හැම විටම ඇයට යුතුකම් කිරීමට උත්සාහ කළෙමි. අම්මා සතුටින් තැබීම මගේ බලාපොරොත්තුව විය. විවාහයෙන් එයට යම් බලපෑමක් සිදු වේ යැයි මා කල්පනා කළ නිසාත්, නයෝමි විසින් මගේ සිත තුළ තබන ලද කළු පැල්ලම නිසාත් මම විවාහය ගැන නොසිතා සිටියෙමි. අම්මාගේ පෙරැත්තයට විවාහ වූවත්, අම්මාට නො සලකන ගැහැනියක නම් ගෙදරින් එළවන බව මම අම්මාට කීවෙමි. අම්මා එයට එකඟ වී, සඳුනිකා මට ලබා දුන්නාය.

අපගේ විවාහය සඳහා ලබාගෙන තිබූ කෙටි නිවාඩුවෙන් පසු මට නැවත කාර්යාලයට යන්නට සිදු විය. සඳුනිකා අතහැර යෑම දින කිහිපයකට වත් කළ නොහැකි ලෙස මම ඇයට ළං වී සිටියෙමි. උද්දාල බමුණාට ස්වර්ණතිලකා අතහැර යෑමට තිබූ නොහැකියාව බඳු හැඟීමක් මා තුළ ජනිත කළේ ගැමි ගෞරුව විසින් ඇයට ලබා දී තිබූ අව්‍යාජ ජීවිත අත්දැකීම් හා ආගන්තුක

sinhalaebooks.com

පරිසරයක් වුව ආකර්ෂණය කරගැනීමට තිබූ හැකියාවයි. එක් අතකින් දැන් අම්මා සඳුනිකා සමඟ තනි කිරීම මට බියක් ගෙන නො දෙයි. ඇය අම්මාට එතරම්ම ළං වී සිටියාය. අම්මා ලේළියකගෙන් බලාපොරොත්තු වන්නා වූ හැම දෙයක්ම ජීවිත කාලයේම ලබා දීමට සපත වීමක් ලෙස ඇගේ මේ හැසිරීම හඳුනාගතිමි.

මම කාර්යාලයට ගොස් එන විට ඈ ඉදිරියට පැමිණ මා පිළිගනියි. ඉස්සර අම්මා පෙරමඟ බලා සිටින්නාක් මෙන් දැන් ඇය පෙරමඟ බලා සිටියි. මගේ සපත්තු දෙක පවා ගලවා ඈ සපත්තු රාක්කයේ තැන්පත් කරන්නීය. ඇඳුම් මාරු කර අවසන් වන විට ඈ උණුපැන් පිළියෙල කොට, සබන් කෑල්ලත් තුවායත් මා අත තබයි.

ඇඟපත හෝදාගෙන එන විට උණුසුම් තේ කෝප්පයක් මා අතට ලැබෙයි. අම්මා විසින් කරන ලද සියලු වැඩපළ ඈ අතින් සිදු වෙයි. අම්මා සම්පූර්ණයෙන් විවේකී ජීවිතයක් ගත කරයි. ඇය පාළුව නැති කරගැනීමට රටා පැදුරක් වියයි. සඳුනිකා මට විවාහ කර දීමට අම්මා කොතරම් කරුණු කියා දුන්නා ද? එහි ප්‍රතිඵලය දකින විට ඇය නිතැතින් ම සතුටු වනවා ඇත.

ගෙදර සියලු වැඩපළ කරන සඳුනිකා ගැන වරෙක මට අනුකම්පාවක් උපදියි. බුදු දහමේ උගන්නවන මාතු, සඛී, දාසි, භගිනී යන සියලු ගුණ කැටි වූ බිරිඳක ලැබීමෙන් මම ආඩම්බර වීමි. දිනපතා පත්තරවල පළවන අඹුසැමියන්ගේ ආරවුල්, දික්කසාද දකින විට මම සඳුනිකා ගැන කල්පනා කොට සතුටු වීමි. තුන් වේල ම මොනවා හෝ උයන පිහන සඳුනිකා ගෙදරදොර සියලු කටයුතු තනිවම කළාය. වතුර කළයක් හෝ ගෙන එන්නට අම්මාට ඉඩ නො

sinhalaebooks.com

තැබුවාය. මාසික පඩිය සඳුනිකා එන්නට පෙර මා ගෙනත් දුන්නේ අම්මා අතටය. දැන් එය සඳුනිකා අතට ගෙනත් දෙමි. ඇය ප්‍රවේසමෙන් මුදල් වියදම් කළාය. ගෙදර අලුත් පාලිකාව වූ සඳුනිකා වත්ත පිටිය ද පිරිසිදු කළාය. සියලු වැඩපළ තනිවම කරන සඳුනිකා තුළින් මම වෙහෙසක් නොදුටුවෙමි.

දිනක් හවස කාර්යාලයේ සිට ගෙදර ආ මට දකින්නට ලැබුණේ සඳුනිකා අම්මාගේ හිසේ තෙල් ගල්වමින් සිටින සැටිය.

"ඇයි සඳුනි, අම්මට මොකද?"

"අනේ මන්ද මහත්තයෝ, අම්මට ටිකක් අසනීපයි වගේ (සඳුනිකා මට ආමන්ත්‍රණය කරන්නේ "මහත්තයෝ" යනුවෙනි). මම අම්මාගේ නළලට පිටි අත්ල තබා බැලුවෙමි. උණ ගතියක් නැතත් අම්මාට යම් අසනීපයක් ඇතැයි මට සිතුණි.

"ඇයි අම්මෙ?" මම අම්මාගේ මුහුණ දෙස බලාගෙන ඇසුවෙමි. අම්මා මගේ අත්ල ගෙන නාස්පුඩු මත තබාගෙන ඉම්බාය.

"අනේ අම්මෙ, කියන්න අසනීපයක් නම්..."

"නෑ පුතේ, ඔළුව ටිකක් කකියනව. පස්සෙ හරියාවි."

"අපි බෙහෙත් ටිකක් අරන් එමු" සඳුනිකා යෝජනා කළාය. අම්මා එයට විරුද්ධ වූයේ බෙහෙත් ගේන්නට තරම් අසනීපයක් නැති බව කියමිනි.

සඳුනිකා කොත්තමල්ලි තම්බා දීමෙන් පසු අම්මා නැවතත් සුපුරුදු ඉරියව්වලින් පසු වූවාය. එහෙත් අම්මා

sinhalaebooks.com

වෙනදාට වඩා කල්පනා කරමින් කාලය ගෙවන බව කීපවරක් සඳුනිකා මා ගෙදර පැමිණි පසු පැවසුවාය. අම්මා යම් අසනීපයකින් පෙළෙමින්, අපට කරදර කිරීම නොමැනවයි සලකා සිටින්නේ යැයි මම සැක කළෙමි. මුල් දිනවල රටා පැදුරු හරිහරියට වියමින් කාලය ගෙවූ අම්මා විසින් පුරන ලද පැදුරක් ඉස්තෝප්පුවේ දින කිහිපයක සිට පැත්තක දමා තිබෙන හැටි මම දුටුවෙමි.

"අම්මා පැදුර වියන්නැද්ද සඳුනිකා?"

"ඕක පුරල ගොඩක් දවස් වෙනව. අම්ම බංකුව උඩ වාඩි වෙලා පං ගස් දිහා බලාගෙන කල්පනා කරනව. අද දවල්ට කෑම කෑවෙත් නෑ. පමණක් වෙලාවට තනියෙන් දොඩවනව." සඳුනිකා කඳුළු පිරි දෑසින් කීවාය.

"ඔයා මොනව හරි කිව්වද?" මම එක්වරම ප්‍රශ්න කළෙමි.

"අනේ නෑ, මහත්තයෝ."

"අම්මාගෙන් වැඩ ගන්න එපා සඳුනිකා."

"අනේ නෑ. මං ඔක්කොම කරනව. ඒත් මං උදේට බත් බඳින කොට ඇවිල්ල බලාගෙන ඉන්නව. මං කරන හැම දෙයක් දිහාම අම්ම බලාගෙන ඉන්නවා. අම්ම ආසයි වැඩ කරන්න. මං ඒත් ඉඩ දෙන්නෙ නෑ" සඳුනිකා ශෝකයෙන් කීවාය.

"නෑ සඳුනි, මං දන්නවා ඔයාට අම්මට සලකන විත්තිය. ඒත් අම්ම එකපාරට ම කල්පනාවට වැටුණෙ මොකද කියන එකයි ප්‍රශ්නෙ."

මම අම්මාගේ කටින් වචනයක් ගැනීමට කිහිප වරක් ම උත්සාහ කළෙමි.

sinhalaebooks.com

"ඇයි අම්ම දුකෙන් ඉන්නව යි කියන්නෙ? සඳුනිකා වෙනස්කං කරනව ද?"

"නෑ පුතේ."

"එහෙනං අම්ම දුකින් ඉන්නේ?"

"නෑ දරුවෝ, මං හොඳින් ඉන්නවා."

"අම්මගෙ වදේට මං කසාද බැන්දෙ. ඒකෙන් පස්සෙ අම්ම වෙනස්. මං හෙට වුණත් එයාව ගෙදර ඇරලවනව අම්මට එය නිසා කරදර නං."

"අනේ බුදු පුතේ. ඒ දරුවා එහෙම දරුවෙක් නොවෙයි." අම්මා අඬමින් කීවාය. අම්මා තුළ සඳුනිකා කෙරෙහි කිසිම කලකිරීමක් නැති බව ඇගේ හැම වචනයකම ගෑවී තිබුණි. මට සඳුනිකා පිළිබඳ තිබූ සැකය ක්‍රමයෙන් පහවී ගියේය. වරින්වර අම්මාගේ ඉරියව් හොඳ අතටත් නරක අතටත් හැරුණි. මම අම්මාගෙන් ප්‍රශ්න කරන විට ඇය ආයාසයෙන් සුපුරුදු ලෙස ජීවත් වීමට උත්සාහ කළාය. මා ගෙදර ඉන්නා විට අම්මා වෙනසක් නොපෙන්වීමට බෙහෙවින් ප්‍රවේසම් වී සිටියාය. එහෙත් දිනපතා සඳුනිකා අම්මා ගැන අලුත් යමක් මා සමඟ කියයි. එයින් නරකම ආරංචිය වූයේ අම්මාගේ දෙඩවිල්ල වැඩි වී ඇති ආරංචියයි. මුලින් තොල් මැතුරූ අම්මා එය දූන් ඕනෑකමින් සවන් දෙන්නකුට අහගැනීමට හැකි තරම් දෙඩවිල්ලක් ලෙස වර්ධනය කරගෙන තිබුණි.

"මොනවද අම්මා දොඩවන්නෙ?" මම සඳුනිකාගෙන් කේන්තියෙන් ඇසුවෙමි.

"මහත්තයට උගන්නපු හැටි කියනව. වෙලාවකට තව මොනවද කියනව, තේරෙන්නෙ නෑ."

sinhalaebooks.com

"තමුසෙ ආවට පස්සෙ තමයි මේ සේරම" මම ඉහවහ ගිය කෝපයෙන් කීවෙමි.

සඳුනිකා වෙව්ලන දෙතොලින් යුතුව මා දෙස බලා සිටියාය.

"තමුසෙ අම්මට වෙනස්කං කරනව" මම ඇයට දබරැඟිල්ල දිගු කොට චෝදනා කළෙමි. ඇගේ ඇස් දෙකෙන් කඳුළු කැටි කැටි කඩාහැලෙන හැටි මම අනුකම්පාවෙන් තොරව බලා සිටියෙමි.

"දෙයිහාමුදුරුවම්ප නෑ මහත්තයො" ඈ මගේ කකුල් දෙක ළඟ වැටෙමින් කීවාය. මට මා ගැනම හටගත් දුකක් දැනුණි. සඳුනිකා මගේ කෝපයට උත්තර දුන්නේ කෝපයෙන් නො වූ නිසා මගේ හිත උණු වී ගියේය.

"මම හිතල නො වෙයි කිව්වෙ" මම අහක බලාගෙන කීවෙමි.

අම්මා මට උගන්නපු හැටි, වැඩට යනකොට සලකපු හැටි, මේ සේරම කියවන්නේ කුලකීමක් ලෙස යැයි මම කල්පනා කළෙමි. මගෙන් කිසියම් වරදක් සිදු වී දැයි මම නොයෙක් වර කල්පනා කළෙමි. ඇයට මම කිසි දාක වෙනස්කම් සිදු කර නැත. අම්මා සතුටින් තැබීම මගේ එක ම අරමුණය. සඳුනිකා පැමිණි පසු ඇයට අවශ්‍ය විවේකය හොඳ හැටි ලැබී ඇත. මම ද නිතර ම අම්මාගේ අවශ්‍යතා සොයා බැලුවෙමි. එහෙත් අම්මාගේ හිත තෝන්තු වී ඇත. මම අම්මාගේ දැඩි විරෝධය මැද ඇයව පෞද්ගලික වෛද්‍යවරයකු කරා රැගෙන ගියෙමි. අම්මා පරීක්ෂා කළ වෛද්‍යවරයා අම්මා නීරෝගී බව පැවසුවේය. ඔහු ලවා විටමින් ජාති කිහිපයක් ලියවාගත් මම අම්මා ගෙදර එක්ක ආවෙමි.

sinhalaebooks.com

එහෙත් අම්මා දිනෙන් දිනම නීරෝගී වෙනවා වෙනුවට රෝගී වූවාය. කෑමබීම සඳුනිකාගේ පෙරැත්තයට ගන්නා අම්මා සමහර දිනක බත් නොකෑ බව හවසට සඳුනිකා කියයි. මා සිටින නිසා රාත්‍රී ආහාර වේල අම්මා මට වෙනසක් නොපෙන්වා ගිල දමයි. මා ගෙදර නැති විට අම්මාගේ ඉරියව් සම්පූර්ණයෙන් වෙනස් වන බව සඳුනිකා හැම විට මා සමඟ කියයි.

අම්මා සඳුනිකාගෙන් බලාපොරොත්තු වූ ලේළියකගේ චරිතය ඈ සතුව නැති වීම නිසා මෙසේ වී දැයි මම නොයෙක් වර සැක කළෙමි. මා නැති අතර සඳුනිකා අම්මාට වෙනස්කම් කරමින් ගෙදර වැඩපළ ඈ ලවා කරවාගන්නේ යැයි මම සිතුවෙමි. නැන්දාගේත්, ලේළියගේත් වෛරය පුරාණයේ සිට ඇවිත් සඳුනිකාගෙන් වෙනස් විය නොහැකි බව සිතන්නට උත්සාහ කළෙමි. නැන්දම්මාට කුඩු තලප කැවූ ලේළියක ගැන ජාතක කථාවක අසා තිබුණි. ඒ කුඩු තලප කැවූ ගැහැනිය සඳුනිකා තුළින් දකින්නට මම නිතරම උත්සාහ කළෙමි.

සඳුනිකා කෝපගන්වා රණ්ඩුවක් ඇති කරගැනීමට මම නිතර ම උත්සාහ කළෙමි. ඇය ඉවසීමේ දිය වත් කොට මගේ කෝපය නිවා දමයි. මම එක් දිනක් කාර්යාලයට යන බව කියා මඟට ගොස් ආපසු හැරී ඇවිත් පිළිකන්නේ සැඟවී සිටියෙමි. එහෙත් මා ඇසුවේත් දුටුවේත් සඳුනිකාත්, අම්මාත් අතර අරගලයක් වෙනුවට, සඳුනිකා වහලියක මෙන් ගෙදර වැඩපළ කරන හැටිත් අම්මාට ආදරයෙන් සංග්‍රහ කරන හැටිත්ය. පසුව මම සඳුනිකා සැක කිරීමෙන් පාපයක් කරගත්තේ යැයි පසුතැවුණෙමි.

sinhalaebooks.com

අම්මා විසින් පුරන ලද පැදුරක් කාලයක සිට ඉස්තෝප්පුවේ මුල්ලේ දමා ඇත. පන්ගස් සියල්ල පටලැවී ගුළිගැසී ඇත. ගෙදර සිටින බළල් පැටවා සෙල්ලම් කිරීමෙන්, පුරන ලද පැදුරේ පන්ගස් අවුල් වී ගැට ගැසී ඇත. මම ඒවා ලිහීමට උත්සාහ දරුවත් තවතවත් පටලැවුණි. මට බළලා අල්ලා පොළොවේ ගැසීමට සිතුණි.

සඳුනිකාගේ කුසට දරුපැටවකු ආ ආරංචිය ඈ මගේ කනේ තැබුවාය. මම එයින් බොහෝ සේ සතුටු වුණෙමි. ඒ බව අම්මාට කී විට ඇය සඳුනිකාගේ මුහුණ අතගෑවාය. අම්මා කිසියම් රෝගයකින් පෙළෙනු විනා අපේ ජීවිත නිසා අම්මාගේ ජීවිතයට බලපෑමක් වී නැතැයි ඇගේ සතුටු මුහුණ දකින විට සිතුවෙමි. ක්‍රමයෙන් වයසට යන අම්මාගේ හැසිරීම ස්වාභාවික යැයි මම කල්පනා කළෙමි.

සඳුනිකාගේ කුස සිටින දරුපැටියා ආරක්ෂා කරගැනීමට අම්මාගෙන් නිතර උපදෙස් ලැබිණි. කෑමබීම වලින් ප්‍රවේසම් වන හැටි, ගත යුතු ආහාර නොගත යුතු ආහාර, කළ යුතු නොකළයුතු වැඩ අම්මා අත්දැකීම් තුළින් ලද අවබෝධය නිසා මවක වන්නට යන සඳුනිකාට කියා දුන්නාය. අප දෙදෙනාම මෙහිදී කෝඩුකාරයන් නිසා අම්මාගේ උපදෙස් ඉස්මුදුනින් පිළිගැනීමට සිදු විය.

සඳුනිකාගේ කුසට මාසයක් දෙකක් වන්නටත් පෙර සිට සඳුනිකා වැඩපළවලින් නිදහස් කර තැබීමට අම්මා උත්සුක වූවාය. සඳුනිකා කොතරම් උත්සාහ දරුවත් ඇට කිරීමට හැකි වැඩපළ පවා අම්මා කර දුන්නාය. මට අම්මා පිළිබඳ මහත් දුකක් දැනුණි. මගේ දවසේ වැඩිහරියක් ගෙ වෙන්නේ සේවය කරන තැනය. මගේ කටයුතු රැසක් කෙරෙන්නේ සඳුනිකාගේ හෝ අම්මාගේ හෝ

sinhalaebooks.com

අතින්හෝය. ටිකෙන් ටික සඳුනිකා සියලු වැඩපළවලින් නිදහස් කොට අම්මා ගෙදර කටයුතුවලදී පෙරමුන ගත්තාය.

කලින් තිබූ අම්මාගේ කුසීත ජීවිතය ක්‍රමයෙන් වෙනස් වන්නට විය. ඇය ප්‍රබෝධයෙන් දවස ගෙවමින් වැඩපළේ යෙදෙන හැටි සඳුනිකා නිතරම මා සමඟ කියයි. තනිවම දොඩව දොඩවා කාලය ගෙවූ අම්මා එය තොල් මැතිරීමක් දක්වා බාල කරගෙන, එය නැත්තටම නැති කරගත්තාය.

සඳුනිකා අතින් සිදු වූ සියලු දේ දැන් දම්මා අතින් සිදු වෙයි. සඳුනිකාගේ රෙදිපිළි පවා අම්මා සේදුවාය. සඳුනිකා කොතරම් විරුද්ධ වුවත් අම්මා දරුගැබ මතක් කරමින් වැඩපළේ යෙදීමට නොදෙයි. මම පඩි පැකට්ටුව යළිත් අම්මා අතට ගෙනැවිත් දීමට පුරුදු වීමි. සඳුනිකාට අවශ්‍ය නොයෙක් දේ අම්මාම කඩපළට ගොස් ගෙනත් දෙයි.

දරු පැටියා නීරෝගීව බිහි වනවා දැකීම අම්මාගේ එකම සතුට විය හැකි බව මම කල්පනා කළෙමි. සඳුනිකා අම්මා පුරා තිබූ පැදුර වියා තිබුණි. ගැට ගැසී තිබූ පන්ගස්වල අවුල හැර, ඒ පැදුර නැවත වියන්නට බැරි වේ යැයි මම සිතුවත් සඳුනිකා ඒ පැදුර මට සවස පෙන්නුවාය. "මට කම්මැලියි මහත්තයෝ නිකං ඉන්න. අම්මා පුරල තිබුණ පැදුර මං ඉව්ව, හොඳද බලන්න" යැයි ඈ කීවේ ඒ තුළින් ඈ සතුටක් ලැබුණු නිසා යැයි මම සිතුවෙමි.

අම්මා තුළ පසුගිය කාලය තුළ මොන භූතයකු අරක් ගෙන සිටියාද? ඇයට විවේකය ලබා දී, ඈ සතුටු කරන්නට උත්සාහ ගත් කල්හි ඇය සිතින් ලෙඩ වුණාය. දැන් නැවතත් අම්මා සතුටින් කල් ගෙවයි. සඳුනිකාගේ කුස

sinhalaebooks.com

ගත් දරුවා නිසා ඒ සතුට ඈ ලබනවා ද? එසේ නැත්නම් සඳුනිකාගේ අතින් වුණු සියලු වැඩපළ නැවත කරන්නට සිදුවීම නිසා ඒ ගැන කල්පනා නොකර සිටිනවා ද? අම්මා උත්පත්තියෙන් ම හිමි කරගත් දුක් විඳීමේ ශක්තිය අවසානය තෙක් ප්‍රයෝජනයට ගැනීමේ ආශාවෙන් පසු වූවා ද නැත හොත් ඈ විසින් ගොඩනඟා ගෙන තිබූ නිවෙසේ ආධිපත්‍යය ඈ වෙතින් ගිලිහී යතැයි සිතා ඈ සිතින් ලෙඩ වුණා දැයි කිව නොහැකිය. එහෙත් සඳුනිකා නිවෙසට ආවායින් පසු අම්මාගේ මේ වෙනස සිදු වූ බවත්, ඈ නිසාම යළිත් එය සුව වූ බවත් නම් විශ්වාසය.

sinhalaebooks.com

# අබිනික්මන

වියළි ගංදෙල් කොළ ගොඩ ඉදලෙන් තල්ලු කරගෙන යන බිරිඳ දෙස මම බලා සිටියෙමි. ඇගේ කෙසඟ සිරුරට එතරම් ශක්තියක් ඇතැයි සිතීමට බැරි තරම්ය. එහෙත් ඇය සිනා මුසු මුහුණින් යුතුව මිදුල අමදියි. පොළොවේ ඉදල වැදීමෙන් නඟින දූවිලි ඇගේ නාස් පුඬු අතරින් ශරීරයට ද ඇතුළු වනවා ඇත. එහෙත් ඇය ඒ ගැන නොතකා, කොළගොඩ අතුගාගෙන යයි.

"මට හිතෙන්නෙ මේ නියඟය ඉවර වන එකක් නොවෙයි" මම උළුවස්සට හේත්තු වී බිරිඳ දෙස බලාගෙන කීවෙමි.

"කොයි එකටත් පුරුදු වෙන්න එපැයි"

ඇය අතුගෑම නොනවත්වා ම පිළිතුරු දුන්නාය.

"මම නම් හිතුවේ නෑ කවදාවත් අපිට මේ වගේ පැත්තකට එන්න වේවි කියල. ආණ්ඩුවෙ ඇයින් අපෙන් පළි ගන්නද කොහෙද මෙච්චර දුෂ්කර පැත්තකට අපිව දැම්මේ."

ඇය එවර අතුගෑම නතර කොට ඉදලට බර වී මා දෙස බැලුවාය. "ජයේ, ඔයා කල්පනා කරන්නෙ පටු විදියට. ජීවිතේ තාම අපි පටන්ගත්ත විතරයි. ජීවත් වෙනව නම් දුක් විඳීමත් ඒකේ කොටසක් විදිහට හිතන්න ඕන."

sinhalaebooks.com

"ඔය දූවිල්ල වැදුණොත් මට නම් නැති ලෙඩත් හැදේවි" කතාව වෙනතකට හැරවීමේ වුවමනාවෙන් මම කීවෙමි.

"ඒ ඔයාට නෙ" කියමින් ඇය නැවත මිදුල අතුගාන්න වූවාය.

"ඔයාට මෙහෙ හොඳ ද?"හොඳ නරක නෙවෙයි ජයේ, අපිට ලැබුණ දේ අපි සතුටින් බාර ගන්න ඕන. ඒකයි මම කියන්නෙ."

මට බිරිඳ කෙරෙහි සියුම් කෝපයක් උපදියි. ඇය මා සමඟ විවාහ වන්නට පෙර මා තුළ තිබූ උනන්දුව අද ඇල්මැරුණු ගානය. ඈ තුළින් මා අපේක්ෂා කළේ නවකතාවක, චිත්‍රපටයක විස්තර කරන සුන්දර ජීවිත කතාවක කොටස්කාරියකි. එහෙත් සැබෑ ජීවිතය තුළ එවැනි දෙයක් නැතැයි මට අවබෝධ වී ඇත. අපේ ජීවිතයේ සිදු වන හැමදෙයක්ම මානසිකව මවාගෙන තිබූ ලෝකයට කිසි සේත් සම්බන්ධ නොවේ.

"බලන්න සීතා, බොන්න වතුර පොදක් නෑ. නාන්න යන්න ඕන වැවට. ඒක කොච්චර දුරද? ඉස්කෝලෙට පයින් යන්න ගියහම දවස එහෙම්ම ඉවරයි. මට හිතෙනව මේ පත්වීම දමලගහල, වෙන මොකක් හරි රස්සාවක් හොයාගන්න."

"ඔයා තාම හිතන්නේ ජීවිතය ගැන සැහැල්ලුවෙන්. අපිට ඕන විදිහටම ජීවිතය ගත කරන්න බෑ. අපි හිනන තරං සුන්දරත් නෑ."

ඇය කියන විදියට ජීවිතය ගැන හිතන්නට මා කොතරම් උත්සාහ දැරුවත් මට එසේ සිතීමට නොහැකිය.

sinhalaebooks.com

මා බලාපොරොත්තු වන්නේ ජීවිතයේ ඉතා ලස්සන පැත්තකි. ඇය කරදරවලට මුහුණ දීමට කැමතිය. මට අවශ්‍ය කරදර ඇති තැනින් පලායෑමටය.

"අපි මාරුවක් හදාගන්න බලමු ද?" මම යෝජනා කළෙමි.

"ඒ මාරුවත් මේ වගේ පළාතකටම උණොත් මොකද කරන්නෙ?" මම පිළිතුරක් නො දුන්නෙමි.

මිදුලේ ඇති සියඹලා ගහේත් ගංදෙල් ගහේත් කොළ හැලී ඇත. බැලූ බැල්මට ඒ ගස් දෙකම මැරී ඇති ගානය. වැට අයිනට හිටුවා ඇති නොයෙක් වර්ගයේ ගස්ද දර ඉපල් සේ වියළී ගොස්ය. ගිනියම් වූ සුළඟින් ද ශරීරයට සිසිලක් ලබා නො දෙයි.

මට වැව පැත්තට යෑමට ආශාවක් ඇති විය. මෙහාට ආ මුල් දිනයේ සිට ම මට යම් අස්වැසිල්ලක් ගෙනත් දුන්නා නම් ඒ බාගෙට දිය සිඳී ගිය මේ වැව පමණකි. වැව ළඟට හෝ වැව මැදට ගොස් දියෙන් පිරුණු ප්‍රදේශය දෙස බලා සිටීමට මා තුළ දැඩි ආශාවක් හට ගනී. නියඟය තිබුණ හොත් ඒ ඉතිරි දිය ටික ද සිඳී යනු ඇත.

මම බාල්දියත් රැගෙන වැව පැත්තට ගියෙමි. වැව දෙසට වැටී තිබූ අඩිපාරේ වැවුණු කටුපඳුරු උඩින් පැන පැන මම වැවට ගියෙමි. වැව මැදින් වැවේ වතුර ඇති තැන දක්වා ද අඩි පාරක් ඇත. එම අඩි පාර දෙපස දුඹුරු පාට පොළොව ඉරි තැලී ඇත. අහසින් වැටෙන දිය බිඳුවක් බලාපොරොත්තුවෙන් වැව් පතුල කට ඇරගෙන බලා සිටිනවා යයි මට සිතුණි.

sinhalaebooks.com

ඉරි තැළී ගිය වැව් පතුල දකින විට මට සාංකාවක් දැනෙයි. ඒ සාංකාව නිසාම මම දිනකට කිහිපවරක් මේ වැවට ඒමට පුරුදු වීමි. ඒ පුරුද්ද දැන් ඇබ්බැහි වීමක් බවට පත්ව ඇත. ඉරි තැළුණු වැව් පතුළ දියෙන් පිරෙන දවසක් පැමිණේ දැයි මම මගෙන්ම ප්‍රශ්න කරමි. වැවේ තැනින් තැන එහා මෙහා යන මී හරක් රංචුත් දිය නාන්නට එන මිනිසුනුත් දකින විට මගේ හිතට කණගාටුවක් ඇති වෙයි. වැවේ ඉතිරි වී ඇති දිය ටික නිමා වූ පසු අප සියලු දෙනාම අනාථයන් බවට පත් වන්නේද යන හැඟීම ඒ කණගාටුව තවතවත් වැඩි කරයි. කොයි අත බැලුවත් නියඟයේ ශාපයෙන් අසරණ වුණු මුහුණු දකින්නට ලැබෙයි. එහෙත් ඔවුන්ට වඩා මේ ප්‍රදේශයට ආගන්තුක වූ මට නියඟයට බියක් ඇති වෙයි. ඒ කුමන හේතුවක් නිසා දැයි මට හරියට නොවැටහෙයි. ගිනි අවුවේ හේන් කොටා වැවේ නාන්නට එන මිනිසුන් ජීවිතයට මුහුණ දෙන ආකාරය පුදුම සහගතය. ඔවුන්ට මේ දුක් විඳින්නට ශක්තිය ලබා දී ඇත්තේ කවුරු විසින් දැයි නො තේරෙයි.

මගේ ජීවිතයට වුවමනාවෙන්ම දුක ළඟා කරන්නේ යැයි යන චෝදනාවෙන් අද මට නිදහස් විය නොහැකිය. සැප ඇති තැනක් මට හරියටම සොයාගැනීමේ හැකියාව දැනුදු උදා වී නැත. සැප යැයි සිතා උන් සියල්ල නියඟයට හසු වුණු ගස්කොළන් මෙන් වියළී ගොස්ය.

ඉරි තැළී ගිය වැව් පතුල දකින හැම විටකම මගේ ජීවිතයත් වැව් පතුලත් සමාන කොට සිතීමට සිදු වෙයි. වැවට එන හැම කෙනෙක්ම මට මගේ ජීවිතයේ ගෙවුණු කාල සීමාවන් පිළිබඳව මතක් කර දෙයි.

"අපේ පොඩි හාමුදුරුවන්ට බරෙයි වතුර කළේ?" පැනිස් මාමා දත් විළිස්සාගෙන මගෙන් අසයි.

sinhalaebooks.com

"බර නෑ පෑනිස් මාමෙ."

"පොඩිහාමුදුරුවන්ගෙ පැත්තෙන් මේ වගේ නියඟ තියෙනවයි."

"නෑ එහේට නිතර ම වහිනවා"

"අනේ මෙහාට නම් අවුරුදු දහයකින් විතර වැව පිරෙන්න වැස්සෙ නෑ. ඕක තමයි මෙහාට තියෙන කරදරේ."

මා පන්සලට ගිය දවස්වල වැව ගැන දැන සිටියේ ම නැත. මා පළමු වරට සිතුවේ එය පිට්ටනියක් කියාය. එය වැවක් බව දැනගත් පසුව එහි වතුර පිරෙන දිනයක් එන තුරු මම බලා සිටියෙමි.

"පෑනිස් මාමා දැකල තියෙනවද මේ වැවේ වතුර පිරිල තියෙනව?"

"අපොයි ඔව්. ඒත් ඒ බොහොම ඉස්සර, ඔබ වහන්සේගේ ගුරුහමුදුරුවන්ගේත් ගුරු හාමුදුරුවන්ගේ කාලයේ බලන්න එපා යැ මල් පිපිල එන කොට මේක අනොතත්ත විල වගේ පෑනිස් මාමා බුලත් විට කෑමෙන් කළුපාට ගැනුණු දත් පෙන්වමින් සිනා සුණේය. පෑනිස් මාමාගේ කතාවෙන් මගේ සිත ද උද්දාමයට පත් වෙයි. වැවේ වතුර දකින්නත් වැවේ එගොඩ මෙගොඩ පීනන්නත් මට ආශාවක් ඇති වෙයි. වැව හරහා වැටුණු අඩිපාර දිගේ දිනපතා වතුර ගෙන යෑමට නළළිඳට එන පෑනිස් මාමාත් මාත් අතර සංවාද ඇති වෙයි.

"පෑනිස් මාමා මේ වැවේ වතුර පිරිල තියෙනව කී පාරක් දැකල තියෙනව ද?"

sinhalaebooks.com

"එක පාරයි."

"ආයි පිරෙන එකක් නැද්ද"

කියන්න බෑ පොඩි හාමුදුරුවනේ, ඔබ වහන්සේට නම් බාග වෙලාවට දකින්න ලැබේවි."

"ඒ ඇයි?"

"මං වළ පයයි ගොඩ පයයි තියන් ඉන්න මිනිහ නොවැ."

මට පැනිස් මාමා කෙරෙහි ඇති වූයේ දැඩි අනුකම්පාවකි

"ඉතින් පැනිස් මාමෙ, නළළිඳෙත් වතුර නැති උණොත්?"

"එහෙම උණොත් පන්සල අතහැරල යන්න තමයි වෙන්නෙ." මම වතුර කළය කර උඩ තබාගෙන ගමන නවතා, පැනිස් මාමා දෙස බැලුවෙමි. ඔහු දත් විළිස්සාගෙන සිටියි. ඔහුගේ දත් පෙන්නීම හිනාවකට වඩා වෙන තේරුම ඇතිව දත් පෙන්නීමක් වැනිය.

"පොඩි හාමුදුරුවන්ට මහන්සිය"

"නෑ පැනිස් මාමෙ, මේ කළය පුංචි නෙ..." පැනිස් මාමා මට වතුර ඇදීමට හොයා දී තිබුණේ බෝධීන් වහන්සේ නෑවීමට ගන්නා පුංචි කළගෙඩියකි. පැනිස් මාමා වතුර අදින කළගෙඩිය ඊට වඩා පස් ගුණයක් විතර ලොකු එකකි.

"පොඩි හාමුදුරුවන්ගෙ අම්මයි තාත්තයි දන්නව නම් මෙහෙ මෙච්චර අමාරුයි කියල, මහණ නොකර ඉන්න තිබුණ මං හිතන්නෙ."

sinhalaebooks.com

"මගේ කේන්ද්‍රය පාළුයි කියල තාත්ත කිව්ව. ඒකයි මං හිතන්නෙ මහණ කෙරුවෙ." "පැනිස් මාමා මා දෙස බයාදු ලෙස බලා සිටියේය.

"මෙහෙ මිනිස්සු කොහොමෙයි වතුර බොන්නෙ?"

"ඒ මිනිස්සු ගැඹුරු ළිං කපාගෙන තියෙනව. සමහරු එනවා ඔය ආණ්ඩුවෙ නළළිඳට"

"ඉතිං අපිටත් බැරිද පන්සල් වත්තෙ ළිඳක් කපන්න?."

"පන්සල් වත්තෙ ළිං කපන්න බැහැ. යට මහ කළුගල."

මම වතුර කළයත් කර තබාගෙන නැවතත් අඩිපාර දිගේ ගමන් කළෙමි. මේ අඩිපාර වැටී ඇත්තේ පන්සලත් නළළිඳත් යා කරන පරිදිය. වැවේ වතුර පිරුණු කාලයක මෙම අඩිපාර නැති වී යනු ඇත. වැවේ වතුර පිරීම කවදා සිදු වේදැයි කිව නොහැකිය. වැවේ හැම තැන ම ඇත්තේ ඉරි තැළී ගිය දුඹුරු පොළොවයි. තණකොළ මැරී ගොස්ය. මට එකවරම ලොකු හාමුදුරුවන්ගේ විලුඹ මතක් විය. එයද ඉරි ඇත්තේ වැව් පතුල වාගේය. මම මගේ කකුල උස්සා විලුඹ දෙස බැලුවෙමි. මට මහත් බියක් දැනුණි. ලොකු හාමුදුරුවන්ගේ විලුඹ පැළී ඇති විදියට මගේ විලුඹත් පැළී යාද?

"පැනිස් මාමෙ, වැව ඉරිතළල තියෙන්නෙ ඇයි?"

"නියඟේ සැරේට නෙ..."

"ලොකු හාමුදුරුවන්ගෙ විලුඹ පැලිල තියෙන්නෙ"

"ඒ නියඟේ සැරේට ම තමයි"

"මගෙත් කකුල් පැලේවි ද?"

sinhalaebooks.com

"නෑ. තාම පොඩි හාමුදුරුවන්ට ඔරොත්තු දෙනව" පැනිස් මාමා මා දෙස බලාගෙන කීවේය."

"ඉතින් ඇයි ලොකු හාමුදුරුවෝ මෙහෙ අත්හැරල නොයන්නෙ"

"එහෙම උණොත් පන්සල වල්වදිනව නෙ පොඩි හාමුදුරුවනේ..."

"වතුර නැති වෙලා ම ගියොත්?"

"එහෙම උණත් උන් වහන්සේ මෙහෙ දාලා යන එකක් නෑ."

"ඇයි ඒ?"

"පොඩි හාමුදුරුවෝ එහෙම උණොත් යනව ද?"

"මගෙත් කකුල් පැළුණොත්" පැනිස් මාමා නැවත දත් විළිස්සාගෙන මා දෙස බැලුවේය."

"ඇයි පැනිස් මාමා මහණ උනේ නැත්තේ"?

"ඒකට පින් තියෙන්න එපැයි පොඩි හාමුදුරුවනේ."

"එහෙනං ලොකු හාමුදුරුවන්නේ කකුල් පැළිල තියෙන්නෙ?"

පැනිස් මාම බිම බලාගෙන සිටියා හැර කිසිවක් නොකීවේය. මම ඔහුගෙන් උත්තරයක් බලාපොරොත්තුවෙන් ගමන බාල කොට ඔහු දෙස බැලුවෙමි.

"නියඟය ඉවර වේවි ඉක්මනින්ම" පැනිස් මාමා මා දෙස නොබලාම කීවේය.

sinhalaebooks.com

"එතකොට ලොකු හාමුදුරුවන්ගෙ කකුල් හොඳ වේවි ද?"

"ඔව් ඔව්."

මම වුවමනාවෙන්ම වතුර කළය කැලැත්තුවෙමි. එයින් විසි වන වතුර සිවුරට වැටෙයි. සිවුර තෙත් වීමෙන් ගිනියම්ව තිබූ මගේ ඇඟට සීතල දැනෙයි. මම තවතවත් කළය කැලැත්තුවෙමි.

"පොඩි හාමුදුරුවෝ තෙමාගෙන හොඳටම."

මගේ ඇඟ දිගේ බේරෙන වතුර බින්දු පොළොවට වැටෙනවාත් සමඟම වියළී යයි.

"අපි නළ ළිඳෙන් වතුර ඇදලා වැව පුරවමු."

"අපි දෙන්නම ජීවිතේම වතුර ඇද්දත් ඒක කරන්න බැරි වේවි."

"නියඟෙ ඉවර නූණොත් පැනිස් මාමා යනව ද?"

මම කොහේ කියල යන්න ද? පොඩි හාමුදුරුවෝ යනව ද?" ඔහු නැවතත් මගෙන් ඒ ප්‍රශ්නයම ඇසුවේය. මම පැනිස් මාමාගේ මුහුණ දෙස බලා සිටියා විනා පිළිතුරක් නොදුන්නෙමි. එහෙත් ඉන් පසු නිරන්තරයෙන් ම පැනිස් මාමාගේ ප්‍රශ්නය මගේ සිත තුළ හොල්මන් කරන්නට විය. නියඟයේ පීඩාව වැඩි වන හැම මොහොතකම පැනිස් මාමාගේ ප්‍රශ්නය සිහියට එන්නට විය. වැස්ස වැටී වැව පිරෙන කාලයක් මට දැනගන්නට ලැබුණේම නැත. නිල් මහනෙල්, ඕලු, නෙලුම් පිපීමෙන් ද නිල් පාට දියෙන් ද පිරී ඇති වැව මම කිහිපවරක් සිහිනෙන් දුටුවෙමි. ඒ හැම දිනකම උදේ පාන්දරම වැවට දිව්වෙමි. ඉරි තැලී ගිය වැව්

sinhalaebooks.com

පතුල හැබැහින් දකිද්දී මගේ හිතට ඇති වූයේ අපමණ වේදනාවකි. බෙහෙත් ගල්වන ලද ලොකු හාමුදුරුවන්ගේ ඉරි තැළුණු විලුඹු ද මම දුටුවෙමි. ඒ විලුඹුත් වැව් පතුලත් දැකීම මට ඉතා හිරිකිත දෙයක් වන්නට විය.

පැතිස් මාමා එදා ඇසූ පැනය මට අද යළි මතකයට නැඟෙයි. ලොකු හාමුදුරුවන් සහ පැතිස් මාමා යන දෙදෙනා ම අද ජීවතුන් අතර නැත. ඔවුන්ගේ ජීවිතය නියඟයේ දාහයට හසු වී විනාශ වන අයුරු දැකදැක මට එහි සිටීමට නො හැකි විය.

මම එයින් පලා ආවෙමි. එහෙත් මට පලා ඒමට සිදු වූයේ තවත් නියඟයෙන්ම පිරුණු පරිසරයකටය. ඒ නිසාම පසුතැවිල්ල බොහෝ විට ජීවිතයේ මා සමඟ අද තනියට සිටී.

sinhalaebooks.com

# සිහිවටනය

"මොකක්ද ඒ සද්දෙ?" කුස්සිය පැත්තෙන් නැඟුණු සද්දය කුමක් හෝ බිම වැටුණු සද්දයක් බව මට තේරුණි. අම්මා සිටියේ ඉස්තෝප්පු කණ්ඩිය උඩ වාඩි වී මගේ ඔළුව බලමින්ය.

"මොකක් ද උණේ" අම්මා නැවතත් හයියෙන් ඇසුවාය.

"මි.......මි........ මේ කෝප්පයක්" නංගී කුස්සිය ඇතුළේ සිට දෙපාරකට කීවාය.

"ඉතිං මොකද කෝප්පෙ පොළාවේ ගැහුව යි...?" නංගිගෙන් උත්තරයක් නැති තැන අම්මා නැගිට්ටාය. මමද අම්මාගේ පිටුපසින් කුස්සියට ගියෙමි.

"කෝ? මොකක් ද?" අම්මා කුස්සියට එබෙන ගමන් ඇහුවාය. බිම වැටී දෙපළු වී ගිය කෝප්ප පළු දෙක අම්මා දැක්කාය. අම්මා නංගීගේත් මගේත් මුහුණු දෙස වරින් වර බැලුවාය. ඇගේ ඇස් එළියට පනින්නට තටමන්නාක් මෙන්ය. "හත්දෙයියනේ!" කියමින් දෙකට නැවුණු අම්මා කෝප්ප පළු දෙක අතට ගත්තාය. "මී හරකි! මොකක් ද මේ කෙරුවෙ? කොහේ තිබිලැ යි තෝ මේක ගත්තෙ බොල?" අම්මා මෙතරම් කෝපයෙන් කතා කරනු මා මීට පෙර දැක නොතිබුණි. අම්මාගේ මුහුණ මහත් වී, ඇස් බලි රූපයක ඇස් මෙන් එළියට පැන ඇත. "අර පෙට්ටියෙ තිබිල" නංගී බිම බලාගෙන කීවාය.

sinhalaebooks.com

"මොන ඉලව්වකට ද පරට්ටියෙ එක ඇරියෙ?" නංගීගේ අතපය වෙව්ලයි. ඇය කතා කළේ බිම බලාගෙනය.

"ඇරල තිබුණෙ..."

"තොපිට වතුර බොන්න මෙච්චර කෝප්ප තියෙද්දි වාහෙට වතුර දෙන්නෙයි ඒක ගත්තෙ?" අම්මාගේ වචන අහල පහළටත් ඇසෙන්නට ඇත. නංගී ඉකිගසමින් අඬන්නට විය. අම්මා දෙපළු වී ගිය කෝප්ප පළු දෙක එකතු කළාය. එය පැරණි හැඩයට හදා තිබුණු කෝප්පයක් බව සිතාගත හැකිය. අම්මා එය දිහා බලාගෙන සිටියාය. කිරිගරුඬ පාට කෝප්පයක් වූ එහි පිට පැත්තේ උඩ දාරයේ රෝස පාට මල්වැලකි. ඒ මල්වැල කොතනින් පටන් ගෙන කොතනින් ඉවර වී දැයි සිතා ගත නොහැකිය. යට දාරයේ තද රතු පාට තරමක් මහත ඉරකි. මල් වැලත් රතුපාට ඉරත් අතර ඔටුන්නක් දමාගත් රැජිනකගේ රූපයක් රන්වන් පාටින් ඇඳ ඇත. අම්මා කෝප්ප පළු දෙක වෙන් නොකර හරවහරවා බැලුවාය.

"මුං දරුවෝ නෙවෙයි, මරුවෝ! මගෙ පූරුවෙ කරුමෙකට මුං වදන්න උණානෙ." අම්මා මෙතරම් කෝපයෙන් කතා කරන එක දිනක් වත් මා දැක නො තිබිණි. අම්මා එසේ කියා මගේ මුහුණ බැලුවෙන් මට මහත් බියක් දැනුණි. නංගී අඬඅඬා පිළිකන්නට දිව්වාය. මට අම්මා ගැන දුකක් මෙන්ම කේන්තියක් ද ඇති විය. පිඟන් කෝප්ප අප අතින් මීට පෙර ද බිඳී තිබුණි. එහෙත් අම්මා මෙතරම් උරණ වූ බවක් මට මතක නැත.

අම්මාගේ කෝපය ශෝකයකට හැරී ඇති බව ඇගේ මුහුණින් පෙනුණි. තවත් එතන සිටීමෙන් බැනුම් අහන්නට

sinhalaebooks.com

සිදු වේ යැයි සිතූ මම නංගී සොයාගෙන ගියෙමි. ඇය පිළිකන්නේ දර කොටයක් උඩ වාඩි වී ඔඩොක්කුවේ මුහුණ ඔබා ගෙන අඬමින් සිටියාය.

"නංගි අඬන්නැතුව ඉන්න" යැයි කියමින් මම ඇගේ ඔළුව අතගෑවෙමි. ඇය කිසිවක් නො දොඩා පිටි අත්ලෙන් නාහෙ පිහදාමින් මගේ මුහුණ දෙස බැලුවාය.

"නංගි ඔය පෙට්ටිය ඇරියෙ මක්කටෙයි? යතුර හොයාගත්තෙ කොහොමෙයි"

මම ඇහුවේ පෙට්ටියේ යතුර හංගන තැන ඈත් දූනගෙන සිටියා දැයි දූනගැනීමටය. "පෙට්ටියෙ යතුර තිබුණ" අම්මා ඒ පෙට්ටියේ යතුර කාට වත් දෙන්නේ නැත. ඒක හංගා තිබෙන තැන දූනගෙන සිටියේ මාත් තාත්තාත් පමණි. අම්මාට ද පෙට්ටියේ යතුර හැංගීමට අමතක වීම පුදුමයකි. මා දන්නා තරමින් තාත්තා වත් පෙට්ටිය ඇර නැත. ඒත් එහි ඇත්තේ පිඟන් කෝප්ප බව අපි දෙදෙනා ම දූන සිටියෙමු. ගෙදරට අමුත්තකු ආ දවසට අම්මා එයින් පිඟන් කෝප්ප එළියට ඇද සෝදා නැවත අඩුක් කොට තබයි. නංගී බිඳපු කෝප්පේ අම්මා කලාතුරකින් වතුර බොනවාත් මා දූක ඇත.

"ඒකෙ අර ජාතියෙ තව කෝප්ප තිබුණද නංගි?"

"නෑ, ඒක විතරයි."

"ඒක තමයි නංගි අම්මට කේන්ති යන්න ඇත්තෙ. මං හිතන්නෙ ඒක වටින පැරණි කෝප්පයක් වෙන්න ඇති."

නංගීගේ ඉකිගැසීම ටිකක් අඩු විය. තව කුමක් හෝ බිම වැටෙන සද්දයක් ගේ තුළින් ඒ සමඟම ඇසුණි. එය

sinhalaebooks.com

එක දෙක තුන වැඩි විය. අම්මා පිඟන් කෝප්ප පොළොවේ ගසන බව මම ස්ථිර ලෙස දැනගතිමි. නංගීගේ අත ගසා දමා මම ගෙට දිව්වෙමි. මම අම්මාගේ අතේ එල්ලී අම්මා වැළකීමට උත්සාහ කළෙමි.

"පලයව්! මට තොපි එකෙක් වත් නැති උණාට කමක් නෑ" කියමින් ඇය මගේ අත ගසා දැමුවාය.

"එකක් බිඳුණට ඔක්කොම පොළොවෙ ගහන්න අම්මට ඔල්මාදෙ හැදිල ද?" මගේ කෝපය ඉවසාගත නොහැකි තැන මම ඇසුවෙමි.

"ඔව්. මට ඔල්මාදෙ. උඹලගෙ මහ එකත් හිතන්නෙ මට ඔල්මාදෙ කියලනෙ. උඹලත් ඒ මිනහගෙ විජ්ජාවල් නෙ..."

"අම්මා මෙච්චර බෙරිහන් දෙන්න මෙතන මොකද උණේ?"

"උණේ?" ඔක්කොම වෙලා ඉවරයි. උඹලගෙ මහ එකාටත් නිවනක් තිබුණේ නැහැ නේ මේ පෙට්ටිය හින්ද. ඔන්න දැන් උඹලගෙ හතර මහ නිධානෙම මේකෙ දාගනිල්ල" කියමින් යතුර මගේ පැත්තට විසි කළාය.

මේ පෙට්ටගම නිසා අම්මාත්, තාත්තාත් අතර කෝලහලයක් වූ බවක් මට මතක නැත. ඒත් එක දවසක් පෙට්ටගම ගැන අම්මාත් තාත්තාත් ටිකක් හයියෙන් කතා කරනවා මට ඇසී ඇත.

"ඒක කුස්සියෙ තිබුණම මොක ද?"

"නෑ මං කියන්නෙ, ඒක දිරල යන හින්ද..." මේ කාමරේක තියල, අර ඇඳයට තියෙන පිඟන් කෝප්ප ටිකක් ඕකෙ දැම්ම නං මොකද?"

sinhalaebooks.com

මම අම්මාට උයන්නට උදව් කළෙමි. අම්මා බිත්තර හැළියෙන් බිත්තර ගෙඩි පහක් අතට අරගත්තාය.

"මොකටෙයි අම්මෙ පහක්?"

"තාත්තා මහන්සි වෙලා නෙ එන්නෙ" අම්මා සිනා සෙමින් කීවාය.

sinhalaebooks.com

"ඒකෙ ඔය ලට්ට ලොට්ට දාන්න ඉඩ ඇති එකක් නැහැ..." එවර අම්මා තරමක් හයියෙන් කිවුවාය.

"ඕකෙ මොනවයි ඔය හැටි තියෙන්නෙ ඉබි යතුරු දාගෙන පරිස්සං කරන්න. අර පරණ පිඟන් කෝප්ප කෑලි ටික ඇරුණහම...?" තාත්තා සන්සුන් ලෙස කීවේය.

"මං ඕක පළල ළිපේ දානව කොයි වෙලාවක හරි!"

"කේන්ති ගන්න දෙයක්යැ මං කිවුවෙ? මං දැක්ක වහින වෙලාවෙ වහලෙන් වතුර වැක්කෙරනව ඕක උඩට. ඒ මදිවට වේයොත් ඇදිල තිබුණා."

"ඒක ඔහෙ වේයො කාලා දිරච්චා. කුස්සියෙ ඇතුළෙන් ගෙට ගේන්නෙත් නෑ, ඒකෙ වෙන මක්ක වත් දාන්නෙත් නෑ." අම්මා දැඩි ලෙස කීවාය.

තාත්තා ඊට පසු පෙට්ටිය ගැන කතා කරනවා මට ඇසී නැත. ඒත් අම්මා අද තාත්තා මේකට ඇදගත්තේ කුමක් නිසා දැයි මට නො තේරෙයි. සමහර විට ඒ කතාව ඈට මතක් වන්නට ඇත.

අම්මාගේ කෝපය ශෝකයකට හැරී ඇත. ඇය ඉකිබිඳින්නේ මළ ගෙයක සියලු කටයුතු හමාර වී, මළ බත ද දුන් පසු ඉකිබිඳින කෙනකු ලෙසය. ඒත් මට අම්මා ළඟට කිට්ටු වීමට ඇත්තේ බියකි. මම පහත් වී අම්මා පොළොවේ ගැසූ පිඟන් කෝප්පවල කටු එකතු කළෙමි. ටිකකට කලින් පළු දෙකකට කැඩී ගිය කෝප්පයේ කටු කැබලි කැබලි විසි වී ගොස්ය. රෝස පාට මල් වැල, රතු ඉර, රැජින දූන් හරිහැටි හඳුනාගත නොහැකිය.

අම්මා ගේ ඇතුළට ගොස්ය. මම ගේ අතුගා දමා පෙට්ටගම දිහා බැලුවෙමි. එය කොස් ලීවලින් තනන ලද

sinhalaebooks.com

පරණ පෙට්ටියකි. එහි පිට පැත්ත කුස්සියට එන හැම විටම දක ඇතත් පෙට්ටගම ඇර තිබෙනු දුටුවේ අදය. මම කුතුහලයෙන් පෙට්ටගම ඇතුළ බැලුවෙමි. එහි මුනින් අතට නවා තිබූ කෝප්ප කිහිපයකුත් පිඟන් කිහිපයකුත් ඉතිරි වී තිබුණි. මුණින් අතට හරවා තිබූ කෝප්ප අනිත් අතට හරවා බලන්නට හිතුණත් එසේ නො කළෙමි. බිඳුණු කෝප්පයේ වගේම රෝසපාට මල් වැලත්, රතුපාට ඉරත් මේ පිඟන් කෝප්පවලත් ඇතැයි සිතුවෙමි. අම්මා මේ පෙට්ටගමේ යතුර හැංගුවේ දුම්මැස්සේ ගොරක වට්ටිය යටය. තාත්තා දිනක් මොකක්දෝ සොයන විට යතුර දක මට කතා කළේය.

"බලපංකො ලොකු දුවේ, උඹලගෙ අම්මා යතුර හංගල තියෙන තැන" කියමින් යතුර හංගා තිබුණ තැන මට පෙන්වා සිනා සුණේය. ඒත් තාත්තා ඒ පෙට්ටගම නැරිය බව විශ්වාසය.

අම්මා මෙච්චර යතුර හංගාගෙන සිටියේ එහි රත්තරං බඩු දමා ඇති නිසා යැයි මම සිතුවේමි. එහෙත් එහි සල්ලි හෝ රත්තරං බඩු නැති බව දන් මට වැටහෙයි. පෙට්ටියේ පිඟන් කෝප්ප හැර කිසිවක් නැති බව තේරුණත් එහි මහා භූතයකු සිටින්නාක් මෙන් මට දනුණි. අම්මා ටිකකට කලින් හැසිරුණේ මේ භූතයා දකීමෙන් ඇති වූ භය නිසා විය හැකිය. පෙට්ටියේ පියන දිගේ ආ කැරපොත්තෙක් මගේ ඇඟට පැන්නේය. මම පෙට්ටගමේ පියන අතහැර අහකට පැන්නෙමි. පෙට්ටගමේ පියන දඩාස් ගා වැටී පෙට්ටගම වැසුණි.

එකතු කරන ලද පිඟන් කෝප්පවල කටු ටික කොළපතකට දමාගෙන පිළිකන්න දිගේ ගොස් කුණුවළට අතහැරියෙමි. කුණු වළේ වසා සිටි පිළුණු මැස්සෝ, මීයක්

sinhalaebooks.com

ඇවිස්සුණාක් මෙන් ඇවිස්සුණාහ. මම උන් දෙස බලා සිටියෙමි. මොහොතකට පෙර කුණුගොඩේ වසා සිටි පිළුණු මැස්සන් උඩ මතු වීමෙන් උන් වසා සිටියේ පිළුණු බත් ගොඩක් උඩ බව පෙනුණි. නැවත ටිකෙන් ටික එකා දෙන්නා පහත් වී පිළුණු බත් ගොඩේ වසන්නට පටන් ගත් අතර, ටිකකින් පිළුණු බත් ගොඩ මැස්සන්ගෙන් වැසී ගියේය. එයින් පසු කුණුවලේ තිබූ කලබල ගතිය අඩු වී නැවතත් සන්සුන් විය. පසුව එතන අබ ගොඩක් මෙන් පෙනෙන්නට විය.

මා කුස්සියේ සිට සාලයට එන විට නංගි ලාම්පුව පත්තු කර තිබුණි. එහෙත් චිමිනිය ගසා තිබුණේ නැත. අම්මාට නින්ද ගොස්ය. මා සාලය දිගේ ඉස්තෝප්පුවට එනවිට නංගි චිමිනිය පිස දමමින් සිටියාය. තාත්තා තව ටිකකින් එන බව මම දනිමි.

"ලොකු දුවේ" ඒ අම්මාගේ කටහඬය. අම්මාගේ කේන්තිය නිවී ගොස් ඇත. "මේ එනව අම්මෙ." සාලයේ දූල්වෙන ලාම්පුවේ දූල්ල යාන්තමට ඒ මේ අත සැලෙයි.

"කෝ හිච්චි දූ?"

"චිමිනිය පිහදානව" අම්මාගේ මුහුණේ පැදුරු වාටිය සිටීමෙන් පාර මතු වී ඇත. පහන් දූල්ලෙන් අම්මාගේ මලානික මුහුණ හොඳින් පෙනෙයි. නංගී චිමිනිය පිහදාගෙන ආවාය. "හිච්චි ගිහිං මල් කඩන්න"අම්මා චිමිනිය ගෙන ලාම්පුවට සවි කළාය. පහනේ මලානික දූල්ල දීප්තිමත් විය. එය සුළඟින් දූන් නොසෙල්වෙනු ඇත. අම්මා ඇණය කරකවා ලාම්පුවේ තිරය ඉස්සුවාය. මුළු සාලයම ලාම්පු එළියෙන් පිරී ගියේය.

sinhalaebooks.com

අම්මා මා ලවා වතුර කෝප්පයක් ගෙන්වාගෙන ඉස්තෝප්පුවට ගොස් මුහුණේ උලාගත්තාය. නංගී වතුසුද්ද මල් පිරුණු වට්ටියක් රැගෙන ගෙට ගොඩ වූවාය. වතුසුද්ද මල් වෙනදාට වඩා සුදු පාට වී ඇතැයි මට සිතුණි.

අම්මාත්, නංගීත්, මමත් බුදු පහන දල්වා මල් පූජා කළෙමු. අහස වලාකුළුවලින් තොර නිසා දීප්තිමත්ය. එහි තරු කැට මතු වෙමින් ඇත. පෝයට ඇත්තේ ටික දිනක් නිසා හඳ එළිය තුරු එළිය යට කරමින් මතු වෙයි. පහන් පැල ළඟ සේපාලිකා ගහේ පොහොට්ටු පිරී ඇත. ඒවා පිපෙන්නට නැකැත් එන තුරු බලා සිටින්නාක් වැනිය. අම්මාගේ මුහුණ පහන් දැල්ලෙන් දුටුවාට වඩා දහදොළොස් ගුණයක් එළිය වැටී ඇත. අම්මා සේපාලිකා ගහේ එතී තිබූ වතුපාළු වැලක් අතින් අද ගලවා දැමුවාය.

අපි පහන් පැල ළඟ සිට ගේ පැත්තට ආවෙමු. අම්මා නංගීගේ කරට අත දමා තුරුලු කරගත්තාය. "තාත්තාට කියන්න ඕන නෑ කෝප්පෙ බිඳිච්ච කතාවක්" අම්මා හිමින් කීවාය.

නංගී ඔළුව වැනුවාය. මම ද ඔළුව වැනුවෙමි.

"මක්ක හරි රත් කරන්න එපැයි ලොකු දුවේ, තාත්තාත් එනවා ඇති නෙ" අම්මා හිමින් කීවාය.

මමත් අම්මාත් කුස්සියට ගියෙමු. "ලොකු දුවේ, තාත්ත කිව්ව වගේ මේ පෙට්ටිය ගෙයින් ගිහින් දැම්මනං හොඳයි" අම්මා මගේ මුහුණ දෙස නොබලා කීවාය. "තාත්තා ආවම බැරිය" මම කීවෙමි.